සමාජ සාමය උදෙසා

2023 ජූනි - ජූලි
58 වැනි කාණ්ඩය - 2 වැනි කලාපය

202 වන කලාපය

# සාධාරණය

# SAADHARANAYA

ශ්‍රී ලංකාවේ පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි



Bruce MacKinnon's editorial cartoon for Sept. 29, 2018.

# නීතියේ ආධිපත්‍ය කෙලෙසන පාලකයෝ

සමාජය හා සාමයික කේන්ද්‍රයේ ත්‍රෛමාසික සංග්‍රහය

මිල රු 50/-



# වන්දි මුදල් ලබාගැනීම සඳහා වන අධිකරණ ක්‍රියාමාර්ග ප්‍රමාදයට හේතුව මූල්‍ය වංචාවක්

**පරිසරවේදී**
**රවීන්ද්‍ර කාරියවසම්**

**එම නැව අයත් සමාගමට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලංකා රජය හිතාමතා පමා කරමින් සිටින අතරම විජයදාස රාජපක්ෂ මහතා විසින් මේ වන විට ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රකාශයක් ද සිදුකර ඇත. ඒ රටට හිමිවීමට තිබෙන වන්දි මුදල් ලබා ගෙන ඒම සඳහා වූ, අධිකරණ ක්‍රියාමාර්ගවලට යෑම වැළැක්වීම උදෙසා නැව අයිති සමාගම විසින්, ශ්‍රී ලංකාවේ ප්‍රභල ද්ශපාලඥයෙකුට ඩොලර් මිලියන 250 ලබාදී ඇති බව ඔහු එම බරපතළ ප්‍රකාශය මගින් කියයි. එම ප්‍රකාශය අනුව නැව ගිනි ගැනීමෙන් සිදු වූ හානියට අදාළව වන්දි මුදල් ලබා ගැනීම සඳහා වන අධිකරණ ක්‍රියාමාර්ගය ප්‍රමාදවීමට හේතුව අපට වඩාත් පැහැදිලිය. රටේ පරිසර සම්පත විනාශ වී ඇති නමුත් දැනට සිදුවී ඇති විනාශයට අදාළ වන්දි මුදල ගැනීමට රජය මැදිහත් විය යුතු අතර, ඩොලර් මිලියන 250 ලබාගත් දේශපාලඥයා විජයදාස රාජපක්ෂ විසින් හෝ රජය විසින් ජනතාවට හෙළි කළ යුතුය.**

X-Press Pearl රසායනික බහාලුම් සහිත නෞකාව 2021.05.19 දින ලංකාවට අයත් මුහුදු තීරයේදී, ගිනි ගැනීමකට ලක් වන අතර එම නැව ගිනිබත් වීමෙන්, සමුද්‍ර පරිසරයට සහ ශ්‍රී ලංකාවට අයත් වෙරළ තීරයට බරපතළ ලෙස හානි සිදුවූ බව දැන් නොදන්නා කෙනෙක් නැති තරම්ය. එම නෞකාව ගිනි ගැනීම හේතුවෙන් කැස්බෑවන් ඇතුළු සමුද්‍ර ජීවීන් විශාල වශයෙන් මියගොස්, වෙරළ තීරයට ගොඩ ගැසූ අතර, දැවී ගිය රසායනික ද්‍රව්‍ය නිසා මුහුදු ජලයට හා සමුද්‍ර ජීවීන්ගේ වාසස්ථාන, කොරල්පර, වෙරළ තීරය පාරිසරික වශයෙන් විශාල හානියක් සිදුවිය. කලපුවලට හා මුහුදු ජලයට ද සිදු වූ හානිය මේ යැයි තක්සේරු කිරීමට නොහැකි වුවද, ඒ සඳහා ඩොලර් බිලියන 6.4 වන්දි මුදලක් ලබා ගැනීම සඳහා තක්සේරුවක් ඉදිරිපත් වී තිබේ. නැවක් ගිනිබත් වී සමුද්‍රයට සිදුවූ හානියට අදාළව නඩුව එම සිදුවීමේ සිට වසර දෙකක් ඇතුළත ගොනු කළ යුතු අතර 2023.05.19 වන විට එම වසර දෙක සම්පූර්ණ වේ. රටක් ලෙස සමුද්‍රයට සිදුවූ මෙම අපරාධයට නැව අයත් සමාගමට එරෙහිව වන්දි ඉල්ලා නඩු නොදමන්නේ ඇයි ද යන ප්‍රශ්නය අපට ඇත.

එම නැව අයත් සමාගමට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලංකා රජය හිතාමතා පමා කරමින් සිටින අතරම විජයදාස රාජපක්ෂ මහතා විසින් මේ වන විට ඒ සම්බන්ධයෙන් බරපතළ ප්‍රකාශයක් ද සිදුකර ඇත. ඒ රටට හිමිවීමට තිබෙන වන්දි මුදල් ලබා ගෙන ඒම සඳහා වූ, අධිකරණ ක්‍රියාමාර්ගවලට යෑම වැළැක්වීම උදෙසා නැව අයිති සමාගම විසින්, ශ්‍රී ලංකාවේ ප්‍රභල දේශපාලඥයෙකුට ඩොලර් මිලියන 250 ලබාදී ඇති බව ඔහු එම බරපතළ ප්‍රකාශය මගින් කියයි. එම ප්‍රකාශය අනුව නැව ගිනි ගැනීමෙන් සිදු වූ හානියට අදාළව වන්දි මුදල් ලබා ගැනීම සඳහා වන අධිකරණ ක්‍රියාමාර්ගය ප්‍රමාදවීමට හේතුව අපට වඩාත් පැහැදිලිය.

රටේ පරිසර සම්පත විනාශ වී ඇති නමුත් දැනට සිදුවී ඇති විනාශයට අදාළ වන්දි මුදල ගැනීමට රජය මැදිහත් විය යුතු අතර, ඩොලර් මිලියන 250 ලබාගත් දේශපාලඥයා විජයදාස රාජපක්ෂ විසින් හෝ රජය විසින් ජනතාවට හෙළි කළ යුතුය.

නමුත් ඇමැතිවරයා විසින් දැන් නම් ප්‍රකාශ කරන පුද්ගලයා අප හරිහැටි දන්නා හඳුනන පුද්ගලයකු නොවේ. එසේම, ඇමැතිවරයා විසින් අනාවරණය කර ඇති එම පුද්ගලයා පමණක් නොව, ඔහු පවසන ගිණුම් අංකය හා බැංකුව යනාදිය සත්‍ය ඒවා නොවන බව මේ ගැන පරීක්ෂණය කරන රහස් පොලිසිය පවසයි.

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ ආඥා පනතට අනුව,

» 13 පිටුවට..

# සාධාරණය

SAADHARANAYA

**2023 ජුනි - ජුලි**
**වෙළුම 58 කලාප 02**
**ප්‍රකාශන අංක 202**
**ISSN 1391 - 0604**

**නිර්මාතෘ**
ගරු තිස්ස බාලසූරිය පියතුමා

**සභාපති**
ගරු රොහාන් සිල්වා පියතුමා

**ප්‍රකාශනය**
ගරු රොහාන් සිල්වා පියතුමා
සමාජය හා සාමයික කේන්ද්‍රය
නො. 281, ඩීන්ස් පාර
කොළඹ 10.

**සංස්කාරක අධීක්ෂණ මණ්ඩලය:**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විජිත් රොහාන්
චමීර පෙරේරා
නීතිඥ වින්සන් බුලත්සිංහල
මෙලනි මානෙල් පෙරේරා

**සංස්කරණය**
ෆ්‍රැන්ක්ලින් සනත් ප්‍රනාන්දු

**සංස්කාරක උපදේශනය හා පිටු සැළසුම් නිර්මාණකරණය**
තිළිණ අලහකෝන්

**අලෙවි සහ ප්‍රචාරණ සම්බන්ධීකරණය**
ශාමලින් ප්‍රැන්සිස්

**පිටු සැකසුම හා අක්ෂර සංයෝජනය**
නේමා මොහමඩ්

**මුද්‍රණය**
කේ. එස්. යූ. ග්‍රැෆික් පුද් සමාගම
නො 510, රාජගිරිය පාර,
රාජගිරිය.
දුර : 0112884701

**විමසීම්**
සාධාරණය
සමාජය හා සාමයික කේන්ද්‍රය
නො. 281, ඩීන්ස් පාර
කොළඹ 10
දුර : 2695425
වෙබ්: www.csrsrilanka.org
ෆේස් බුක්:
https://www.facebook.com/csrsrilanka.org/


## නීතියේ ආධිපත්‍ය කවරයේ අරුත

මැතිවරණ නීතියට අනුව පලාත්පාලන මැතිවරණය පැවැත්විය යුතු දින වකවානු ඉක්මවා ගොසිනි. රනිල් වික්‍රමසිංහ මුදල් ඇමති ලෙස එයට අවශ්‍ය ප්‍රතිපාදන ලබා නොදීම නිසා මැතිවරණය කල් යමින් පවතී. එය මැතිවරණයට අදාලව ගරු අධිකරණය තීන්දුවක් ලබාදීම සම්බන්ධයෙන් විනිසුරුවරුන්ව පාර්ලිමේන්තුවට කැඳවා ප්‍රශ්න කිරීමටද, පාලකයෝ උත්සහායක නියැලුනේය. එසේ කටයුතු කරන්නේ. තමන්ට ඕනෑ විදිහට නීතිය නම්මවා ගැනීමටය. බිය වැද්දවීමටය. නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම වෙනුවට රට වැනසූ මෙම පාලකයෝ සිදු කරන්නේ තමන්ගේ මනාපයට අනුව කටයුතු කිරීමය. ඒ සඳහා ජනතාව පීඩාවට පත් කරවන අණපනත් ගෙන ඒමටද පාලකයෝ පසුබට නොවෙති.



**නීතියේ ආධිපත්‍ය කෙලෙසන පාලකයෝ**

නීතිය මත පාලනය බිඳ වැටෙන රටක් ඉදිරියට ගමන් ගනීවි යැයි සිතිය නොහැකිය. අල්ලස් දූෂණ සම්බන්ධයෙන් අප රටේ පාලකයින්, මැති ඇමතිවරුන්, ඉමහත් ප්‍රසිද්ධයක් උසුලති. නමුත් ඔවුන් නීතියේ හිඩැස් වලින් බේරී පලා යෑම සිදු කරති. නීතිය සැමට එක හා සමාන විය යුතුය. විනයගරුක සමාජයක් ගොඩ නැගීමට නීතියේ ආධිපත්‍යය තහවුරු විය යුතුමය.

**නීතිය මත පාලනයක් ගොඩනැගීමට කැපවෙමු !**

සියලු මතවාද සඳහා විවෘත වේදිකාවක්

## පාලකයින් අයිතීන් අහිමි කරන්නට සැරසෙන විට නිහඬව නොසිට හඬ නගමු !

**මෙහි පළවී ඇති ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් උපුටා ගන්නා ලදි**

පිටුව 05



ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් සියල්ලම ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට බරපතළ ලෙස තර්ජන ඇති කරනවා.


පිටුව 10

රටේ නීතියත්, නීතියේ බලයත්, නීතියේ ආධිපත්‍යයත් පිළිබඳව, රටක් විදියට විශාල ගැටළුවකට යොමුවෙනවා



පිටුව 14

ප්‍රතිත්‍රස්ත පනත ජනතාවගේ හඬ වගේම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියත් මර්දනය කරන එකක්




පිටුව 23




**කඳුළු ගෑස් කියන එක හඳුන්වන්නේ**

## අඩු මාරාන්තික අවියක් විදිහට

පිටුව 36




## රාජ්‍ය අනුග්‍රහය ඇතිව හොරුන්ට පාර කපන මාධ්‍ය මර්ධන පනත්

## මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් උදෙසා හඬ නගමු



පිටුව 29

සංස්කාරක සටහන

# පාර්ලිමේන්තුව ප්‍රතිසංස්කරණය කර රට ගොඩනැගීමේ මූලික පියවර තබමු!


දේශපාලන, ආර්ථික ඝාතකයින් විසින් රටේ සම්පත් හොරකම් කරමින්, අඛණ්ඩව යන ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකරමින් විද්වතුන්ගේ මෙන්ම පුරවැසියන්ගේ හඬට ඇහුම්කන් නොදෙමින් ගිය ගමනේ ප්‍රතිඵලයක් ලෙසින් අප රට ප්‍රපාතයට ඇද වැටුණු බව නොකිවමනාය. රනිල් රාජපක්ෂ ජනාධිපති IMF පදයට නටමින් රට තව තවත් ණය උගුලක හිරකිරීමේ ගමනක නිරත වී ඇත. ඒ සඳහා ජනතාව බිය වැද්දවීමට හඬ නගන පිරිස් අත්අඩංගුවට ගැනීමට විවිධ අනපනත් ගෙනෙන්නට උත්සාහ කරති. පුනරුත්ථාපන පනත් කෙටුම්පත, ප්‍රතිත්‍රස්ත පනත් කෙටුම්පත ඒ අතරින් කැපී පෙනේ. පුරවැසි විරෝධතා මැද ඒ අපනත් කෙටුම්පත හකුලා ගැනිමට ඔවුන්ට සිදුවිය. පාලකයින්ගේ නවතම උත්සාහය වී ඇත්තේ මාධ්‍ය මර්ධනය කිරීමයි. ඉහත කී පනත් කෙටුම්පත්වලින් සිදුකර ගැනීමට නොහැකි වූ දේ ඉටුකර ගැනීමට උත්සාහ කිරීමයි.

පුරවැසියන් සතු නිදහස් අධ්‍යාපන අයිතියත්, නිදහස් සෞඛ්‍ය හිමිකමත් ක්‍රමිකව අඩපණ කරමින් ලාභ ලබන ආයතන පවා පෞද්ගලිකකරණය කිරීමට වෙරදරමින්, වී ගොවිතැන මෙන්ම ආහාර කෘෂිකර්මාන්තය අඩපණ කරමින් ගනු ලබන තීන්දු තීරණ නිසා රට තව තවත් අගාධයට යනු ඇත. වී ගොවියාට වී කිලෝවකට නිසි මිලක් ලබා නොදෙන්නේත්, ගොවි නිෂ්පාදන සියල්ල මිලදී ගැනීමට කටයුතු නොකරන්නේත් ඒ සඳහාය. අවසානයේ අඩු මිලකට වී නිෂ්පාදනයන් ඩැහැගනු ලබන්නේ පෞද්ගලික මෝල් හිමියන් විසින්ය. වී ගොවියන් අධෛර්යය කරන්නේ මේ අයුරිනි.

මේ වන විට අප රට IMF එකට, චීනයට, ඉන්දියාවට ඇවැසි පරිදි වහල් දේශයක් බවට පත්වී හමාරය. මේ සමස්තය තුළ පුරවැසියා පීඩාවට පත්වන අතර අයිතීන් අහිමි වෙමින් අන්ත අසරණ තත්ත්වයකට පත්වේ. එහෙයින් පුරවැසියා රට තුළ ගොඩනැගෙන සමාජයීය, ආර්ථික, දේශපාලන යථාර්ථයන් සම්බන්ධයෙන් දැඩි අවධානයකින් පසුවිය යුතුය. දේශපාලනඥයා දෙස බැලීය යුත්තේ රටට, පුරවැසියන්ට ආදරය නොදක්වන පිරිසක් ලෙසමය. මේ පිරිස පුනරුත්ථාපනය කිරීමට සාකච්ඡා, සංවාද කළ යුතුය.

එමෙන්ම නීතිය සැමට සමාන විය යුතු බව අප නිරන්තරයෙන්ම හඬ නගා පැවසිය යුතුය. බලවතුන්ට, දේශපාලනඥයින්ට එක් විදිහකටත්, සාමාන්‍ය ජනතාවට තවත් විදිහකටත් එය නොපැවතිය යුතුය. නීතියේ ආධිපත්‍ය බිඳින්නට, කෙළෙසන්නට දේශපාලනඥයින්ට ඉඩක් නොදිය යුතුය. අනපනත් ගෙන එමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලබාදී ඇයි අයිතිවාසිකම් අවම කිරීමට ඉඩ නොදිය යුතු අතර එවැනි අවස්ථාවන්වලදී නොබියව අනාගත පරපුර වෙනුවෙන් හඬක් නැගීමට ඉදිරිපත් විය යුතුමය. අවසාන වශයෙන් නීතිය මත පාලනයක් ගොඩනැගීමට අප සැම උර දිය යුතු අතර රට යහපත් දිශාවකට යොමු වන්නේ එතැන් සිට බව අපි තේරුම් ගනිමු.

ක්‍රම වෙනසක් සඳහා ජනතා අයිතීන් තහවුරු වන දේශපාලන බලවතුන්ගේ වරප්‍රසාද අඩු කරවන විධායකය මෙන්ම ව්‍යවස්ථාදායකයේ පාලනයට සම්බන්ධ විය හැකි කාලය වසර 10කට සීමා කරවන බලය විමධ්‍ය ගතවූ පාර්ලිමේන්තුවට වැඩි බලයක් හිමිවූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනැගීමට අප හඬ නැගීය යුතුය.



ෆ්‍රැන්ක්ලින් සනත් ප්‍රනාන්දු

ප්‍රකාශක සටහන



# රජය ක්‍රියා කළ යුත්තේ නීතියේ සීමාව තුළ මිස ඊට ඉහළින් නොවේ

ගරු රොහාන් සිල්වා පියතුමා, විධායක අධ්‍යක්ෂ, CSR


නීති විද්‍යාවේදී, නීතියේ උත්තරීතරභාවය යනු කිසිදු පුද්ගලයෙකු හෝ රජයක් නීතියට ඉහළින් නොසිටින බවත්, නීතිය සැමට එක හා සමානව ක්‍රියාත්මක විය යුතු බවත් විශ්වාසයයි. මෙයින් අදහස් කරන්නේ නීතිය අනුගමනය කිරීමෙන් කිසිවෙකු නිදහස් නොවන බවත්, රජය ක්‍රියා කළ යුත්තේ නීතියේ සීමාව තුළ මිස ඊට ඉහළින් නොවන බවත්ය. කරුණු එසේ වුවද, ලාංකීය සමාජ සන්දර්භය තුළ නීතියේ උත්තරීතරභාවයට අත්වී ඇති ඉරණම ඛේදජනකය.

බලය ඇති අයට හා බලය නැති අයට නීතිය ක්‍රියාත්මක වන අයුරු දෙස නිරීක්ෂණය කිරීමේදී මේ බව සනාථ වේ. බලය නැති අයට නීතිය ක්‍රියාත්මක වීමේදී එය උපරිමෙන්ම ක්‍රියාත්මක කිරීමට යුහුසුළු වන බලධාරීන්, බලය ඇති අයට නීතිය ක්‍රියාත්මක කිරීමේදී මන්දගාමී ස්වභාවයක් මෙන්ම ඇතැම් අවස්ථාවලදී නීතිය ක්‍රියාත්මක නොකිරීමක්ද සිදුකරන බව නොරහසකි. මෙවන් සන්දර්භයක් තුළ රටකට වෙන හා විය හැකි විනාශය ඉතා විශාලය; යුක්තිය හා සාධාරණත්වය පසක් කරගැනීමට අපොහොසත් වීම, නියම වැරදිකරුවා නීතියේ රැහැනට හසුකර ගැනීමට නොහැකි වීම, එම නිසාම අපරාධ හා දූෂණය පාලනය කරගැනීමට අපහසු වීම, රට තුළ ආරක්ෂාවට තර්ජන එල්ලවීම, හා අනාරක්ෂිතභාවය පැතිරීම, හා අන්‍යෝන්‍ය විශ්වාසය පළුදු වීම. "නීතියේ උත්තරීතරභාවයට" ගරු කරන හා එය ක්‍රියාවට නංවන දේශයක් තුළ මානව හිමිකම්වලට ගරුකිරීම, ඉතාමත් ඉහළ මට්ටමක පවතින්නා සේම, සෑම පුරවැසියකුටම යුක්තිය පසක් කරගැනීමට හැකියාව ඇති බව තහවුරු කරගැනීමට රුකුලක් වනු ඇත. "නීතියේ උත්තරීතරභාවය" කෙළෙසන අයුරින් පාලකයන් ක්‍රියා කිරීම වළක්වා ගැනීම සඳහා පුරවැසියන් සැමවිටම අවදියෙන් සිටිමින් එවැනි දෑ හඳුනා ගන්නටත්, ඒවා වළක්වා ගැනීම සඳහාත් ක්‍රියා කළ යුතුවේ. එසේ කිරීමට පුරවැසියා නිරන්තරයෙන්ම නීතිය සම්බන්ධයෙන් සන්නද්ධ වීම අත්‍යවශ්‍ය බව අපි තහවුරු කරමු.

එක් එක් කාලපරිච්ඡේදවලදී ආණ්ඩුකරණ ලද ප්‍රධාන පක්ෂ, රටේ අනාගතය ගැනට වඩා තමන්ගේ පාලන කාලය වෙනුවෙන් ගන්නා ලද තීන්දු තීරණ නිසාවෙන්, විශේෂයෙන්ම 2019 සිට පැවති ආණ්ඩුව ගන්නා ලද අදූරදර්ශී ක්‍රියාපටිපාටිය නිසා අප රට ආර්ථික බංකොලොත්භාවයට පත්වූ බව නොරහසකි. එවැනි දුර්දාන්ත පාලකයන් එලවා දැමීමට ජනතාව අරගලයක් තුළින් සමත් වුවත් එහි සාමූහික අභිප්‍රාය වූ "ව්‍යුහාත්මක වෙනස" (System Change) ළඟාකර ගැනිම තවමත් අභියෝගයක් ලෙස අප ඉදිරියේ ඇත. එම අභියෝගයට ප්‍රධාන හේතුව වන්නේ එලවා දමන ලද "ජනාධිපති" වෙනුවට පාර්ලිමේන්තුවෙන් පත්කරගන්නා ලද "වර්තමාන ජනාධිපති තුමාගේ" ක්‍රියාකලාපයයි. රටේ ආර්ථිකය නගා සිටුවීමට යැයි කියමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ලබාගැනීම සඳහා එහි කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන, නීතිරීති ඉදිරිපත් කරමින්, ඒවා තුළින් විකල්ප මතවාදවලට හා ප්‍රකාශනවලට ඇති නිදහස සීමා කිරීමට දරණ උත්සාහය පරාජය කිරීම සඳහා සංවේදී පුරවැසියන් අත්වැල් බැඳගත යුතු සුවිශේෂී අවස්ථාවයි මේ. රටේ පැවැත්විය යුතු ඡන්ද සිතියම හකුළුවා ගනිමින්, ඒකාධිපති පාලනයක් කරා යන ගමන නතර කරගැනීමට සෑම කෙනෙක්ම ඉදිරිපත් විය යුතු බව අපේ විශ්වාසයයි. එම ක්‍රියාවලිය සඳහා සංවේදී පුරවැසියන් සැටියට අපි එක්වෙමු.

රටේ "උත්තරීතර නීතිය" මත පදනම් වී ක්‍රියා කරන සමාජයක් ශ්‍රී ලංකාව තුළ බිහිකර ගැනීමට අවශ්‍ය කරන ක්‍රියාදාමයකට, සාමූහිකව පිවිසෙන්නට අත්වැල් බැඳගන්නට පොදු යහපත සඳහා වෙහෙසෙන සංවේදී පුරවැසියන්ට ආරාධනා !

**සඟරාවේ පළවන ලිපිවල වගකීම ලේඛක/ලේඛිකාවන් සතුවේ.**



**"සාධාරණය" සමාජ සාමය උදෙසා සහ සත්‍යයට වූ තෝතැන්නකි. යුක්තිය, සාධාරණත්වය හා යහ පාලනය උදෙසා හඬ නඟන විමර්ශනාත්මක සංවාදශීලි විවරණයකි. මෙමඟින් ජනතා විඥානය, අවබෝධය පුළුල් කෙරෙන යහ පාලනයෙන් යුත් දේශයක් ගොඩනැගීම සඳහා පෙළ ගැසෙන මෙහෙවරකට දායකවීමට ඔබටද ආරාධනා කෙරේ....**

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, එයට වඩා හොඳයි කියලා ගෙනෙන්නට හදන පණතත් ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට බරපතළ ලෙස තර්ජන ඇති කරනවා. ඇයි අපි එහෙම කියන්නේ. උදාහරණ ලෙස එකක් තමයි ත්‍රස්ත විරෝධි පනත තුළ අපි දකින ලොකු අඩුපාඩුවක් තමයි මට මතකයි ආන්දෝලාත්මක සහ වැදගත් නඩු තීන්දුවක් වන කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ වසන්ත මුදලිගේ ට අදාළ නඩුවේදී එක තැනක විනිසුරු තුමා තමන්ගේ තීන්දුවේ සඳහන් කරනවා මෙරට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ හෝ එසේ නැත්නම් වෙනත් නඩු තීන්දුවක හෝ වෙනත් තැනක ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදියා කව්ද කියන කාරණය අර්ථ නිරූපණය කර නැහැ. ඒ අඩුපාඩුව ඒ ආකාරයෙන් අපි දකිනවා දැන් මේ කියන වඩාත් විධිමත් ආකාරයෙන් ගෙන එනවා යැයි කියන පනත තුළත් ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදියා හඳුන්වා දී නැහැ.**

නීතිඥ අමිල එගොඩමහවත්ත

# ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් සියල්ලම ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට බරපතල ලෙස තර්ජන ඇති කරනවා.



**● මානව හිමිකම් පිළිබඳව ඈත ඉතිහාසය ගැන කතා කරනවා නම් පැවසිය හැක්කේ කුමක්ද?**

අපේ කියවා ගැනීමක් තියෙනවා ඈත මානව හිමිකම් කියන්නේ දශක කිහිපයකට කලින්, ලෝක යුද්ධයට පසුව ඇති වූ සංකල්ප කියලා. නමුත් මානව හිමිකම් යන සංකල්පය ගැන අපි කතා කළොත් බෞද්ධ රටක් ලෙස බෞද්ධ ඉතිහාසය තුළත් බෞද්ධ ධර්මය තුළ මනුෂ්‍යයන් මනුෂ්‍යයන් අතර සලකා ගත යුතු ආකාරය, මනුෂ්‍යයන්ට ගරු කළ යුතු ආකාරයත් විවිධ වූ ආචාර ධර්ම සඳහන් වෙනවා. රාමායනය, බයිබලය, කුරානය ගැන කතා කළත් මිනිස් ශිෂ්ටාචාරයක් බිහි වන්නේ මානවයා පදනම් කර ගෙනයි.  ඒ ශිෂ්ටාචාරය බිහි වීම තුළ සියවස් ගණනාවක ඈත අතීතයේ සිට ක්‍රමිකව මානවයින්ට ගරු කළ යුත්තේ, මානව සම්බන්ධතා ගොඩනගා ගත යුත්තේ කෙසේද පිළිබඳව ක්‍රමකිව වර්ධනය වෙලා තිබෙනවා. උදාහරණයක් ලෙස අතීතයේ ධ්වන්ද සටන් මුහුණට මුහුණලා සිදු කරන සටන් තිබුණා. ඒ සටන්වලදී සතුරාගේ වුවද ආයුධ නැති වනවිට, රෝගාතුර වන විට, අඩපණ වන වැනි අවස්ථාවල සතුරාට පහර දෙන්නේ නැහැ. යුද්ධයකදී පවා ඈත අතීතයේ සිට මානව හිමිකම් සංකල්ප කතා කර තිබෙනවා. පසුව ඒවා ක්‍රමිකව දෙවන ලෝක යුද්ධයත් සමග සතුරු මිතුරු පාර්ශව ලෝක යුද්ධය හරහා මානවයන්ට බරපතල විනාශයන් වෙනවා. සමූල වශයෙන් ඝාතනය වෙනවා. මේවා සම්බන්ධයෙන් යම් එකඟතාවයන්ට එන්න ඕනා කියන කාරණාව ක්‍රමිකව වර්ධනය වෙලා තමයි අද වර්තමානයේ මානව හිමිකම් තියෙන්නේ. මානවයාගේ දියුණුව තාක්ෂණික දියුණුව ඉදිරියේදී මේ ඇති වන දියුණුව තත්ත්වයන් වෙනස් වී, සංවර්ධනය වී මේ තිබෙන සංකල්පය වඩාත් පුළුල් වේවි. මානව හිමිකම් කියන්නේ අද ඊයේක තියෙන කෙටි ඉතිහාසයක් නෙවෙයි කියන කාරණය අපට අවධාරණය කරන්න පුළුවන්.

**● මානව හිමිකම් යනු බටහිර සංකල්පයක්ද? ඒ ගැන පැවසිය හැක්කේ කුමක්ද?**

මානව හිමිකම් ගැන අපේ රටේ කාලයක් ප්‍රතික්ෂේප කරන්න එක හේතුවක් වූයේ මෙය බටහිර සංකල්පයක් යනුවෙන් එල්බගෙන සිටීමයි. තවත් විටෙක බටහිර රටවල් මානව හිමිකම් උල්ලංඝනය කරමින් අපට පවසන්නේ මානව හිමිකම් රකින්න කියලයි. එහෙම කතාවකුත් තිබෙනවා. අප ගත යුත්තේ එය නොවෙයි. වඩාත් වැදගත් වන්නේ සංකල්පයයි. සංකල්පය තුළ වෙනම මාතෘකා කතා කළ යුතුයි. මානව හිමිකම් කියන සංකල්පය ගතහොත් එය මානවයාට අහිතකර දෙයක් නෙවෙයි. කෙනෙකුගේ ජීවත්වීමේ අයිතිය, ආහාර, අධ්‍යාපනික, දේශපාලනික, සිවිල්, ආර්ථික අයිතින් තහවුරු කිරීම මොනම සමාජයක වුවත් වැරදි දෙයක් නොවෙයි.  මානව හිමිකම් කියන සංකල්පය බටහිර රටවල් මුල් වෙලා එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය වේවා, අනෙකුත් ලේඛන හරහා කෙටුම්පත් කර සමාජයට එවීම වෙන්න ඇති ජනතාව බටහිර සංකල්පයක් කියා ලගු කරන්නේ. නමුත් සංකල්පයක් ලෙස මානව හිමිකම් කියන්නේ ඕනෑම භූගෝල පරිසරයක, ඕනේම කාලයක මනුෂ්‍යයන්ට අත්‍යවශ්‍ය රැකවරණයක්.

**● අපි දන්නවා විවිධ ප්‍රඥප්තීන් මානව හිමිකම් ක්ෂේත්‍රය තුළ පවතිනවා. ඒ අතරින් නීති හැටියට කොටසක් අප ව්‍යවස්ථාවෙන් සම්මත කර තිබෙනවා. ඒ පිළිබඳව පවසනවා නම් ප්‍රකාශ කළ හැක්කේ කුමක්ද?**

එය ඉතා බොහොම වැදගත්. මානව හිමිකම් කියන සංකල්පය රටවල් තමන්ගේ රට තුළට ඇතුල් කර ගැනීමේදී තමන්ගේ රටේ ජනතාවට ඒ හිමිකම් ලබා දීමේදී මානව හිමිකම් කියන්නේ විශාල කුලකයක්. මානව හිමිකම් තුළ සියලුම ආකාර සිවිල්, දේශපාලන, ආර්ථික සියලුම අයිතිවාසිකම් ගැබ් වී තිබෙනවා. නමුත් ආර්ථික සංකල්ප ලෙස ආහාර,



**නව ත්‍රස්ත පනතෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ නියෝගය මත කෙනෙකුව මාස තුනක් දක්වා රැඳවුම් නියෝග මත තබා ගැනීම සඳහා අත්සන් කරන්න අවසරය තිබෙනවා. කලින් එම බලය තිබුණේ ආරක්ෂක ඇමතිවරයාටයි. යම් සිද්ධියක් එතනට ගෙනෙන්න යාන්ත්‍රණයක් තිබෙනවා. අපි දන්නවා මේ රටේ පොලිසිය හැසිරෙන විදිහ. දේශපාලකයෙකුගෙන් පොලිස්පතිවරයාට අහවල් පුද්ගලයෙකුට රැඳවුම් නියෝග ගන්න කියලා වචනයක් ආවොත් එය ප්‍රතික්ෂේප කිරීමට පොලිස්පතිවරයාට කොන්දක් හෝ ප්‍රතිපත්තියක් තිබේද? නියෝජ්‍ය පොලිස්පතිවරු පනස් දෙනකු අතර ජාලයක් ඇති වෙනවා මේ දේවල් කරන්න. මෙම තත්ත්වය නිසා පහසුවෙන් හැකි වෙනවා කර්මාන්තශාලාවලින් පිටවන අපද්‍රව්‍ය පිළිබඳව උද්ඝෝෂණයක් සිදු කරන අයෙකුව හෝ එයට නායකත්වය දෙන අයෙකුව ත්‍රස්තවාදය යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට හැකි වෙනවා එම පුද්ගලයන්ව මාස 3ක් බන්ධනාගාරගත කිරීමට. පාලකයෝ සුරංගනා කථා කියයි.**

ඇඳුම් පැළඳුම්, නිවාස සඳහා හිමිකම ලබා දීමට රටකට රාජ්‍යයකට විශාල පිරිවැයක් දැරීමට සිදු වෙනවා. දියුණු රටකට එය කළ හැකි වුවද, ලංකාව වැනි ආසියාතික රටකට සෞඛ්‍ය, ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස වැනි අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ගොන්නට දමා අනිවාර්යයෙන් එය රැකිය යුතුයි කියන තැනට දමා එය සුරක්ෂා කිරීමට බැරි තත්ත්වයට පත් වන්නේ ආර්ථික ගැටලු නිසයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගත්තත් 10 වැනි ව්‍යවස්ථාවේ සිට පරිච්ඡේදය තුළ ඉදිරියට කතා කරන්නේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ගැනයි. ඒවා ආර්ථික අයිතිවාසිකම් සමග වෙනස් වන එක විදිහක් තමයි ආර්ථික පිරිවැය. ඒවා ලබා දීමට රටකට ආණ්ඩුවකට වියදමක් වැය වෙනවා. සැමට නීතිය එක ලෙස ක්‍රියාත්මක කරවගන්න, සෑම කෙනෙකුගේ භාෂණයේ අයිතිය ආරක්ෂා කර ගැනීමට, වද හිංසාවලට පමුණුවන්නේ නැතිව වැළකී සිටීමට කියන අයිතීන් ලබා දීමට රටකට, පාලකයන්ට වැයවීමක්, පිරිවැයක් නැහැ. පිරිවැයක් දැරීමකින් තොරව ඒවා ලබා දෙන්න පුළුවන්. මානව හිමිකම් කඩ **වුවොත් ශ්‍රේෂ්ඨාධිකරණයට පවා ගොස් ගන්න පුළුවන් පිළියම් පවා බලාත්මක කරන්න පුළුවන් මට්ටමක තිබෙනවා. ඉන්දියාව වැනි රටක ජීවත් වීමේ** අයිතියත් මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගෙන තිබෙනවා. අපේ රටේ නිශ්චිතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ජීවත් වීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස නැති වුවත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු ගතහොත් ඒවාවල මානව හිමිකම් ගැන සාකච්ඡා වී තිබෙනවා.

**● නව ත්‍රස්ත පනත, නැතිනම් ප්‍රතිත්‍රස්ත පනත සමග මානව අයිතීන් උල්ලංඝනය වෙනවා කියා අපට හිතෙනවා. ත්‍රස්ත පනත සංශෝධානයන් පිළිබඳව දැනගැනීමට ලැබී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පවසනවා නම් පැවසිය හැක්කේ කුමක්ද?**

ගෙනෙන්නට හදන ත්‍රස්ත විරෝධි පනත පමණක් නොව දැනට පවතින ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් කෙටුම්පත 1979 සම්මත කරන ලද තාවකාලික පනත් කෙටුම්පත ලෙස ඒ නමුත් අද මේ වන තුරු වසර 40ක් පමණ ක්‍රියාත්මක වන මේ පනත හරහා යුධ සමයේ ද්‍රවිඩ ජනතාව මෙන්ම පාස්කු ප්‍රහාරයේදී මුස්ලිම් ජනතාව සහ අරගල කාලයේදී දකුණේ සිංහල තරුණයන් මේකෙන් පීඩාවට පත් වූ විදිහ අපි දුටුවා. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතත්, එයට වඩා හොඳයි කියලා ගෙනෙන්නට හදන පනතත් ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට බරපතල ලෙස තර්ජන ඇති කරනවා. ඇයි අපි එහෙම කියන්නේ. උදාහරණ ලෙස එකක් තමයි ත්‍රස්ත විරෝධි පනත තුළ අපි දකින ලොකු අඩුපාඩුවක් තමයි මට මතකයි ආන්දෝලාත්මක සහ වැදගත් නඩු තීන්දුවක් වන කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ වසන්ත මුදලිගේ ට අදාළ නඩුවේදී එක තැනක විනිසුරු තුමා තමන්ගේ තීන්දුවේ සඳහන් කරනවා මෙරට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ හෝ එසේ නැත්නම් වෙනත් නඩු තීන්දුවක හෝ වෙනත් තැනක ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදියා කව්ද කියන කාරණය අර්ථ නිරූපණය කර නැහැ. ඒ අඩුපාඩුව ඒ ආකාරයෙන් අපි දකිනවා දැන් මේ කියන වඩාත් විධිමත් ආකාරයෙන් ගෙන එනවා යැයි කියන පනත තුළත් ත්‍රස්තවාදය හෝ ත්‍රස්තවාදියා හඳුන්වා දී නැහැ. නමුත් එම පනතේ 2, 3 වගන්ති අපි අධ්‍යයනය කළොත් ඒවා දණ්ඩ නීති සංග්‍රහය තුළද වැරදි තමයි. මහජනතාවට පීඩා කිරීම, රජයේ කටයුතුවලට විරුද්ධව කටයුතු කිරීම වැනි කරුණු ගණනාවක් මත තීරණය කරනවා මෙම ක්‍රියාව ත්‍රස්තවාදි ක්‍රියාවක් කියලා. එතකොට අපි අහන්නේ කව්ද එහෙම තීරණය කරන්නේ? සරල උදාහරණයක් ලෙස කිවහොත් යම් තැනක යම් කිසි පිරිසක් බස් රථයක් ගිනි තබනවා. එම බස් රථයේ පෞද්ගලික කෙනෙකුගේ වුවහොත් එය ත්‍රස්තවාදි නොවෙයි. එම බස් රථය රජයේ දේපළක් වුවහොත් එය ත්‍රස්තවාදි ක්‍රියාවක් වෙනවා. ඉතින් කොහොමද ත්‍රස්තවාදය ගැන අර්ථ නිරූපණයක් නැතිව එකම වරද දෙආකාරයට තීරණය කරන්නේ? අපි කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගතහොත් 12 (1) අනුව නීතිය පසඳලීම සහ ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණයට, සර්ව සාධාරණ විය යුතුයි. අර මා කලින් සඳහන් කළ එකම ක්‍රියාව රජයේ බස් රථයක් ගිනි තිබ්බොත් එය ත්‍රස්තවාදය වෙන්නයි, පෞද්ගලික බස් රථයක් ගිනි තිබ්බොත් එලෙස නොවෙන්නත් සාමාන්‍ය අපරාද නීතිය යටතේ යන්නත් එකම ක්‍රියාව දෙවිදිහකට තීරණය කරන්නේ කවුද? එකම ක්‍රියාව දෙවිදිහකට සලකනවා නම් 12 (1) ව්‍යවස්ථාව යටතේ සැමට එක ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ කාරණය බිඳ වැටෙනවා.

අලුතෙන් පුනරුත්ථාපන පනත් ගෙනෙන්නට හදනවා. එතන මම නැහැ. මේ රටේ ප්‍රධාන අපරාධ නීතියේ තිබෙනවා අධිකරණයේ යම් යම් වැරදි සම්බන්ධයෙන් මිනී මරපු කෙනෙකුව පුනරුත්ථාපනය කළ හැකි මට්ටමේ නැහැ. වරදේ බරපතල ස්වභාවය සහ වරද සිදු කළ අවස්ථාවේ නම් එම කරුණු බලා, වයස බලා ඒ අයව පුනරුත්ථාපනයට යොමු කරවන්න පුළුවන්. ඒ සඳහා පනත් කෙටුම්පත් වෙනම තිබෙනවා. එය එලෙස තිබියදී රටේ සුවිශේෂී කාරණා අරඹයා වයස,



වරදේ ස්වභාවය බලා පුනරුත්ථාපනය කරන්න පුළුවන්. ඒ සඳහා පනත් කෙටුම්පත් වෙනමම තිබෙනවා. නමුත් වරදේ ස්වභාවය අනුව විශේෂත්වයක් දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා.

විශේෂත්වය, හැඩය, ප්‍රමාණය තීරණය කරන්නේ කවුද? ස්වාධීන ආයතනයක් වන අධිකරණය තීන්දු කරනවා නම් වරදක් නැහැ. නමුත් එය තීරණය කරන්නේ පොලීසිය, පළාතේ මන්ත්‍රී හෝ ජනාධිපතිවරයා නම් එතන ගැටළුවක් තිබෙනවා. එකක් තමයි මේවා දේශපාලන පත්වීම්. හැම වෙලාවකදීම අපි දන්නවා පොලීසිය හෝ මන්ත්‍රීවරුන් හෝ ජනාධිපතිවරයා දේශපාලන පක්ෂපාතීත්වයක් හරහා තමයි ඒ දේවල් වෙන්නේ. අරගලයේ තරුණයන් පිරිසක් උද්ඝෝෂණය කරනවා ලයිට් බිල අඩු කරන්න කියලා. අපි හිතමු දැන් සිටින ජනාධිපතිවරයාගේ පක්ෂයේ පිරිසක් කියනවා ලයිට් බිල ඔහොම්ම තිබුණාට කමක් නැහැ කියලා. එතකොට පොලීසිය පැමිණ ලයිට් බිල අඩු කරන්න කියලා උද්ඝෝෂණය කරන පිරිස් පුනරුත්ථාපනයට දමනවා. එතකොට ජනාධිපතිවරයාගේ පක්ෂයෙන් පැමිණ උද්ඝෝෂණය කරපු අයව පුනරුත්ථාපනය කරන්නේ නැහැ. පුනරුත්ථාපනය ඔය ආකාරයෙන් යාන්ත්‍රණයකින් සිදුවීම ආදීනව එලෙස තිබෙනවා. අධිකරණයකට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සිදු වන කාරණය වෙනස්. එහිදී ඉදිරිපත් වී ඇති සාක්ෂි මත ස්වාධීන විනිසුරුවරයෙකුට පුළුවන් තීරණයක් ගන්න පුළුවන්.

පුනරුත්ථාපනය පිළිබඳව තවත් බරපතල කාරණාව නම් දැන් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගත්තම ඕනෑම පුද්ගලයෙකුට අපරාධ නීතිය ඉදිරියට එන විට මූලික සිද්ධාන්ත දෙකක් තිබෙනවා. පූර්ව නිර්දෝෂීභාවය හා පූර්ව නිගමනය. අපරාධ නීතිය යටතේත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා 13 (5) වරදකරුවෙක් ඔප්පු කරන තෙක් සෑම වරදකරුවෙක් නිර්දෝෂී යැයි අනුමාන කළ යුතුය. එය රටේ මූලික අයිතිවාසිකමක් බවට පත් වී තිබෙනවා.

**යම් වරදක් සම්බන්ධයෙන් පුද්ගලයකු චෝදනා ලැබුවහොත් ත්‍රස්තවාදී පනත සමඟ ඒ පිළිබඳව කතා කළොත් 77 වගන්තියේ අධි චෝදනා පත්‍ර ගොනු කරන්නට පෙර හෝ නඩු තීන්දුවට කලින් නීතිපතිවරයා සහ විත්තිකරුවන්ගේ නීතිඥයන් අතර ඇතිකරගන්නා කරුණු දැක්වීම්වලට ඇහුම් කන් දී අධිකරණයේ අවසර ඇතිව නීතිපතිවරයා දෙන යම් පාඨයක් කියා සමාව ඉල්ලන්න එසේ නොමැති නම් පුනරුත්ථාපනයට ස්වයංව ඉදිරිපත් වෙන්න, නැතිනම් දඩ මුදලක් ගෙවා අයින් වෙන්න. අපරාධ නීතිය තිබෙනවා කෙනෙක්ට චෝදනා ගොනු කරන මුල් අවස්ථාවේ 13 (5) වගන්තිය ප්‍රකාරව අධිකරණයක් විසින් වරදකරු** කරන තෙක් ඔහු නිර්දෝෂී කියන කාරණය. හැම නඩු විභාගයකට ම සහභාගි වන අයට සාධාරණ නඩු විභාග යක් තිබිය යුතුයි. එසේ තිබියදී ත්‍රස්ත පනත වැනි පනතක් ගෙනත් යම් වැරදි ඒ මගින් හඳුන්වා දී දඬුවම් නියම කිරීම්, සිරගත කිරීම් වැනි තත්ත්වයන් ඇතිකර පෞද්ගලික දේපල රාජ සන්තක කර, බරපතල දණ්ඩනයක් පෙන්වමින් එතනට නොයා ඇතැම් විට මෙම ක්‍රියාව තුළ පුද්ගලයෙකු කල්පනා කරනවා අවුරුදු ගණනාවක් තමන් නඩු කියනවද, නැතිනම් වරද පිළිගෙන පුනරුත්ථාපන වී අවුරුද්දකින් ගෙදර යනවද කියන කාරණය තීරණය කරන්න පුළුවන්. මා සඳහන් කරන්නේ එය මේ රටේ අපරාධ නීතිය පිළිබඳ වූ මූලික සංකල්ප දෙකට සපුරා පටහැනි පූර්ව නඩු විභාගයක්, පූර්ව නිර්දෝෂිභාවය කෙනෙක් ට නිර්දෝෂිභාවය තිබියදී වරද පිළිගැනීමේ කොන්දේසි ඇතුළත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තිබෙන 13 (5) යටතේ ඒ මූලික අයිතිවාසිකමටත් බරපතල ලෙස බලපෑමක් තිබෙනවා. කලින් තිබූ ත්‍රස්ත පනතත් වැරදියි. නමුත් නව ත්‍රස්ත පනතෙන් නියෝජ්‍ය පොලිස්පති වරයෙකුගේ නියෝගය මත කෙනෙකුව මාස තුනක් දක්වා රැඳවුම් නියෝග මත තබා ගැනීම සඳහා අත්සන් කරන්න අවසරය තිබෙනවා. කලින් එම බලය තිබුණේ ආරක්ෂක ඇමතිවරයාටයි. යම් සිද්ධියක් එතනට ගෙනෙන්න යාන්ත්‍රණයක් තිබෙනවා. අපි දන්නවා මේ රටේ පොලිසිය හැසිරෙන විදිහ. දේශපාලකයෙකුගෙන් පොලිස්පතිවරයාට අහවල් පුද්ගලයෙකුට රැඳවුම් නියෝග ගන්න කියලා වචනයක් ආවොත් එය ප්‍රතික්ෂේප කිරීමට පොලිස්පතිවරයාට කොන්දක් හෝ ප්‍රතිපත්තියක් තිබේද? නියෝජ්‍ය පොලිස්පතිවරු පනස් දෙනකු අතර ජාලයක් ඇති වෙනවා මේ දේවල් කරන්න. මෙම තත්ත්වය නිසා පහසුවෙන් හැකි වෙනවා කර්මාන්තශාලාවලින් පිටවන අපද්‍රව්‍ය පිළිබඳව උද්ඝෝෂණයක් සිදු කරන අයෙකුව හෝ එයට නායකත්වය දෙන අයෙකුව ත්‍රස්තවාදය යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට හැකි වෙනවා එම පුද්ගලයන්ව මාස 3ක් බන්ධනාගාරගත කිරීමට. පාලකයෝ සුරංගනා කථා කියයි. ඒ සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට අභියාචනා ධිකරණ මණ්ඩලය හරහා, බන්ධනාග ාරගත කළත් මහේස්ත්‍රාත්වරයා වෙත පැය 48ක් ඇතුළත පෙන්වීමට හැකි බවත් මානව හිමිකම් කොමිසමටද ඔවුන් ගැන සොයා බැලීමටත්, ඔවුන්ගේ ළඟට යාමට හැකි බව පවසයි. හැබැයි රැඳවුම් නියෝග සියල්ල තුළ තමයි මේ දේවල් සිදු වෙන්නේ.

**උදාහරණයක් ලෙස විධායකය, ව්‍යවස්ථාදායකය අභිබවා යාමට හදනවා නම් විධායකය අගතිදායක ලෙස කටයුතු කරනවා නම් දෝෂාභියෝග වැනි ක්‍රියාමාර්ග හරහා සංවරණ තුලන ක්‍රම විසඳාගත හැකි ආකාරයට ව්‍යවස්ථාපිත ක්‍රමවේද මේ රටේ තිබෙනවා. පසුගිය දවස්වල මැතිවරණයට අදාළව ලබා දුන් නඩු තීන්දුවකට අදාළව අධිකරණ තීන්දුවක් සම්බන්ධව ඒ තීන්දුව ලබා දුන් හේතු සම්බන්ධයෙන් සොයා බලන්න පාර්ලිමේන්තු තේරීම් කාරක කමිටුවක් වෙත විනිසුරුවරයන් ගෙන යාමට උත්සහ කරනවා. එය තමයි ඔය කියන සිද්ධිය. එය පැහැදිලිවම අධිකරණ ස්වාධීනත්වයට අත පෙවීමක්. මොකද අධිකරණයේ ස්වාධීන්තවය කියන්නේ අධිකරණ විනිශ්චයකාරවරයාට ස්වාධීනව තීන්දුවක් ගැනීමේ අයිතියයි. අපි දන්නවා පහළ අධිකරණයේ යම් තීන්දුවක් ගතහොත් අභියාචනාධිකරණයට යාමට හැකියාව තිබෙනවා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතනින් එහාට යාන්ත්‍රණයක් ලබා දී නැහැ.**



**ජනතාව තෝරා නොගත් දේශපාලඥයන් හිතනවා තමන්ගේ බලය රැකගන්න නම් අපිට නැති වෙන ජන ප්‍රසාදය, බලය රැකගන්න පුළුවන් ඊළග ක්‍රමය තමයි අපි රැකෙන විදිහේ නීතියක් ඇති කරගන්න ඕනා, ජනතාව මර්දනය කරන්න ඕනා, එහෙම එළියට බහින්න ජනතාවගෙන් පළිගන්න ඕනා, නැවත එළියට බහින්න හිතන්නවත් බැරි වෙන තත්ත්වයකට පත් කරගන්න ඕනා මානසිකත්වය තුළ පාලකයන් ජනතාව වේවා, මාධ්‍ය ආයතන, සමාජ ක්‍රියාකාරී කණ්ඩායම්, වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ මර්දනය කිරීම සඳහා මේ වගේ නීති ගේන්නේ. මාධ්‍ය හරහා තමයි ජනතාව දැනුවත් වෙන්නේ. අද ප්‍රවෘත්ති කියන්නේ පැය 24 ම සජීවී මාධ්‍යයක්. අපි ඕනෙම වෙලාවක සමාජ මාධ්‍ය ගතහොත් රටේ, ලෝකයේ, පාර්ලිමේන්තුවේ සිදුවන හැම සත්‍යය තොරතුරු, සිදුවීම් අපිට බලන්න පුළුවන්. ඒ හරහා තීන්දු තීරණවලට අපට එන්න පුළුවන්.**

මනුෂ්‍යයකු ව දින 90ක් රැඳවුම් නියෝග ලබා තබා ගැනීම මානව හිමිකම් කෝණයෙන් ඉතා බරපතල තත්ත්වයක්. එවැනි බලයක් නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට ලබා දීමෙන් සිදු වන්නේ මේ රටේ ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩවීමයි. මේ හැම දෙයකින්ම සිදුකරන්නේ ත්‍රස්ත බිය ඇති කිරීමයි. සුළු මට්ටමේ වරදකින් සුළු බියක් ඇති කරනවා. සුළු පහර දීමක් තුළ සුළු බියන් ඇති කරනවා. නව පනත හරහා ත්‍රස්තවාදී බියක් ඇති කර සමාජය තුළ හෝ යම් ප්‍රජාවක් තුළ උද්ඝෝෂණයක් සිදු කිරීම පවා ත්‍රස්ත බියක් ඇති කර ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට දරුණු බලපෑමක් සිදු වෙනවා.

**● ශ්‍රේෂ්ඨාධිකරණය උත්තරීතර ආයතනයක්. විනිසුරුවන් පාර්ලිමේන්තුවට කැඳවීමට තීරණය කර තිබෙනවා. එය කෙසේ නීතියේ ආධිපත්‍යයට බලපෑමක් වන්නේ දැයි ඒ ගැන පැවසිය හැක්කේ කුමක්ද?**

රටේ පාලන බලතල කොටස් 3යි. ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයයි. ව්‍යවස්ථාදායකය මේ රටේ නීති සකස් කරනවා. අධිකරණය නීතිය ක්‍රියාත්මක කරනවා. විධායකය විධායක කර්තව්‍යය සිදු කරනවා. අපි කියනවා මේවා අතර සංවරණය හා තුලනය කරගෙන යාම සඳහා යම් යම් තත්ත්වයන් තිබෙනවා. උදාහරණයක් ලෙස විධායකය, ව්‍යවස්ථාදායකය අභිබවා යාමට හදනවා නම් විධායකය අගතිදායක ලෙස කටයුතු කරනවා නම් දෝෂාභියෝග වැනි ක්‍රියාමාර්ග හරහා සංවරණ තුලන ක්‍රම විසඳාගත හැකි ආකාරයට ව්‍යවස්ථාපිත ක්‍රමවේද මේ රටේ තිබෙනවා. පසුගිය දවස්වල මැතිවරණයට අදාළව ලබා දුන් නඩු තීන්දුවකට අදාළව අධිකරණ තීන්දුවක් සම්බන්ධව ඒ තීන්දුව ලබා දුන් හේතු සම්බන්ධයෙන් සොයා බලන්න පාර්ලිමේන්තු තේරීම් කාරක කමිටුවක් වෙත විනිසුරුවරයන් ගෙන යාමට උත්සහ කරනවා. එය තමයි ඔය කියන සිද්ධිය. එය පැහැදිලිවම අධිකරණ ස්වාධීනත්වයට අත පෙවීමක්. මොකද අධිකරණයේ ස්වාධීන්තවය කියන්නේ අධිකරණ විනිශ්චයකාරවරයාට ස්වාධීනව තීන්දුවක් ගැනීමේ අයිතියයි. අපි දන්නවා පහළ අධිකරණයේ යම් තීන්දුවක් ගතහොත් අභියාචනාධිකරණයට යාමට හැකියාව තිබෙනවා. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එතනින් එහාට යාන්ත්‍රණයක් ලබා දී නැහැ. නමුත් අධිකරණ තීන්දු ලබාදෙන්නේ පළපුරුදු, වර්ෂ ගණනාවක් අධිකරණ ක්ෂේත්‍රයේ සිට ඒ පිළිබඳව හසළ දැනුමක් තිබෙන විනිසුරුවරුන් විසින්. එම තීන්දු මොන ආකාරයෙන් බලපෑවත් එයට යටත් වෙන්න වගකීමක් තිබෙනවා. එහෙම තත්ත්වයක් තුළ ඇයි මේ තීන්දුව දුන්නේ, ඇයි මෙවැනි තීන්දුවක් ගත්තේ කියා විනිසුරුවරයන්ව පාර්ලිමේන්තුවට ගෙනැවිත් ප්‍රශ්න කරන්න ගියහොත් ඉදිරියේදී ඒ හා සමාන නඩුවලදී විනිසුරුතුමන්ලා ලබාදෙන තීන්දු තීරණවල නිදහසට පැහැදිලි සීමා කිරීමක් එතැනින් සිදු වෙනවා. එතකොට අධිකරණයේ කටයුතුවලට ව්‍යවස්ථාදායකය අනවශ්‍ය ලෙස ඇඟිලි ගැසීමක් ලෙස අපි දකිනවා. එය අධිකරණයේ ස්වාධීනත්වයට මරු පහරක් ලෙස අපි දකිනවා.

**● අරගලය කරන්න මූලික අයිතියක් තියනවා කියලා අපි හිතනවා. අරගලකරුවන්ට පහර දුන්නා. නීතිඥයෙකු ලෙස ඔබ මේ ගැන විග්‍රහ කරන්නේ කෙසේද?**

පසුගිය වසරේ අප්‍රේල් මාසය වන විට අපේ රටේ ජනතාව තුළ පිබිදීමක් ඇති වෙනවා. ඒ ජනතාවගේ පිබිදීම අරගලය ලෙස හඳුනා ගන්නවා. එයට අදාළ මුලින්ම සිද්ධිය සිදු වන්නේ මිරිහානේ ජනාධිපතිවරයාගේ නිවස ඉදිරිපිට සාමකාමී උද්ඝෝෂණයක නිරතව සිටියදී ආරක්ෂක අංශ විසින් දරුණු ප්‍රහාරයක් එල්ල කරනවා. එතැනින් නොනැවතී විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන අධිකරණය වෙත ඉදිරිපත් කරනවා. ඒ මොහොතේ නීතිඥවරු විශාල වශයෙන් ඒ ජනතාව වෙනුවෙන් පෙනී සිටිනවා. එතැනදී නීතිඥවරුන් යොදාගත් බෙදුම් රේඛාව තමයි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මේ ජනතාවට ලබා දී තිබෙනවා භාෂණය සහ ප්‍රකාශනයේ අයිතිය. එය එසේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ලබාදී තිබියදී ජන ඝෝෂා වැනි උද්ඝෝෂණවලදී එය මොනවාගේ හැඩයක්ද? කොහොමද ජනතාවට එය පාවිච්චි කරන්න පුළුවන් ආකාරය පැහැදිලිවම අර්ථ දක්වා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා ඒ කාලේ සංවිධානය කළ නලා, සීනු, බෙර ශබ්ද පිට කර සිදු කළ විරෝධතාවය ගැන ඕනෑවටත් වැඩිය අර්ථ දක්වා තිබෙනවා. බෙර වාදනය, සීනු, නලා ශබ්ද කිරීම, විරෝධතා පුවරු වැනි දේ ජනතාවට ප්‍රකාශනයේ අයිතිය යටතේ තහවුරු වී තිබෙනවා. අරගලයේ මේ ජන පිබිදීම ලං වන විට මේ රටේ ආර්ථික හා ආර්ථික හා සමාජ තත්ත්වය අනුව මේ රටේ පැය ගණනාවක් විදුලි බලය තිබුණේ නැහැ. ඒ අතරම ඉන්ධන පෝලිමත් තිබුණා. දරුණු ආර්ථික කඩාවැටීමක් තිබුණා. ඒ කඩාවැටීම හමුවේ ජනතාව දකිනවා පාලකයන් ඒවා නොදැක්කා සේ නිදි කිරා වැටෙනවා. ගෝල්ෆේස් එකේ වේවා, මිරිහානේ වේවා සාමකාමීව සිදු කරන තෙක් එය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟයි කියන තැන තමයි මේ රටේ නීතිඥ ප්‍රජාව සිටියේ. අරගලය පුරාවට අධිකරණය මගින් ලබාදුන් නියෝගයන් තීරණයන් දිහා බැලුවම නීතිඥ ප්‍රජාව හරි කියන දේ අපිට තහවුරු වුනා. මිරිහානේදී පොදු

දේපල යටතේ අත්අඩංගුවට ගැනීම් සිදු කළා. එලෙස පොදු දේපල නීතියෙන් අත්අඩංගුවට ගැනීමෙන් පසු ඇප ගැනීමට බරපතල තත්ත්වයක් තිබෙනවා. පොදු දේපළ පනත යනු මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් කප්පාදු කරන පනතක්. එවැනි නීති හමුවේ මිනිස්සුන්ව බන්ධනාගාරගත කරන්න පොලීසිය ඇතුළු ආරක්ෂක අංශ, විමර්ශන අංශ උත්සහ කරනවා නම් නිශ්චිත ප්‍රබල සාක්ෂි තිබිය යුතුයි. නමුත් එහෙම සාක්ෂි තිබුණේ නැහැ. ඒ විරෝධතාවයන් ප්‍රචණ්ඩ මුහුණුවරක් ගත්තේ නැහැ. ගෝල්ෆේස් භූමියේ දින 120ක් පුරාවට පැවති අරගලය බොහොම සාමකාමීව සහ ප්‍රකාශනාත්මකව සිදු කළ අරගලයක්. එයට මේ රටේ සෑම ක්ෂේත්‍රයකම මිනිසුන් සම්බන්ධ වුණා. නීතිඥවරයා ඔහුගේ ප්‍රකාශනය ජනතාව වෙනුවෙන් පෙනී හිඳිමින් ප්‍රකාශ කළා. සංගීතය, කලාකරුවා එයට සංගීතය, නර්තනය, නාට්‍යය එකතු කළා. පාපැදිකරුවන්, ක්‍රීඩකයන් ඒ හැඩ එතැනට එක්කහු කළා. යාග, ශාන්ති කර්ම කරන අය ඒ හැඩය එතැනට එකතු කළා. මේ සියල්ල හරහා මිනිසුන් ප්‍රකාශනය තමයි සිදු කළේ. එය සාමකාමීව සිදු කිරීමට මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලි අයිතියක් ජනතාවට ලබාදී තිබෙන නිසා තමයි ඒ වගේ සාමකාමී අරගලයක් කරන්න මිනිසුන්ට අයිතියක් තියෙනවා කියලා අපි කිව්වේ. නමුත් ඒ අරගලය මැයි 9 වැනිදා පාලකයෝ විසින් එයට ප්‍රචණ්ඩ ප්‍රහාරයක් එල්ල කර ඒ හරහා රට තුළ විවිධ ගිනි ගැනීම්, විවිධ දේපල ජීවිත හානි පවා සිදු වුණා. නීතිඥයන් ලෙස ඒවා අපි අනුමත කරන්නේ නැහැ. එවැනි ක්‍රියා සාමකාමී ගොන්නට අදාල වෙන්නෙත් නැහැ. ඒවාවල දී යම් කෙනෙක් ප්‍රචණ්ඩව හැසිරුණා නම් ඒවා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕන. නමුත් අපි එතනදි දැක්ක දේ තමයි ඇත්තටම ඒ දේවල් සිදු කළ මිනිසුන් නෙවෙයි නීතිය හමුවට ගෙනාවේ. අපි ප්‍රායෝගිකව දිවයිනේ විවිධ තැන්වල ඒ පුද්ගලයන් සමඟ කතා කළා, ඔවුන් වෙනුවෙන් නීතිඥයන් ලෙස පෙනී සිටියා. අපි දැක්ක දේ තමයි පොලීසිය, දේශපාලඥයන්, ප්‍රාදේශීය දේශපාලඥයන් ඉලක්ක කළේ ගමේ සාමකාමීව අරගලය කළ තරුණයාව, පවුලේ සාමාජිකයන්ව. ඇත්තටම එදා කලහකාරී වෙලා දේපළ හානි, ජීවිත හානි කරපු අයව නීතිය හමුවට ගෙනෙන්න විමර්ශනය කළේ නැහැ.

**● අපිට පේනවා ආණ්ඩුව මිනිසුන්ගේ හඬ මර්දනය කිරීමට විවිධ ක්‍රියාමාර්ග ගන්නවා. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය නැති කරන්න විවිධ ක්‍රියාමාර්ග ගන්නවා. මාධ්‍ය නිදහස පවා නැති කරන්න සැරසෙනවා කියලා තමයි අපිට තේරෙන්නේ. ඒවගේම ජනතාවට ත්‍රස්තවාදීන් කියාගන්නා මේ ආණ්ඩුවේ තමා ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරනවා කියන එක තමයි අපට පේන්නේ. එතකොට මේ අයිතීන් අහිමි කිරීම නීතිඥයකු ලෙස ඔබ දකින්නේ කෙසේද?**

ඒ සඳහා ප්‍රවේශයක් ලෙස මේ විදියට ගන්නම්. 1948 පසු අප රටේ ඉතිහාසය ගත් කල විවිධ අවස්ථාවල ජනඅරගල තිබුණා. ඒවල හැඩය විවිධාකාර වුණා. නමුත් ඒ හැම අරගලයක් පිටිපස්සෙම මේ රටේ ප්‍රශ්නයක් තිබුණා. නමුත් ඒ සිදුවුන ජන අරගලවල ජනයා අරගල කළ හැඩය තමයි ප්‍රශ්නකාරී වුණේ. ඒ වගේම දේශපාලනඥයින් සහ අවස්ථාවාදීන් ඒ අරගල පාවිච්චි කරපු විදිහ. වර්තමානය වන විටත් මේ රටේ පාලකයන් රටේ තිබෙන ආර්ථික, සමාජීය සහ අනෙකුත් ප්‍රශ්නවලට ගනිමින් සිටින විසඳුම් ස්ථිරසාර සහ අවංක සත්භාවයෙන් වූ තීරණ නෙවෙයි කියන එක ඒගොල්ලන් දන්නවා. මොකද මේ සියල්ල දේශපාලනික ඡන්දය අරඹයා ගනු ලබන ක්‍රියාමාර්ග තමයි අදටත් ගනිමින් ඉන්නේ. දේශපාලඥයන් දේශපාලනික වශයෙන් එවැනි තීන්දු තීරණවලට කැමතියි. ඒවා තමයි ඔවුන්ගේ ජනප්‍රිය තීරණ. හැබැයි එයාලා දන්නවා මේ තීරණ හරහා යම් කිසි දවසක නැවත අර ප්‍රශ්න රටේ මතු වෙනවා කියන කාරණාව. මිනිසුන්ට අරගල කරන්න, මිනිස්සුන්ට ප්‍රශ්න දරාගන්න බැරි වෙන තැන පාරට එන්න වෙන තත්ත්වයක් වෙනවා කියන එක දේශපාලඥයන් දකිනවා. එතකොට එයාලා හිතනවා එහෙම තත්ත්වයක් තුළ ජනඅප්‍රසාදය තිබෙන, ජනතාවගේ කැමැත්තක් නැති, ජනතාව තෝරා නොගත් දේශපාලඥයන් හිතනවා තමන්ගේ බලය රැකගන්න නම් අපිට නැති වෙන ජන ප්‍රසාදය, බලය රැක ගන්න පුළුවන් ඊලග ක්‍රමය තමයි අපි රැකෙන විදිහේ නීතියක් ඇති කරගන්න ඕනා, ජනතාව මර්දනය කරන්න ඕනා, එහෙම එළියට බහින්න ජනතාවගෙන් පළිගන්න ඕනා, නැවත එළියට බහින්න හිතන්නවත් බැරි වෙන තත්ත්වයකට පත් කරගන්න ඕනා මානසිකත්වය තුළ පාලකයන් ජනතාව චේවා, මාධ්‍ය ආයතන, සමාජ ක්‍රියාකාරී කණ්ඩායම්, වෘත්තීය සමිති, දේශපාලන පක්ෂ මර්දනය කිරීම සඳහා මේ වගේ නීති ගේන්නේ. මාධ්‍ය හරහා තමයි ජනතාව දැනුවත් වෙන්නේ. අද ප්‍රවෘත්ති කියන්නේ පැය 24 ම සජීවී මාධ්‍යයක්. අපි ඕනෙම වෙලාවක සමාජ මාධ්‍ය ගතහොත් රටේ, ලෝකයේ, පාර්ලිමේන්තුවේ සිදුවන හැම සත්‍යය තොරතුරු, සිදුවීම් අපිට බලන්න පුළුවන්. ඒ හරහා තීන්දු තීරණවලට අපට එන්න පුළුවන්. මාධ්‍ය ප්‍රබල තැනක ප්‍රබල කණ්ඩායමක් ලෙස ජනතාවගේ මතය හැඩගැසීම සඳහා කටයුතු කරනවා. එම නිසා විද්‍යුත් මාධ්‍ය සමාජ මාධ්‍ය මර්දනය කිරීම ඉතාම අත්‍යවශ්‍ය කාරණාවක් සහ ප්‍රමුඛපෙළේ කාරණාවක් ලෙස පාලකයන් දකිනවා. ඒ සඳහා තමයි මේ අණ අණ පනත් ඇතුළු අනෙකුත් රාමු සකස් කරගන්නේ. ඒ ආකාරයට දැනුවත් වන ජනතාව, සමාජ ක්‍රියාකාරකයින්, වෘත්තිය සමිති, වෙනත් සංවිධාන ඒවට ප්‍රතික්‍රියා දක්වලා කටයුතු කරාවි කියන බය තියෙන පාලකයන් ත්‍රස්ත විරෝධී පනත චේවා වෙනත් පනත්වලින් චේවා රඳවා තබන්න, නිහඬ කරන්න ගන්න ක්‍රියාමාර්ග තමයි අපි දකින්නේ. පාලකයන් ඇත්ත විසඳුමෙන් ගොඩක් ඈත ඉන්නේ. පාලකයන් හිතනවා මේ රටේ තියෙන ප්‍රශ්නවලට විසඳුම මර්දනය කියලා. දේශපාලඥයන් අවංක විය යුතුයි. ඊළඟට ඇත්ත උත්තර සොයන්න ඕනා. එහෙම නැතුව මේ රටේ දේශපාලනය, ඡන්දය අරඹයා උත්තර හෙව්වොත් මේ ප්‍රශ්න හැමදාම මෙතනමයි. එහෙම නැතුව ජන පරම්පරාවක් අරමුණු කර ගෙන ඒ ජන පරම්පරාව මෙතනින් ඉහළ තත්ත්වයකට ගෙන යන්නේ කොහොමද කියන කාරණාව පදනම් කරගෙන හරි ප්‍රතිපත්තිමය තීන්දු ගත්තොත් විතරයි මෙය වෙනස් වෙන්නේ. තාවකාලික පැලැස්තර වලින්ම මේ ප්‍රශ්න යටපත් කරන්න බැහැ.



**සාකච්ඡා කළේ:**
**මාධ්‍යවේදී**
**දර්ශාන් ප්‍රනාන්දු**

> ඔය තාක්ෂණික හේතු මත යැයි සඳහන් කරමින් අධි චෝදනා 29ක් මුදා හැරියා. ඒ එක් නඩුවක රෝහිත අබේගුණවර්ධන ඉන්නවා. එයාගේ වසර 04ක් තිස්සේ අහපු නඩුවෙන් නිදහස් කරලා යවන්නේ කොමසාරිස්වරයෙකු ගේ අත්සමක් නැහැ කියන පදනමෙන්. රනිල් වික්‍රමසිංහ දැන් ගන්න තර්කය නේද ඒ ? තාක්ෂණික කාරණාවක් පදනම්කරගෙන අපරාධකරුවෙක් නිදැල්ලේ හැසිරෙන තැනට එනවා නම්, එතකොට මේ රටේ නීතියත්, නීතියේ බලයත්, නීතියේ ආධිපත්‍යත් පිළිබඳව, රටක් විධියට විශාල ගැටළුවකට යොමුවෙනවා. ඒක හරිම කැතයි. ඒක හරිම නින්දිතයි.

## නීතිඥ සුනිල් වටගල



# රටේ නීතියත්, නීතියේ බලයත්, නීතියේ ආධිපත්‍යත් පිළිබඳව, රටක් විධියට විශාල ගැටළුවකට යොමුවෙනවා

**● පාස්කු නඩු තීන්දුවේ වත්මන් තත්ත්වය පිළිබඳව ඔබේ අදහස කුමක්ද? යම් යම් අයට නියම වී ඇති වන්දි මුදල් නොගෙවා සිටිය හැකිද?**

පාස්කු ප්‍රහාරයට අදාළ කාරණාව හරි පැහැදිලියි. එයට ව්‍යවස්ථාවෙන් නෛතිකව බැඳීමක් ඇති පුද්ගලයින් ඉහළ අධිකරණයෙන් නෛතික බැඳීමකට යටත් කළා. එයින් කියන්නේ කුමක් ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කිසියම් නීතියකින් නෛතිකව බැඳී සිටින කෙනෙක් තමන්ගේ නෛතික යුතුකම ඉටුනොකරන කොට ගෙවන්නට සිදුවන වන්දියක් තමා ඔය නියමකර තිබෙන්නේ. එය මේ රටේ දේශපාලන අධිකාරිය දැනගත යුතුයි මොකද වෙනදා ආවේ නිළධාරී තන්ත්‍රයට පමණයි. ඒක නෛතික යුතුකම කියන කාරණාව දේශපාලන තන්ත්‍රයටත් පොදුකරලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන දේශපාලනඥයෙක්. අනෙක් අය නිළධාරින්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී තිබෙන මේ බලය දේශපාලනඥයින්ටත් නිළධාරීන්ටත් එකයි. තමන්ට පැවරිලා තිබෙන නෛතික කාර්යය ඉෂ්ට කළ යුතුයි. නැතිනම් එයාට පෙරළා එන වගකීමක් තමයි මේ පවරලා තියෙන්නේ දැනට ඔවුන්ට කරන්න පුළුවන් ඒ වගකීම් හැටියට ව්‍යවස්ථාව උල්ලංඝණය කරලා තිබෙනවා. ඒ උල්ලංඝණය කිරීම සඳහා තමයි මිලියන 100, 50, 60 ගෙවන්න නියම කරලා තියෙන්නේ.

ඒ එක පැත්තක්. හැබැයි එසේ කළා කියා පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය තැනැත්තන්ට, අතපය අහිමි වෙච්ච් තැනැත්තන්ට, මුළු ජීවිත කාලයම එක්තැන්වෙලා ඉන්න සිද්ධවෙච්ච තැනැත්තන්ට සාධාරණය ඉෂ්ඨ වෙන්නෙ නැහැනේ. ඒ සාධාරණය වෙන්න නම්, මෙයට සහභාගී වෙච්ච මහ මොළකරුගේ සිට පහළ දක්වා ක්‍රියාත්මක වෙච්ච විධියේ අපරාධමය වැරැද්දක් තවම පැවරිලා නැහැ, මේ චූදිතයින්ට. ඔවුන් තවම නිදැල්ලේ හැසිරෙනවා. ඔවුනට හිමි දඬුවමක් ගැන අධිකරණයෙන් පැවරිලා නැහැ. ඒ නිසා අපි කියනවා මේක නීතීපති දෙපාර්තමේන්තුව මූලිකව ගන්න ඕනේ. මොකද, මේවාට පැවරෙන්නේ අධි චෝදනා. අධි චෝදනා හදන්න ඕනේ නීතිපති දෙපාර්තමේන්තුවෙන්. ඒ නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් එතැන බරපතල සැකයක් තියෙනවා.

අපි දන්නවා පහුගිය කාලේ ඊට අදාළ කටයුතු කරපු දේශපාලන චරිත කෙසේද නීතිපති දෙපාර්තමේන්තුවෙන් මුදාහැරියේ, ඇප පිළිබඳව කථාකරන විට වත්මන් අධිකරණ ඇමතිවරයා ක්‍රියා කළේ කෙසේද යනාදි වශයෙන් කථා කිහිපයක් ම තිබෙනවා. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ කථාවත් එතැන ෂේප් වෙලා තිබෙනවා. ඒ නිසා අපි කියන්නේ මෙවැනි නීතිපති දෙපාර්තමේන්තු තියෙනතුරු, අපරාධමය වරද කියන එක සනිටුහන් වීමට අදාළ කාරණා ටිකක් දුරයි. හැබැයි අපි ඔබට එකක් කියනවා, නියමිත ජනතාවාදී ආණ්ඩුවකින් අංක 1ට මෙයට අතගැසිය යුතුයි. මොකද පෞද්ගලිකව ඔබෙත් මගෙත් දේපොලක ප්‍රශ්නයක් නෙවෙයි, මිනිස් ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය සැලකිය යුතු බරකින් අතගසලා ක්‍රියාත්මක කළ යුතුයි. මොකද, ආණ්ඩුව පාර්ශවයෙන් මේ දේ කරන්නේ නැහැ, එයාලගේ අභිලාෂය ඉෂ්ටකරගන්නා විට. මෙය ඉටුකරගන්න නම්, රටේ ජනතාවට අවශ්‍ය ජනතාවාදී පාලනයක් ගේන්න ඕනෙ. ඒ පාලනය ගෙනෙන විට, එක්කෝ මෙහි වග උත්තරකරු සිය දිවි හානිකර ගන්න ඕනෙ, නැතිනම් රට අතහැරලා යන්න ඕනේ. ඊට අදාළ දැලක් තමයි අපි ඊට කලින් එළාගන්න ඕනේ. අපරාධමය වරදට තාම කිසිවක් සිදුවී නැහැ, ඒ කාරණාව ඉතා තදින් සාකච්ඡා කළ යුතු ආකාරයෙන් අප ඉදිරියේ තිබෙනවා.

**● තාක්ෂණීක හේතු මත යැයි පෙන්වා දෙමින් පසුගිය කාලය තුළ දී ඉතාම වැදගත් නඩු කිහිපයක් ම ඉවත් වුණා. නමුත් බැරිද මේවා යළි සකස්කර ඉදිරියට ගන්න?**

ඔව් ඔබ කියන්නේ ඔය තාක්ෂණික හේතු

මත යැයි සඳහන් කරමින් අධි චෝදනා 29ක් මුදා හැරියා. ඒ එක් නඩුවක රෝහිත අබේගුණවර්ධන ඉන්නවා. එයාගේ වසර 04ක් තිස්සේ අහපු නඩුවෙන් නිදහස් කරලා යවන්නේ කොමසාරිස්වරයෙකු ගේ අත්සනක් නැහැ කියන පදනමෙන්. රනිල් වික්‍රමසිංහ දැන් ගන්න තර්කය නේද ඒ? තාක්ෂණික කාරණාවක් පදනම්කරගෙන අපරාධකරුවෙක් නිදැල්ලේ හැසිරෙන තැනට එනවා නම්, එතකොට මේ රටේ නීතියත්, නීතියේ බලයත්, නීතියේ ආධිපත්‍යත් පිළිබඳව, රටක් විධියට විශාල ගැටළුවකට යොමුවෙනවා. ඒක හරිම කැතයි. ඒක හරිම නින්දිතයි. ඒ නිසා මේ අධි චෝදනා පත්‍රවලින් නිදහස් වෙච්ච වූදිතයෝ අපිට දැන් ඉජු ඉජු ගානවා. කෝ උඹලා අපිව ඇල්ලුවාද කියලා අපිට උජෝ උජෝ කියනවා. ඒකට ඉතිං අපිට කියන්න තියෙන්නේ ඇත්තවශයෙන් ම හොරෙක් තව හොරෙක්ව අල්ලන්නේ නැහැ කියලා අනුර දිසානායක සහෝදරයා හැමවිට ම කියන දෙයක්. ඉතිං ඒ තියරිය එදත් වලංගුයි, අදත් වලංගුයි, හෙටත් වලංගුයි.

හෙට එන්නේ ජනතාවාදී ආණ්ඩුවක් නෙවෙයි නම්, මේ ප්‍රශ්නෙට අතගසන්නේ ම නැහැ. අපි පැහැදිලිවම කියනවා අපරාධමය වරද 'කාලාවරුදය' වෙන්නේ නැහැ. අඩුම වශයෙන් අවුරුදු 20ක් එහාට යනවා. තවම මේවාට වසර 20ක් වෙලා නැහැ. මේ අපරාධමය වැරැද්ද, ජාතික ජනබලවේගයේ ආණ්ඩුවක් ආවොත් පැහැදිලිව ම පාස්කු ප්‍රහාරයත්, මේ අධි චෝදනා පත්‍රවලින් තාක්ෂණික කරුණු මත ගැලවිලා යන මිනිස්සුන්වත් පැහැදිලිව ම නීතියේ රැහැනට හසුකරනවා. හරියට ක්‍රියාත්මක කරනවා නම්, මේ රටේ තියෙන නීතී හොඳටම ප්‍රමාණවත්.

**මේ රටේ සුප්‍රසිද්ධ මතද්‍රව්‍ය ජාවාරම්කරුවන් නිදැල්ලේ ඉන්නවා. ඒ වගේම මෑත කාලයේ දී මත්ද්‍රව්‍ය ජාවාරමේ ඉහළ ම පුද්ගලයෙකු වන ඉතාම සුප්‍රසිද්ධ කන්ජිපානි නීතියෙන් ගැලවිලා රටිනුත් පැනගොස් වෙනත් රටක ජීවත්වෙනවා. ඔවුනට එවැනි පසුබිමක් සැකසී තිබිය දී, රටේ නොයෙකුත් අර්බුද නිසා නිර්මාණය වෙච්ච අරගලයේ තරුණ තරුණියන් පිටුපස ඇතැම් විට නීතියත් ආරක්ෂක අංශත් හඹාගෙන යනවා. මේ තත්ත්වය ඔබ දකින්නේ කෙසේද?**

**ඔබ දුටුවා ද? ලොකුම කුඩු මුදලාලි පළාත් සභා මන්ත්‍රී කාලේ අල්ලන්න එනකොට, මේ රටේ විධායක ජනාධිපතිතුමා ක්‍රියාත්මක වුණේ කෙසේද කියලා? මහින්ද රාජපක්ෂ හෙලිකොප්ටර් එකකින් ගිහිල්ලා නාකොටික් නිළධාරීන්ට එල්ල කළ තර්ජනය? අවට ඉන්න දේශපාලනඥයින් සියලුම දෙනාව ඒ ස්ථානයට ගෙන්වා ගත්තා. තමන්ගේ සපෝර්ටර්ස්ලාව ගෙන්වා ගෙන, නාර්කොටික් නිළධාරීන්ව එළවා ගත්තා.**




**“ කියන්න කණගාටුයි මේ රට හසුරුවන්නේ කුඩු සල්ලි. නැතිනම්, සාමාන්‍ය පළාත් සභා මන්ත්‍රීවරයෙක් කොහොමද තරු පහේ හෝටල් 05ක අයිතිකරුවෙක් වෙන්නේ? එයා කොහොමද වාහන ගණනාවක් භාවිතා කරන්නේ? කොහොමද එයාගේ වත්කම් වැඩි වෙන්නේ? මමත් හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙක්. අපි ගන්න වැටුප අපි දීලා තියෙන්නේ. නමුත්, වැඩිම වුනොත් රුපියල් ලක්ෂයක් ලැබෙයි. මේ ලක්ෂය වැඩිකළොත් 12 න් ලැබෙන්නේ ලක්ෂ 12යි. ඒ ගාන පහෙන් වැඩි කළාම ලැබෙන්නේ ලක්ෂ 60යි. මේ ගානෙන් පුළුවන් ද මිනිහා පදින බී.එම්.ඩබ්ලිව් වාහනයක්වත් ගන්න? බැහැ.... නමුත් තරු පහේ හෝටල් 05ක් නිර්මාණය කරන තැනට ආවේ ඔහු පිටුපස තනිකර තිබෙන්නේ කුඩු ව්‍යාපාරය. ඒ කුඩු ව්‍යාපාරය පිටුපස්සේ ඉන්නේ මහින්ද රාජපක්ෂ ඇතුළු කල්ලිය. ඒක හරිම පැහැදිලියි. ඒ නිසා මේ අධම ව්‍යාපාර පිටුපස දේශපාලනඥයින් සිටින තුරු මෙය වළකරන්න හෝ අහෝසි කරන්න බැහැ. මේ රටේ වටිනා තරුණ ජීවිත මත්ද්‍රව්‍යවලින් වෙලාගෙන විනාශකර තිබීම ගැන සම්පූර් ණයෙන් ම මෙරට ඉහළ දේශපාලන අධිකාරිය වගකිව යුතුයි.**

ඔබ විශ්වාස කරනවාද රටේ පළමු පුරවැසියා එහෙම හැසිරෙන කොට පහළ මිනිස්සු කුඩු අල්ලයි කියලා? දැන් මෙහේ සිදුවෙන්නේ නාට්‍යය. ඔබ විස්තර කළේ එක ඩ්‍රාමා එකක්. ඕවා ඇවිල්ලා මිනිස්සුන්ට පෙන්වන එක එක ඩ්‍රාමාස්. එක් එක් ටෙලි නාට්‍යයවල කොටස්. ඒ නිසා අරගලයේ හිටියේ කුඩ්ඩොයි කියලා තහවුරු කරන්න දේශපාලන ව්‍යාපෘති ඉදිරිපත් කරනවා. මෛත්‍රිපාලව මරන්න ඉන්නවා කියලා මිනිහෙක් එවලා ඩ්‍රාමා එකක් කළා, කොහේදෝ ඉන්න අධ්‍යක්ෂ ජෙනරාල් කෙනෙක් කියලා අමුතු නමක් හදාගෙන, ඒකෙන් නිවුස් හදලා ප්‍රචාරය කරලා අන්තිමේදී ඔහු අම්පාරෙන් පොහොට්ටුවෙන් ඡන්දෙ ඉල්ලුවා. ඔන්න ඔහොමයි ඒ ඩ්‍රාමා එක කෙළවර වෙච්ච විධිය.

මාධ්‍ය ආයතනවලත් තියෙනවා අමුතු විධියේ වැඩ. මතකයි නේද අම්පාරේ පිටි ගුලිය, නිකර් එක, ඊට පස්සේ වඳ කොත්තු වලින් ඇවිත් නයාගෙන් කෙළවර වෙච්ච විධිය. මේ සියල්ල පිටුපස්සේ හිටියේ මාධ්‍ය ආයාතන. මාධ්‍ය ආයතනවලට බැරි දෙයක් නැහැ. ඒ අය තමයි මේ වැඩවල සැබෑ නිර්මාණ කරුවෝ වෙන්නේ. ඒ අයගේ ජවනිකාවලට විවිධ නළුවෝ රඟනවා.

ඒ නිසා මත්ද්‍රව්‍යත් ඩ්‍රාමා එකක්. අර අහිංසක පාසැල් දරුවන්ගේ බෑග්ස් චෙක් කරනවා කට්ටිය දාලා. මම අහන්නේ ගුවනයි, මුහුදයි මේ අයට පාලනය කරන්න බැරි ද? පාලනය කරන්නේ නැහැ. මොකද මේකේ ඇත්ත මෙහෙයුම්කරුවෝ ඉන්නේ දියවන්නාවේ. ඒ වගේම විදුලි බලයට අයත් සැබෑ මාෆියාකාරයෝ ටික ඉන්නෙත් දියවන්නාවේ. විදුලිබල ඇමති ඩලස් අලහප්පෙරුම ඒ දවස්වල මේ ගැන කිව්වා මතකද? ඒ වගේම තමයි කුඩුවලට ඔස්තාර් මොළ තියෙන ඒවා මෙහෙයවන කට්ටිය ඉන්නේ දියවන්නාවේ. ඒ නිසා දියවන්නාව වටලන්නේ නැතිව වෙන කොහේ වැටලුවත් වැඩක් නැහැ. කන්ජිපානි නෙවෙයි වෙන කවුරු පස්සේ පැන්නුවත් වැඩක් නැහැ මොකද කන්ජිපානිලා වගේම ඊට වඩා ලොකු අයත් යැපෙන්නේ දියවන්නාවේ ඉන්න ඉහළ දේශපාලනඥයෝ මත.

කියන්න කණගාටුයි මේ රට හසුරුවන්නේ කුඩු සල්ලි. නැතිනම්, සාමාන්‍ය පළාත් සභා මන්ත්‍රීවරයෙක් කොහොමද තරු පහේ හෝටල් 05ක අයිතිකරුවෙක් වෙන්නේ? එයා කොහොමද වාහන ගණනාවක් භාවිතා කරන්නේ? කොහොමද එයාගේ වත්කම් වැඩි වෙන්නේ? මමත් හිටපු පළාත් සභා




**උපයන විට අයකරගනු ලබන බද්ද තමයි දැන් කරළියට ඇත්ත තමයි, බදු අයකරන්නේ නැතිව රටක් ගෙනියන්න බැහැ. නමුත් අපි කියන්නේ මිනිස්සුන්ට රිදෙන්නේ නැති, සාධාරණ බද්ධක් අයකර ගැනීම ලෝකේ ඕනෑම රටක පොදු ප්‍රතිපත්තියක්. බදුවලින් නේ පොදු ජනතාවට සහන සළසන්නේ. මෙතන තිබෙන ප්‍රශනය තමයි 75 වසරකට පස්සේ රට බංකොලොත් කළා. කොච්චර රට බංකොලොත් ද කියනවානම් ඔබත් මමත් ලක්‍ෂ 12ක් දැන් රටට ණයයි. ඒ වගේම ලෝකෙට අපි කිව්වානේ උජාරුවට අපි ණය ගෙවන්නේ නැහැ කියලා. ඒකෙන් කිව්වේත් අපි බංකොලොත් කියල තමයි. වසර 75කට පස්සේ ශේෂ පත්‍රයේ තියෙන්නේ ශ්‍රී ලංකාව බංකොලොත් රටක් හැටියට. එතකොට මේ බංකොලොත් වෙච්ච රට ඉදිරියට ගෙනියන්න එයාලා ගෙනාවේ IMF කියන සටන් පාඨය. නමුත් IMF මුදල් අච්චු ගහන්න එපා. හැබැයි මල නොතලා රොන් ගන්නවා වෙනුවට මල තලලාම රොන් ගන්න සිදුවෙනවා නැතිනම් උඹලාට මේ වැඩේ කරගන්න බැරිවෙනවා කියලා රෙගුලාසි දමා තිබෙනවා.**

මන්ත්‍රීවරයෙක්. අපි ගන්න වැටුප අපි දීලා තියෙන්නේ. නමුත්, වැඩිම වුනොත් රුපියල් ලක්‍ෂයක් ලැබෙයි. මේ ලක්‍ෂය වැඩිකළොත් 12 න් ලැබෙන්නේ ලක්‍ෂ 12යි. ඒ ගාන පහෙන් වැඩි කළාම ලැබෙන්නේ ලක්‍ෂ 60යි. මේ ගානෙන් පුළුවන් ද මිනිහා පදින බී.එම්.ඩබ්ලිව් වාහනයක්වත් ගන්න? බැහැ.... නමුත් තරු පහේ හෝටල් 05ක් නිර්මාණය කරන තැනට ආවේ ඔහු පිටුපස තනිකර තිබෙන්නේ කුඩු ව්‍යාපාරය. ඒ කුඩු ව්‍යාපාරය පිටුපස්සේ ඉන්නේ මහින්ද රාජපක්‍ෂ ඇතුළු කල්ලිය. ඒක හරිම පැහැදිලියි. ඒ නිසා මේ අධම ව්‍යාපාර පිටුපස දේශපාලනඥයින් සිටින තුරු මෙය වඳකරන්න හෝ අහෝසි කරන්න බැහැ. මේ රටේ වටිනා තරුණ ජීවිත මත්ද්‍රව්‍යවලින් වෙලාගෙන විනාශකර තිබීම ගැන සම්පූර්ණයෙන් ම මෙරට ඉහළ දේශපාලන අධිකාරිය වගකිව යුතුයි.

අපි අවධානය යොමුකළොත් අධික ලෙස පනවා තිබෙන මෙරට බදු ගැසීම ගැන! වෙනත් රටවල අයකර ගන්නා බදු ප්‍රමාණයට සරිලන්නට පුරවැසියන්ට සැළකිලි / ලැබීම් පවතිනවා. නමුත් ශ්‍රී ලංකාවේ තත්ත්වය ඊට හාත්පස වෙනස්.

උපයන විට අයකරගනු ලබන බද්ධ තමයි දැන් කරළියට ඇත්ත තමයි, බදු අයකරන්නේ නැතිව රටක් ගෙනියන්න බැහැ. නමුත් අපි කියන්නේ මිනිස්සුන්ට රිදෙන්නේ නැති, සාධාරණ බද්ධක් අයකර ගැනීම ලෝකේ ඕනෑම රටක පොදු ප්‍රතිපත්තියක්. බදුවලින් නේ පොදු ජනතාවට සහන සළසන්නේ. මෙතන තිබෙන ප්‍රශනය තමයි 75 වසරකට පස්සේ රට බංකොලොත් කළා. කොච්චර රට බංකොලොත් ද කියනවානම් ඔබත් මමත් ලක්‍ෂ 12ක් දැන් රටට ණයයි. ඒ වගේම ලෝකෙට අපි කිව්වානේ උජාරුවට අපි ණය ගෙවන්නේ නැහැ කියලා. ඒකෙන් කිව්වේත් අපි බංකොලොත් කියල තමයි. වසර 75කට පස්සේ ශේෂ පත්‍රයේ තියෙන්නේ ශ්‍රී ලංකාව බංකොලොත් රටක් හැටියට. එතකොට මේ බංකොලොත් වෙච්ච රට ඉදිරියට ගෙනියන්න එයාලා ගෙනාවේ IMF කියන සටන් පාඨය. නමුත් IMF මුදල් අච්චු ගහන්න එපා. හැබැයි මල නොතලා රොන් ගන්නවා වෙනුවට මල තලලාම රොන් ගන්න සිදුවෙනවා නැතිනම් උඹලාට මේ වැඩේ කරගන්න බැරිවෙනවා කියලා රෙගුලාසි දමා තිබෙනවා. ඒ අනුව රජයේ සේවකයාගෙත්, පෞද්ගලික අංශයේ සේවකයාගෙත් බෙල්ලෙන් ම ඇල්ලුවා. වෘත්තීයවේදීන්ගෙත් සාමාන්‍ය මිනිහාගෙත් දැන් ලැබෙන පඩිය දන්නවා නේ. ඒ වැටුපත් හරියට කිව්වොත් ෆික්ස්ඩ් වෙලා තියෙන්නෙ, ලීසිං එකට මෙච්චරයි, නිවාස ණයට මෙච්චරයි, ළමයාගේ ස්කෝලෙ කටයුතුවලට මෙච්චරයි, මගුල් තුලාවක් ආවොත් මෙන්න ඒකට මෙච්චරයි කියලා අතට ලැබෙන සොච්චම බෙදා වෙන්කරලා ඉවරයි. ප්‍රමාණවත් නැති වුණත් පිරිමහගෙන ජීවත්වෙන්න පටන් ගත්තා.  පටන් ගත්තා විතරයි මල තලන කට්ටිය කළේ ඕක හරියන්නේ නැහැ කියලා IMF කන්ඩිෂන් එකක් තියෙනවා, ඒ කන්ඩිෂන් එක සාර්ථක කරගන්න නම් මල තලන්නම වෙනවා කියලා රජයේ සේවකයාටත් පෞද්ගලික අංශයේ සේවකයාටත් අත තිබ්බා. දැන් සොච්චමක් අතට ලබෙන කොට තනිකර ලීසිං එක එරියස්, නිවාස ණය එරියස්, දරුවට පාසැල් බෑග් එක, සපත්තු දෙක අරං දෙන්න විධියක් නැහැ. මගුල් තුලාවක් නම් සොරි ම තමයි. වෙනසකට දරුවොත් එක්ක එළියට ගිහිං නිදහසේ ඉඳලා කෑමවේලක් කෑව නම් ඒකත් ඉවරයි.

මේවායේ ප්‍රතිඵල විධියට තමයි බුද්ධි ගලනය ආරම්භ වෙන්නේ. මේක ඉන්න හිතෙන රටක් නොවෙන බවට තේරුම් යනවා. ඒ නිසා මේ රටේ වෘත්තීයවේදියා, විශේෂඥයා ඉක්මන් වෙනවා මෙතනින් එහා රටකට පැනගෙන තමන්ගේ බුද්ධිය විකුණාගෙන ජීවත් වෙන්න. ඒ නිසා හැම පැත්තකින් ම අවාසි කොන්දේසියක් මේ බදු වැඩිකිරීම හරහා කරගෙන තිබෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, මේක නම් ඔයගොල්ලන්ගේ ක්‍රමය, වරාය, විදුලිය, තෙල් සමස්ත වැඩ වර්ජන විධියට පියවරෙන් පියවර ඉදිරියට එනවා. වෛද්‍ය ක්ෂේත්‍රයත් සැළකිය යුතු දායකත්වයක් ලබාදී තිබෙනවා. නමුත් දැන් තෙල් පෝලිං නැහැ. ගෑස් පෝලිං නැහැ කියා වහසි බස් දොඩමින් මෙයාලා කොහොමහරි ඉස්සරහට දුවන්න බලනවා, නමුත් අපි දන්නවා මේ ආණ්ඩුවට දුවන්න බැහැ.

මේ එන අපනයන ආදායමෙන් සංචාරක ආදායමෙන් නැවට ගිහිං තෙල් ටිකක් අරං ඇවිත් බෙදයි. එච්චරයි. අපි ණය ගෙවන්නේ නැහැ. ඔයා යම්කිසිදාක මගෙන් ණය ඉල්ලපුදාට මං මොකද කරන්නේ? අපේ ගෙයි බඩු ටික ෆිස්කල් ඇවිත් වෙන්දේසි කරාවි.  ඒ වගේ අපේ රටටත්, ආර්ථික සම්භාධක එනවා, ඒදාට අපට මේ ලබ්බට වෙලා, ඉන්න ලැබෙන්නෙත් නැහැනේ. ඒ හැර අපට විකල්ප ගන්න බැරිවෙනවා. ඉතිං ඒ ගැන හිතලා අපි විශ්වාස කරනවා පාලකයෝ මීට වඩා හොඳ, දියුණු තීන්දුවක් ඉදිරි කාලයේදී ගනිවි කියලා මොකද, මහජනතාවත් දැන් ඔය ජාතිවාදය, ආගම් භේදය, වඳ කොත්තු, වඳ බ්‍රේෂියර් කියන ඒවා තැකීමකින් තොරව තමයි කියන්නේ කවුරු කවුරු මොනවා කීවත් අපි කොන්දේසි විරහිතව මෙවර මාළිමාවට ඡන්දය දෙනවා වෙනසක් ඇතිකිරීම පිණිස. ඒ වෙනස අපි සහතික කරලා කියනවා ඔබ, වෘත්තීයවේදියා ද ගොවියා ද කම්කරුවා ද භේදයකින් තොරව, ඔබ

විශ්වාසය තබන්න අපි ඔබ වෙනුවෙන් අදාළ යුතුකම ඉටුකරන බවට සහතික වෙනවා.

**● අවසන් වශයෙන්, ජනතාවගේ මනාපයෙන් නොව, අරගලයේ පිහිටෙන් බලයට පත්වුණු වර්තමානයේදී හිතුවක්කාර පාලන ක්‍රමයක් ගෙනයන රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සම්බන්ධයෙන් අදහසක් ප්‍රකාශ කළොත්?**

රනිල් කියන්නේ නගින ඉණිමඟට පයින් ගහන මිනිහෙක්. ඔබ කීවා හරි අරගලයක් බිහි නොවෙන්න මිනිහා ජනාධිපති වෙන්නේ නැහැ. අරගලය ආරක්ෂා කරනවා කියපු මිනිහා හැරෙන තැපෑලෙන් අරගලයට ගහලා සුන්නත්දූලි කෙරුවා. ඒ විතරක් නෙවෙයි දැන් ප්‍රජාතන්ත්‍රවාදි සටනක් කරන්න දෙන්නේ නැති තැනට තමන්ගේ හමුදාවයි සහ පොලීසියි මෙහෙයවනවා. ඒ රනිල්ගෙ හැටි. ඒ රනිල්ගේ හැටි බලන තව සිද්ධියක් තමයි නීල් හපුහින්නගේ සිද්ධිය. නීල් හපුහින්නට වැඩේ පවරලා වැඩේ කරගන්න බැරි වුණාම මිනිහව පාවලා දුන්නා.

ඊට පස්සේ සමගි ජන බලවේගයේ කට්ටිය කිව්වා ඡන්දේ තියන්න එපා සර් අරවා මේවා කියපුවා ම රනිල් කළේ පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කළා ඔයගොල්ලොත් කිව්වනේ මට ඡන්දේ කල්දාන්න කියලා. ඒ රනිල්ගෙ හැටි. රනිල් එක්ක ගනුදෙනු කරනකොට ඔවැනි ප්‍රතිඵල බලාපොරොත්තු වෙන්න ඕනේ. එයා හරියට කයිය ගහනවානේ, බලාගමු, මම අර වෙනත් අය වගේ නෙවෙයි. හිටපු ජනාධිපතිවරයා ගම සමඟ පිළිසඳර වැඩසටහනටකට ගිහිං කිව්වා මගේ වචන තමයි චක්‍රලේඛණ කියලා. බලන්න මොන තරම් ප්‍රබලයෙක්ද? චක්‍රලේඛණයක් ගහන්නේ ගැසට් එකක් කියන්නේ හරියට ම තීන්දු ගන්න දෙයක්. හිටපු ජනාධිපති කිව්වේ මම රටේ ජනාධිපති මගේ වචන තමයි චක්‍රලේඛණ. එසේ කියනකොට එයාට 20 වෙනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත වෙලා ඕනදෙයක් කරන්න පුලුවන්කම තිබුණා. ගුවන් හමුදාව, නාවික හමුදාව, පොලීසිය සියල්ල එයාගේ පැත්තට හිටියා. පාර්ලිමේන්තුවෙ ඕනෑම වෙලාවක කැඳවන්න පුලුවන් තුනෙන් දෙකක් තිබුණා. හැබැයි, මහජන අරගලය එනකොට ගියේ ගෙයි පිටිපස්සෙන් නාවික බෝට්ටුවකට නැගලා නාවික කඳවුරේ ආරක්ෂාව ඇතුව. එතැනින් මාලදිවයින්ටත්, එතැනින් ඩුබායිවලටත්, ඒ වගේ රටවල් ගණනාවකට ගිහිං තමයි හිටපු ජනාධිපති නැවතුණේ.

එතකොට මෙයා කවුද? මෙයා ඇවිත් ජන + අධිපති නෙවෙයි, මෙයා මන්ත්‍රී අධිපති. 134ක පිහිටෙන් ඉන්න මිනිහෙක්. ඒ මිනිහට මොකක්ද තියෙන භයිය? මිනිහට ඇති භයියක් නැහැ. හිට්ලර් කියනකොට දෙපාරක් කලිසම බිම වැටෙනවා. තමන් හිට්ලර් කියලා කියනකොට බැරිවෙලාවත් හිට්ලර් හිටියනම් කොහොමද? ඒ පුස් පාට්වලට මහජනතාවගේ බලයට අභියෝග කරන්න බැහැ. ඒ නිසා අපි ඔහුට කියනවා මහජනතාවගේ බලය හමුවේ ඔබට යන එන මං නැතිවෙනවා කියා. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ අර කකුළුවා වගේ තව ටිකක් පීනන්න. හැබැයි ජනතාව ඔබ කරා ඉතා වේගයෙන් පැමිණෙනවා. හැබැයි, ඒ පැමිණෙන විට අපි දන්නේ නැහැ ඊට අදාළ ප්‍රතිපලය කුමක් වේවි ද කියලා? ඔබට ඔය සිංහාසනය දාලා යන්න වෙනවා කියන යථාර්තය තේරුම්ගන්න කියලා අපි ඔහුට කියනවා.



සංවාද සටහන හා ඡායාරූප :
**මෙලනි මානෙල් පෙරේරා**

## වන්දි මුදල් ලබාගැනීම සඳහා වන......

›› 02 පිටුවෙන්..

ශ්‍රී ලංකා මුහුදු තීරයට සිදුවන යම් හානියක් සම්බන්ධයෙන් වැරදිකරුවන් වන පුද්ගලයන්ට හෝ සමාගම්වලට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් රජයට ඇති අතර, එම පනතේ 50 වගන්ති අනුව නීතිපතිවරයාට හෝ නීතිපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් අයෙකුට හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ඇත.

### X-press pearl ඩොලර් බිලියන 6.4 ක වන්දිය යට යයිද..?


ශ්‍රී ලංකා මුහුදු තීරයේ සිදුවූ මෙම විනාශය සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සිංගප්පූරුවට යෑම අනවශ්‍ය මෙන්ම අවාසිදායක කාර්යභාරයක් වන අතර, රජය විසින් එලෙස යෑමට තීරණය කරන්නේ ඇයිද යන්න සැක උපදවන්නකි. මෙම සිද්ධියට අදාළව යම් දේශපාලන පාර්ශ්වයක් විසින් මුදල් යටි මඩි ගසාගෙන, මෙම අධිකරණ ක්‍රියාමාර්ගය නිදැල්ලේ යෑමට ඉඩහැර, රටට හිමිවිය යුතු වන්දි මුදල අහිමි කිරීමට සැරසෙන බවට මේ අනුව අපට සැකයක් ඇත. එම නිසා තවත් බොහොම කෙටි කාලයක් තුළ අදාළ සමාගමට එරෙහි අධිකරණ ක්‍රියාමාර්ගය මෙරට තුළ දී ගත යුතු අතර, ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු හා කරුණු රැස් කිරීම් කර අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා අවශ්‍ය සියලු වාර්තා සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය, වරාය හා නාවික අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් සැපයිය යුතුය.

එක්සත් ජාතීන්ගේ සමුද්‍ර දූෂණ වැළැක්වීමේ එකඟතාවට අනුව United Nations Convention on the Law of the Sea (UNCLOS) සියලුම රටවල් තම අයිති සාගර කලාප ආරක්ෂා කිරීම සඳහා බැඳී සිටී. ඒ අනුව සිංගප්පූරු රාජ්‍ය සහ මෙම සමුද්‍ර දූෂණයට මුල් වූ සමාගම මෙහි වග කීම භාරගත යුතු අතර, ශ්‍රී ලංකාවේ මුහුදු තීරය හා වෙරළ තීරය එසේ නොමැති නම් සමුද්‍ර පරිසරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කටයුතු කළ යුතුය. International Maritime Organization (IMO) Conventions සංවිධානය ජාත්‍යන්තර නාවික කටයුතු සම්බන්ධ විශේෂ සංවිධානයක් වන අතර, ඔවුන් විසින් සමුද්‍ර දූෂණ වැළැක්වීම උදෙසා විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. එක්ස්ප්‍රස් පර්ල් නැව් අනතුර මගින් ශ්‍රී ලංකාවට සිදු වූ සමුද්‍ර දූෂණය සම්බන්ධව මෙම ආයතනයෙන් රටක් ලෙස අපට යම්කිසි මැදිහත් වීමක් ලබා ගත හැකි වේ. ඒ සඳහා රජය ඔවුන් දැනුවත් කළ යුතු අතර, ඒ සඳහා රජය විසින් උදව් ඉල්ලා සිටිය යුතුය.

ශ්‍රී ලංකාව ලෙස අප ජාත්‍යන්තර ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ එකඟතාව නොහොත් Convention on Biological Diversity (CBD) එකඟ වී ඇති අතර සමුද්‍ර ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම උදෙසා සිදුවී ඇති හානිය සම්බන්ධව CBD මැදිහත් කරගත හැකිය. X-press pearl නෞකාව ගිනිගැනීම නිසා සමුද්‍ර පරිසරයට සිදු වූ හානිය සම්බන්ධව එම ආයතනය මැදිහත් කර ගනිමින්, යම් වාර්තාවක් ලබාගතහොත් අධිකරණ ක්‍රියාමාර්ග ජයග්‍රහණය කිරීම සඳහා එය ද වාසියක් වනු ඇත. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් X-press pearl ගිනි ගැනීම නිසා ලංකාවේ සමුද්‍ර පරිසර පද්ධතියට සිදුවූ හානියට යම්කිසි ආකාරයේ සාධාරණයක් ඉටුකර ගැනීමට අපට අවස්ථා ගණනාවක් ඇති අතර, යම් හෙයකින් එය මඟහැරී ගියහොත් එය එසේ සිදු වන්නේ ජාතික හෝ ජාත්‍යන්තර නීතියේ අඩුපාඩුවක් නිසා නොව, මේ සඳහා මැදිහත් වන දේශපාලඥයන් විසින් හා නිලධාරීන් විසින් මෙම සිද්ධිය යටට ගසා පෞද්ගලිකව මුදල් ලබාගැනීම වැනි ක්‍රියාවක් හේතුවෙන් ය.

> අපි සමාජ මාධ්‍යයක, රූපවාහිනී මාධ්‍ය හරහා පත්‍රිකාවක් හරහා, පෝස්ටරයක් හරහා රජයට එරෙහිව කතා කළොත් විශේෂයෙන්ම මේ පවතින ආර්ථික අර්බුදය හරහා, ජනතාවගේ තිබෙන ප්‍රශ්න පිළිබඳව අපි කතා කළොත් ඒ පිළිබඳව අර්ථකථනයක් දීලා මේක ත්‍රස්තවාදය හැටියට, රට අකර්මණ්‍ය කිරීමේ ක්‍රියාවලියක් හැටියට මෙය හඳුන්වලා දීලා, අපිව රඳවා තබා ගැනීමට නියෝග නිකුත් කරලා, රඳවා තබාගන්න පුළුවන්. ඒ වගේම මේකෙන් පෙන්වන්න යන දේ තමා, රජයට එරෙහිව මතුවන විරෝධතාවයන්, ජනතාව ගන්නා ක්‍රියාමාර්ගයන්ට එරෙහිව රාජ්‍ය ආයතන, ආරක්ෂක අංශ පෙළගැස්වීම හරහා කරන්න යන උත්සාහයක් හැටියට තමා මේක අපට දකින්නට ලැබෙන්නේ. ප්‍රතිත්‍රස්ත පනත විශාල වශයෙන් ජනතාවගේ හඬ, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මර්දනය කරන්නට ගන්නාවූ ක්‍රියාමාර්ගයක් හැටියට අපිට පෙන්වන්න පුළුවන්.

## හර්මන් කුමාර
### ධීවර සහයෝගිතා ව්‍යාපාරයේ කැඳවුම්කරු



# ප්‍රතිත්‍රස්ත පනත ජනතාවගේ හඬ වගේම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියත් මර්දනය කරන එකක්

**● ආණ්ඩුව උත්සාහ ගන්නවා මානව හිමිකම් උල්ලංඝණය වන පරිද්දෙන් 1979 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ප්‍රති ත්‍රස්ත පනතක් ගෙන ඒමට. මේ තුළින් ඇතිවිය හැකි තත්ත්වයන් කවරේද?**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත 1979 ගෙන එනකොට එය තාවකාලික පනතක් හැටියට මාස 06කට ගෙනාවේ. මේ අවි අතට ගත් ත්‍රස්තවාදීන් වැළැක්වීම සඳහා ඒ ක්‍රියාවලිය නැවැත්වීම සඳහා තමා මේ ත්‍රස්තවාදී පනත ගේන්නේ, මේක තාවකාලික පනතක් කියලා ප්‍රකාශ වුණා. නමුත් අද වෙනකොට මේ පනතට අවුරුදු 44ක් පමණ වෙනවා. ඒ පනත ඒ ආකාරයෙන්ම තාමත් ක්‍රියාත්මක වෙනවා. එතකොට මේ පනතේ ත්‍රස්තවාදියා කියන්නේ කවුද කියලා පැහැදිලිව අර්ථකථනය කරලා තියෙනවා. අවි ආයුධ අතට අරගෙන රාජ්‍ය විරෝධීව කටයුතු කරන, කඩාකප්පල්කාරීව කටයුතු කරන පුද්ගලයා ත්‍රස්තවාදියා හැටියට අර්ථකථනය කරලා තියෙනවා.

නමුත් මේ අළුතෙන් ගේන ප්‍රති ත්‍රස්ත පනත යටතේ එවැනි අර්ථකථනයකට වඩා පුළුල් අර්ථකතනයකට ගිහිල්ලා, ත්‍රස්තවාදියා එහෙම නැතිනම් ත්‍රස්තවාදය කියන කාරණය විග්‍රහ කිරීම ඉතාම පුළුල් පරාසයකට ගෙන ඒම හරහා ඉතාම භයානක තැනකට ගෙන යනවා. අවි ආයුධ අරගෙන විනාශ කිරීම, රටට හානි කිරීම වගේ නෙමේ, මේ කරන්න උත්සාහ ගන්නේ ඊට වඩා වෙනස් ආකාරයකට ක්‍රියා මාර්ගයකට යමින් රටේ ජනතාවට මේ සමස්ත ආර්ථික ක්‍රියාවලිය හරහා මතුවන පීඩනය තුළ ජනතාව නැගී සිටිනවා නම්, අපි කියමු වෙරළාසන්න තීරයේ ජීවත්වෙන ජනතාව, උතුරේ ජනතාව ජීවත්වන ඒ භූමිය අහිමි කරන තැනකට ගේන්න යනවා නම් ඒ අහිමි කිරීමට විරුද්ධව යම් ආකාරයකට ක්‍රියාමාර්ගයක් ගන්නවා කියන එක පවා ත්‍රස්තවාදය හැටියට අර්ථකථනය කරලා ඒ ක්‍රියාවලියට මැදිහත්වන පුද්ගලයින්ව අත්අඩංගුවට ගැනීමේ නැත්නම් රඳවා තබා ගැනීමේ ක්‍රියාවලියකට යන්න පුළුවන්. එතකොට මේකෙදි අපිට පේනවා, මේ තියෙන අර්ථකථන තුළ වෘත්තීය සමිති, සිවිල් සංවිධාන ව්‍යාපාර, වෙනත් සමාජ ක්‍රියාකාරීන්, දේශපාලන විරුද්ධවාදීන්ව, මේ ඕනෑම කෙනෙක්ව ත්‍රස්තවාදීන් හැටියට හංවඩු ගහලා ජනාධිපතිවරයාගේ අනුමැතිය යටතේ ඒ වගේම විශේෂයෙන්ම නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ අනුමැතිය යටතේ මාස 06කට වැඩි කාලයක් රඳවා තබාගැනීමේ ක්‍රියාවලියකට යන්න පුළුවන්. මේක භයානක තත්ත්වයක්. මොකද කලින් ඒ සඳහා අවසර ලබාදුන්නේ රාජය ආරක්ෂක අමාත්‍ය ලේකම්වරයාගේ බලතල මතයි එය සිදුවුණේ. නමුත් දැන් යෝජිත පනත හරහා නියෝජ්‍ය පොලිස්පතිවරුන් යටතට පත්කිරීම හරහා රඳවා තබාගැනීම් දිගුකාලීනව සිදුකිරීමට හැකියාව තියෙනවා. ඒ වගේම අපි දන්නවා මෙච්චර කාලයක් තිස්සේ දූරකථන පණිවිඩවලට අවශ්‍ය නම් රජයේ රජයේ නිලධාරින්, CID එක වගේ අය ඇහුම්කම් දුන්නා. නමුත් ඒක උසාවියට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබුණේ නැහැ. දැන් මේක නිත්‍යානුකූලකරණය කරනවා. ඒ හරහා අපි කතා කරන දේවල් උසාවියට ඉදිරිපත් කරලා, අපේ ආරක්ෂාවට තර්ජනයක් වන විදිහට ක්‍රියා මාර්ග ගත හැකියි.

ඊට අමතරව අපි සමාජ මාධ්‍යයක, රූපවාහිනි මාධ්‍ය හරහා, පත්‍රිකාවක් හරහා, පෝස්ටරයක් හරහා රජයට එරෙහිව කතා කළොත් විශේෂයෙන්ම මේ පවතින ආර්ථික අර්බුදය හරහා, ජනතාවගේ තිබෙන ප්‍රශ්න පිළිබඳව අපි කතා කළොත් ඒ පිළිබඳව අර්ථකථනයක් දීලා මේක ත්‍රස්තවාදය හැටියට, රට අකර්මණ්‍ය කිරීමේ ක්‍රියාවලියක් හැටියට මෙය හඳුන්වලා දීලා, අපිව රඳවා තබා ගැනීමට නියෝග නිකුත් කරලා, රඳවා තබාගන්න පුළුවන්. ඒ වගේම මේකෙන් පෙන්වන්න යන දේ තමා, රජයට එරෙහිව මතුවන විරෝධතාවයන්, ජනතාව ගන්නා ක්‍රියාමාර්ගයන්ට එරෙහිව රාජ්‍ය ආයතන, ආරක්ෂක අංශ පෙළගැස්වීම හරහා කරන්න යන උත්සාහයක් හැටියට තමා මේක අපට දකින්නට ලැබෙන්නේ. ප්‍රති ත්‍රස්ත පනත

විශාල වශයෙන් ජනතාවගේ හඬ, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මර්දනය කරන්නට ගන්නාවූ ක්‍රියාමාර්ගයක් හැටියට අපිට පෙන්වන්න පුළුවන්.

ඒ අනුව අපිට පේන දේ තමා මේ ක්‍රියාවලීන් හරහා කරන්න උත්සාහ ගන්නේ මිනිසුන්ට, දේශපාලන ප්‍රතිවිරුද්ධ මත දරන්නන්ට, වෘත්තීය සමිතිවලට, සමාජ ක්‍රියාදරයින්ට, මාධ්‍යකරුවන්ට මේ හැම කෙනෙකුටම වැඩ කරන්න තියෙන සීමාව, සිමා කිරීමේ අවස්ථාවක් තමා මේ කරන්න හදන්නේ. මේ සම්බන්ධයෙන් පුරවැසියන්ව දැනුවත් කිරීම අවබෝධයෙන් යුතුව ක්‍රියාත්මක කරන්න ඕනා. ඊයේ පෙරේදා මේ පනත ගේන විජේදාස රාජපක්ෂ ඇමතිවරයා කියලා තියෙනවා, මේ පනතට විරුද්ධවන්න ඕනේ ත්‍රස්තවාදී ක්‍රියා සිදුකරන අය පමණයි කියලා. ත්‍රස්තවාදය පිළිබඳ නිවැරදි අර්ථකථනයක් නොකර කරන්නාවූ මේ උත්සාහයන් තුළ අපට පේන්නේ රටේ ජනතාවට පීඩාව, මර්දනය ගෙන ඒමට කරන්නාවූ උත්සාහයක් කියලයි අපට කියන්න තියෙන්නේ.

**● අධිකරණයේ විනිශ්චයකරුවන් පවා පාර්ලිමේන්තුවට ගෙනැවිත් ප්‍රශ්න කරන යුගයක් ඇවිත් තියෙනවා. නීතියේ ආධිපත්‍යයට හා ප්‍රජාතන්ත්‍රවාදයට මෑතකාලීනව සිදුවී ඇති බලපෑම ගැන සඳහන් කරනවා නම් පැවසිය හැක්කේ කුමක්ද?**

විනිශ්චයකරුවන්ට බලපෑම් එල්ල වුණේ අදක ඊයේක සිට නෙමේ. 1978 හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රියාවලිය තුළ පත්වෙච්ච සියලුම දේශපාලනඥයින් හා ජේ. ආර්. ජයවර්ධන කියන නීච පාලකයා හා ඔහුගේ බොහෝ දේශපාලන ක්‍රියාකාරිකයින් ඉතාමත්ම වනචර ආකාරයෙන් විනිශ්චයකරුවන්ට හූ කිව්වා, ගල් ගැහැව්වා. ඒ වගේම ප්‍රතිවිරුද්ධ මත දරන්නන් සියල්ලන්ටම, අපි දන්නවා, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාට කානුවේ දාගෙන ගැහැව්වා. මේක අදක ඊයේක වෙච්ච දෙයක් නෙමේ. අපි දන්නවා, අධිකරණය විසින් තීන්දු කරලා වැරදිකරුවන් කරපු සමහර පොලිස් නිලධාරින්ට උසස්වීම් දුන්නා ජේ. ආර්. ජයවර්ධනගේ කාලසිමාව තුළ. එතකොට එවැනි ක්‍රියාමාර්ග අපි දැක්කා. මහින්ද රාජපක්ෂගේ කාලසීමාව තුළ හිටපු අග විනිසුරුවරිය ශ්‍රියානි බණ්ඩාරනායකට විරුද්ධව විශාල බොරු චෝදනා එල්ල කරමින්, දෝෂාභියෝගයක් ගෙනැල්ලා ඇයව ඒ තනතුරින් පහකරපු ආකාරය අපි දැක්කා.

ඒ වගේ යුග ගණනාවක් අපි පසුකරමින් ආවා. මේ අධිකරණයේ ස්වාධීනතාවයට ඇඟිලි ගසන ක්‍රියාමාර්ගයක් පිළිබඳව. එහි දිගුවක් තමා මේ වර්තමානයේ අපි අත්දකින්නේ. විශේෂයෙන් ජේ. ආර්. ජයවර්ධනගේ බෑනා මාමා කරපු දේ බෑනා කරමින්ම අධිකරණය හැල්ලු කිරීමට කටයුතු කරමින් ඉන්නවා. අපිට හිතෙන



**“ යුග ගණනාවක් අපි පසුකරමින් ආවා. මේ අධිකරණයේ ස්වාධීනතාවයට ඇඟිලි ගසන ක්‍රියාමාර්ගයක් පිළිබඳව. එහි දිගුවක් තමා මේ වර්තමානයේ අපි අත්දකින්නේ. විශේෂයෙන් ජේ. ආර්. ජයවර්ධනගේ බෑනා මාමා කරපු දේ බෑනා කරමින්ම අධිකරණය හැල්ලු කිරීමට කටයුතු කරමින් ඉන්නවා. අපිට හිතෙන දේ තමා විශේෂයෙන් නීතියේ ආධිපත්‍යයට එරෙහිව ජනතාව නැගී සිටියේ නැත්නම් බරපතල විනාශයක් ඇතිවෙනවා. ජේ. ආර්. ජයවර්ධන අධිකරණයේ ස්වාධීනතාවයට කරපු බලපෑම අපි දැක්කා. ඔහුට එරෙහිව ලබාදුන් යම් යම් තීන්දු තීරණවලට එරෙහිව ඔහු ගත්තු ක්‍රියාමාර්ග අපි දැක්කා. ඒ වගේම මහින්ද රාජපක්ෂ කරපු දේවල් අපි දැක්කා. චන්ද්‍රිකා බණ්ඩාරනායක ඇති කරපු බලපෑම්, මේ කාරණා මේ ආකාරයෙන් සිදුවෙද්දී රටේ ජනතාව නිහඬව සිටීම අපිට දකින්නට තියෙනවා.**

දේ තමා විශේෂයෙන් නීතියේ ආධිපත්‍යයට එරෙහිව ජනතාව නැගී සිටියේ නැත්නම් බරපතල විනාශයක් ඇතිවෙනවා. ජේ. ආර්. ජයවර්ධන අධිකරණයේ ස්වාධීනතාවයට කරපු බලපෑම අපි දැක්කා. ඔහුට එරෙහිව ලබාදුන් යම් යම් තීන්දු තීරණවලට එරෙහිව ඔහු ගත්තු ක්‍රියාමාර්ග අපි දැක්කා. ඒ වගේම මහින්ද රාජපක්ෂ කරපු දේවල් අපි දැක්කා. චන්ද්‍රිකා බණ්ඩාරනායක ඇති කරපු බලපෑම්, මේ කාරණා මේ ආකාරයෙන් සිදුවෙද්දී රටේ ජනතාව නිහඬව සිටීම අපිට දකින්නට තියෙනවා.

මහා ප්‍රජාතන්ත්‍රවාදියෙක් ලෙස පෙනී සිටිමින් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා අද ගන්නා උත්සාහයත් එවැනිම උත්සාහයක්. අපිට කියන්න තියෙන්නේ මේ උත්සායන් පරාජය කිරීම ජනතාවගේ වගකීමක්. ජනතාවට අවසානයට යන්න තියෙන තැන අධිකරණය. එතැන ස්වාධීනව තීන්දු ලැබෙනවා කියන එක තමා අපි විශ්වාස කරන්නේ. අපිට තියෙන්නේ අධිකරණයට ඇඟලි ගැසීම්වලට එරෙහිව විශාල බලපෑමක් කරන්න. ඊට අමතරව කියන්න තියෙන දේ තමා මේ කිව්වේ. මෛත්‍රීපාල සිරිසේන ඇත්තද බොරුද කියන කාරණය අපි දන්නේ නැහැ. එවකට හිටපු අග්‍රවිනිශ්චයකාරවරයා මෛත්‍රීපාල සිරිසේන පත්වෙලා දින කිහිපයකට පසු ඔහු ළඟට ඇවිල්ලා කිව්වා මාව අග්‍රවිනිශ්චයකාර තනතුරෙන් පහකරන්න එපා. ඔබ කියන ඕනෑම ආකාරයේ තීන්දුවක් මම ලබා දෙන්නම් කියලා. මෙය කොයි තරම් නීතිය කඩාවැටීමක්ද කියන කාරණය අපිට තේරෙනවා. එක පැත්තකින් දේශපාලකයෝ අධිකරණයේ කොඳු නාරටිය කඩාගත්තු මෙවැනි අග්‍රවිනිශ්චයකාරවරුන් විසින් ඇතැම් විට විනිශ්චයකරුවන් විසින් නීතියේ ආධිපත්‍යයට පටහැනි ක්‍රියාකාරකම් සිදුකරන බව අපට පෙනෙන්නට තියෙනවා.

**● අරගලයෙන් පසු පාර්ලිමේන්තුවේ ඡන්ද 134කින් රනිල් වික්‍රමසිංහ ජනාධිපති වුණා. IMF එකට සම්බන්ධ වුණා. දැන් රට යන මාවත පිළිබඳව ඔබගේ මතය කුමක්ද?**

දැන් මේ මොහොතේ අපට පේන දේ තමා රනිල් ජනාධිපති වූ පසු ඉන්ධන ලැබෙනවා. විදුලි බලය කපන්නේ නැතිව ලැබෙනවා. රුපියල ශක්තිමත් වෙලා. ඩොලරයට ගෙවිය යුතු ප්‍රමාණය අඩුවෙලා තියෙනවා. ඉතින් මිනිස්සු හිතනවා ඇති රනිල් හරි ශෝක්, ආර්ථිකය හැදුවා නේද, රනිල් තමා වැඩකාරයා කියලා කියන්නයි උත්සාහ ගන්නේ.

ඇත්ත කතාන්දරය ගත්තොත් අපි එක

සතපහක්වත් උපයන්නේ නැතුව කෙහොමද ඩොලරයට සාපේක්ෂව රුපියල ශක්තිමත් වෙන්නේ. මෙය අපි සිතා බැලිය යුතු කාරණාවක් බව අපි දන්නවා. පසුගිය කාලසීමාව තුළ රට බංකොලොත් වීම හරහා එක් ඩොලරයක්වත් අපි ණය ගෙවලා නැහැ. ඒ ණය නොගෙවීම හරහා රට තුළ විදේශ ශ්‍රමිකයින් එවන මුදල් එකතුවෙනවා. ඊට අමතරව වෙළෙඳ කලාපයේ ශ්‍රමයෙන් දහදිය වගුරවලා උපයන ඩොලර් යම් ප්‍රමාණයකට ආර්ථිකයට එකතුවෙනවා. එසේ වෙනකොට දැන් මේ ලැබෙන IMF මුදලින් අපි කියනවා නම් ලොකු ශක්තියක් ලබා ගන්නවා කියලා, අපි දැක්කා පසුගියදා ඉන්දියාව තමන්ගේ පළමු ණය වාරිකය ඉල්ලනවා. අපට මුල් වාරිකයේදී ලැබෙන්නේ ඩොලර් මිලියන 333. මේ මුදලින් 33%ක් පමණ ඒ කියන්නේ විශාල මුදලක් ඉන්දියාව විසින් ඒ ණයට ලබා ගැනීම සඳහා පියවර ගන්නවා.

ඇත්තෙන්ම IMF කියන එකෙන් උත්සාහ ගන්නේ මේ කාරණය, ඒ කියන්නේ රටට ණයකරුවන්ට ණය ගෙවීම සඳහා බැරිකමක් තියෙනවා නම් උඹලා දැන් ණය ගෙවපල්ලා කියන තැනට, ණය ගෙවන්න පුළුවන් කියන තැනට විශ්වාසයක් ගොඩනැගීම තමා කරන්නේ. විශේෂයෙන් ණය හිමියන්ට. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ අපේ ආර්ථිකය ශක්තිමත් වුණා, අපට ණය නැතිව දැන් ඉන්න පුළුවන් කියන එක නෙමේ මේ කියන්නේ. මේකෙන් කියන්නේ අපිට උඹලාට දෙන්න පුළුවන් ණය, මේ තියෙන ණය ගෙවපල්ලා, ඒකට අපි තව ණය ටිකක් දෙන්නම්. මේ තුළින් ණයකරුවන්ට විශ්වාසයක් ඇති කරලා තියෙනවා, උඹලාට ණය ලැබෙනවා කියන කාරණය. ණය කප්පාදු කිරීමක් සිදුවන්නේ නැහැ. ණය ගෙවන්නට සිදුවෙනවා. අපේ ආර්ථිකය ශක්තිමත් වුණාය කියලා පෙන්වන කාරණය තුළ අපිට පේන්නේ නැහැ කොයිම අවස්ථාවකදීවත් මේ ආර්ථිකය ශක්තිමත්වෙලා, නිෂ්පාදන වැඩිවෙලා අපේ නිෂ්පාදකයින්ට අවශ්‍ය සහන සහය ලබාදීලා යම්කිසි නිශ්චිත උපාය මාර්ග හදලා ක්‍රියාත්මක වෙයි කියලා. එහෙම නම් ඇයි මේ ලාභ ලබන ආයතන විකුණන්න ඕනා කියලා කියන්නේ.

ඇයි ටෙලිකොම්, රක්ෂණය, ලංකා හොස්පිටල් විකුණන්න කියලා කියන්නේ. මේ කරන්න හදන්නේ අපිට තියෙන ණය බර තවත් උත්සන්න කරමින් ණයක් අපට එකතු කිරීම. ඒ හරහා එළියේ ඉන්න ණයකරුවන්ට පණිවිඩයක් දෙනවා, උඹලාගේ ණය ලබාගන්න පුළුවන් දීපල්ලා තව ණය කියලා. මෙන්න මේක තමා ගෙනැල්ලා තියෙන්නේ. එතකොට ඒ ණයකරුවන් තවදුරටත් ණය ලබාදෙනවා. දැනට තියෙන ඇමරිකානු ඩොලර් බිලියන 60-70කට අධික ණය ප්‍රමාණය තවත් වර්ධනය කිරීමේ ක්‍රියාවලියක් තමා මෙයින් සිදුවන්නේ. අපිට ණය නැති රටක් හැටියට ගොඩනැගෙන්න අවස්ථාව ලැබිලා නැහැ.

**● උතුරේ දූපත් මේ වන විට නතුවී ඇත්තේ කාටද? චීනයේ හා ඉන්දියාවේ බලපෑම කුමක්ද? ධීවරයින්ට සිදුවන බලපෑම කුමක්ද?**

අපි ශ්‍රී ලංකාව හැටියට ගත්තොත් වාතාවරණය උතුරේ ධීවර ප්‍රජාව අවුරුදු ගණනාවක් තිස්සේ පීඩාවට පත්වෙලා හිටියා. විශේෂයෙන්ම ඉන්දියාවේ ධීවර යාත්‍රා පිළිබඳව ට්‍රෝලින්කරණය සම්බන්ධ ගැටලුවත් සමග 2002 සාම ගිවිසුම අත්සන් කළ කාලයේ ඉඳලාම මේ දක්වාම ට්‍රෝලිංකරණය පිළිබඳව උතුරේ ධීවරයින්ට මුහුදු යන්න අවස්ථාව ලැබුණු දා සිටම යුද්ධයෙන් පසු සාම කාලසීමාව තුළ ඔවුන් උත්සාහ ගත්තා ඉන්දියන් ධීවර යාත්‍රා අපේ මහ මුහුදට පැමිණීම විශේෂයෙන්ම අපේ යාබද කලාපයට මේ යාත්‍රා පැමිණීම වළක්වා ගන්න. අපි දන්නවා ජාත්‍යන්තර මුහුදු සීමාව පිළිබඳව සාගර නීතියත් එක්ක තියෙන අපේ අයිතිය, අපට සම්පත් නෙලාගන්න පුළුවන් කියන කාරණය. මේ නීතියට එකඟව ඉන්දියාවත් ලංකාවත් කටයුතු කළ යුතුව තියෙනවා.

ප්‍රශ්නය තියෙන්නේ ඉන්දියාවේ ධීවර යාත්‍රා, ට්‍රෝලින් යාත්‍රා අපේ මුහුදට පැමිණීමත් එක්ක අපේ මුහුද විනාශ වීම. විශේෂයෙන්ම අපි දන්නවා 1974 සිරිමා/ගාන්ධි ගිවිසුමත් එක්ක කච්චතිව් දූපත අපට පවරා දුන්නා. ඉන් අදහස් කරන්නේ ඒ දූපත අයත් වන්නේ අපේ මුහුදු සීමාව යටතට. දිල්ලිය එකඟ වුණා එය අපේ රටට දෙන්න. ඒ පිළිබඳව දැන් විවිධ පුද්ගලයෝ විවිධ අදහස් ඉදිරිපත් කරලා තියෙනවා. කච්චතිව් දූපත නැවත ඉන්දියාවට ලබාගත යුතුයි කියලා ඉන්දියාවේ වර්තමාන මහා ඇමති කේ. ස්ටාලින් මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කරලා තියෙනවා, මෝදි අග මැතිතුමාගේ මැදිහත් වීමෙන් ඒ තීරුව නැවත ලබාගත යුතුයි කියලා.

**මේක සම්බන්ධයෙන් අපිට තියෙන ගැටලුව තමා යම්කිසි දූපතක් යම් රටකට අයිති වෙනවානම් එතැන සිට නාවික සැතපුම් 200ක් දක්වා මුහුදු සීමාව ඔවුන්ට අයිතියි. ඒ හිමිකම තියෙනවා. ඒක උතුරේ කච්චතිව් දූපත ඉන්දියාවට දුන්නත් එකයි, පෝට් සිටිය චීනයට දුන්නත් එකයි. පෝට් සිටිය ස්වෛරී අයිතියක් ලෙස චීනයට ලබා දුන්නොත් ඊට අදාළ නාවික සැතපුම් 200ක් දක්වා භූමි ප්‍රමාණය චීනයට අයිතිවෙනවා. ඒ නිසා මේක බරපතල තත්ත්වයක්.**

ඊට අමතරව ඩෙල්ෆ්ට්, කයිට්ස් වගේ දූපත් පිළිබඳව පසුගිය කාලසීමාව තුළ තිබුණා සුළං බලශක්තිය පිළිබඳ යෝජනාවලියක්. ඒ තුළ තිබුණේ මේ දූපත් චීනයේ යම් සමාගම් සතු කරලා, ඒ සමාගම් හරහා සුළං ආධාරයෙන් බලශක්තිය උත්පාදනය කරන්න ඕනා කියන කාරණය. මේවා සියල්ල එක පැත්තකින් අපට පෙන්නන්නේ යම් ආකාරවලින් ධීවර කටයුතු සඳහා බලශක්ති නිෂ්පාදන සඳහා මේවා පාවිච්චි කරන බවක් පෙන්වන්නේ. නමුත් අපට පේනවා එක පැත්තකින් සම්පත් කොල්ලකෑම, අනිත් පැත්තෙන් සම්පත් විනාශ කිරීම. අනිත් පැත්තෙන් අපේ භූ දේශපාලනය අපේ අයිතීන් පිළිබඳව තියෙන ඉඩකඩ සීමා කිරීමේ ක්‍රියාවලිය මේ තුළ සිදුකිරීම සඳහා වන වෑයමක් අපි දකිනවා. මේක එක පැත්තකින් කච්චතිව් වගේ දූපත් ඩෙල්ෆ්ට්, කයිට්ස් වගේ දූපත්. ඒ වගේම දූපත් නොවන වෙරළ තීරයේ දකින්නට ලැබෙන අනිත් කාරණය තමා චීන සමාගම් අපේ මුහුදේ මුහුදු කුඩැල්ලන් වගාකිරීම හරහා ඒ සම්පත්වල අයිතිය වගේම මුහුදු සීමාවේ තියෙන අයිතිය, වෙරළාසන්න භූමියේ තියෙන අයිතිය උදුරා ගැනීම සඳහා ධීවරයින්ගේ පාරම්පරික අයිතිය අහිමි කිරීම, ඔවුන්ගේ ජීවන මාර්ග අහිමි කිරීම දක්වා මෙය වර්ධනය වෙලා තියෙනවා. මෙය ඉතාමත්ම භයානක ප්‍රවණතාවයක් හැටියට තමා අපි දකින්නේ. මේ පවතින්නේ රටේ සම්පත් විකිණීමේ පෞද්ගලිකකරණය කිරීමේ ක්‍රියාවලියේ ඉතා පැහැදිලි ධීවර ක්ෂේත්‍රයේ නියෝජනය හැටියට තමා අපට පෙන්වන්න තියෙන්නේ. අනිත් පැත්තෙන් ගත්තහම දැනට අපි දැක්කා පාර්ලිමේන්තුවේදී විදේශ කටයුතු ඇමතිතුමා අලි සබ්‍රි ඇමතිතුමා කියලා තියෙනවා ඉන්දියානු ධීවර යාත්‍රාවලට අපේ මුහුදු තීරයේ රැකියාවන් කිරීම සඳහා අවසරය ලබාදීමේ ක්‍රියාමාර්ග යක් ගන්න ඕනා කියලා. අපි ඉන්දියාවට ණය ගැතියි, අපි ණයකරුවෝ. ඉන්දියාවෙන් ඩොලර් මිලියනයක් අපි ගත්තා, ආහාර සහනාධාර ලැබුණා, මේ සියල්ල හරහා රජය ඉන්දියාවට ගැතිවෙලා තියෙනවා. මේ ගැතිභාවය තුළ මේ රටේ තියෙන ඕනෑම සම්පතක්, විශේෂයෙන්ම අපි දන්නවා මහ මුහුද අපිට තියෙන සම්පතක් අපේ රට දියුණු කිරීම සඳහා. මේ රට වගේ පස් ගුණයකට වඩා විශාල මුහුදු තීරයක් අපට තියෙනවා. මේ අනන්‍ය කලාපය භාවිතා කරලා අපේ තියෙන ආර්ථික ප්‍රශ්නවලින් ජයගැනීම සඳහා යාමේ ඉඩකඩ තියෙද්දී ඒවා කිසිසේත් නොසලකා හරිමින් රජයන් ගන්නා උත්සාහය ඉතාමත් පිළිකුල් සහගතයි සහ නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගීම හරහා මේ රට සංවර්ධනය සඳහා ගෙනයාමේ උපාය මාර්ග සැලසුම් සකස් කිරීම වෙනුවට මේ රටේ සම්පත් විකිණීම හරහා විදේශීය සමාගම්වලට දීලා කොමිස් ලබා ගැනීම හරහා දේශපාලනඥයින්ගේ මඩි තරකර ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ මිසක් රට වෙනුවෙන් යුක්ති සහගත ක්‍රියාවලියක් සාධාරණ ක්‍රියාවලියක් ගොඩනැගීමට කිසිසේත් ආරම්භ කිරීමට ඉදිරිපත් නොවන බව තමා අපට පෙනී යන්නේ, දූපත් ලබාදීම හරහා භූමිය ලබාදීම හරහා විවිධ සංවර්ධනයන් හරහා.

**සාකච්ඡා කළේ :**

**මාධ්‍යවේදී සනත් ප්‍රනාන්දු**



# නීතිය මත පාලනය හා ප්‍රතිත්‍රස්තවාදී පනත් කෙටුම්පත

**"තවදුරටත් යෝජිත පණත් කෙටුම්පත යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරුන් යටතේ අත්අඩංගුට ගත් අය රඳවා ගැනීමේ කඳවුරු පවත්වාගෙන යාමටද ඉඩදී ඇත. මේ අනුව එම රඳවා ගැනීම් ස්ථානයන් අධිකරණයේ මෙන්ම බන්ධනාගාර කොමසාරිස්ගේද අධීක්ෂණයෙන් බැහැර වේ. කොටින්ම කිවහොත් 1987-1991 කාලයේදී පැවතුනා වැනි කඳවුරු එනම් බටලන්ද වැනි කඳවුරු ඇතිවීමට මාවත මෙයින් සැලසී ඇත. එවැනි කඳවුරු පැවති කාලයේ රහසිගතව අත්අඩංගුවට ගැනීම් කිරීමටත්, රහසිගතව ඔවුන් රඳවා ගැනීමටත් රඳවාගෙන සිටින කාලය තුළ එම රැඳවියන් ඕනෑම වර්ගයක වධහිංසාවට හෝ වෙනත් වැරදි සහගත සැලකිල්ලට භාජනය කිරීමටත් හැකිවිය. ඉන් පසු එම රැඳවියන් අතරින් බොහෝ දෙනෙකු මරාදැමීමද වළලා දැමීමද රහසිගතව කර ගැනීමටද හැකිවිය. යෝජිත ප්‍රතිත්‍රස්ථවාදී පනතේ මෙසේ ඉහළ පොලිස් නිලධාරීන් වෙත පවරා ඇති බලතල නැවත පැවරීම රාජ්‍ය ත්‍රස්ථවාදය ලෙස හිස එසවීමට හා ඝාතන සංස්කෘතියක් ඇති කිරීම මගින් රට තුළ භීතියේ මානසිකත්වයක් නැවත නිර්මාණය කිරීමටත් තුඩු දෙනු ඇත. ඇත්තෙන්ම ප්‍රතිත්‍රස්තවාදී පනතේ අරමුණද මෙවනි තත්ත්වයක් උදාකිරීමට අවශ්‍ය කොන්දේසි සැලසුම් කිරීමක් බව පෙනී යයි.**

නීතියමත පාලනය පිළිබඳව වර්තමාන කාලය තුළ ලිය වී ඇති පොත් අතර ඉතාමත් ප්‍රසිද්ධියට පත් පොතක් වූයේ ටොම් බින්ග්හම් සාමිවරයා විසින් ලියන ලද නීතිය මත පාලනය (The Rule of Law) යන පොතය. එම පොත නීතිය මත පාලනය යන නමින් සිංහලට පරිවර්ථනය කොට ඇත.

එම පොතෙහි නීතිය මත පාලනය යන්න පිළිබඳව ඇති නිර්වචනයය මෙසේය. " දැනට පවත්නා මූලධර්මයේ (නීතිය මත පාලනය ගැන) හරය බවට මා යෝජනා කරන්නේ, රාජ්‍යයක් තුළින් ක්‍රියාකරන සියලු තැනැත්තන්, ඔවුන් පොදු හෝ පුද්ගලික තැනැත්තන් වුවත්, ප්‍රසිද්ධියේ සාදන ලද, අනාගතයේ බල පවත්වන (සාමාන්‍ය වශයෙන්) සහ උසාවිවලින් ප්‍රසිද්ධියේ පරිපාලනය කරනු ලබන නීතිවලින් බැඳී සිටිය යුතු බව සහ ඒවායේ ප්‍රතිලාභවලට හිමිකම් කිව යුතු බවයි."

මෙම නිර්වචනයය වටා නීතිය මත පාලනය යන සංකල්පය මෙන්ම ඒ වටා ලංකාවේ පැන නැගී ඇති ගැටලු ගණනාවක් සාකච්ඡා කළ හැකිය.

### අභිමතය නීතියට යටත් විය යුතුය

නීතිය මත පාලනය යන්නෙහි පළමුවෙනි අංගය නම් රටක සෑම ප්‍රසිද්ධ කටයුත්තක්ම නීතියක් මත පදනම් විය යුතු බවය. ටොම් බින්ග්හම් (Tom Bingham) ස්වාමිවරයා නීතිය හා අභිමතය පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි.

නෛතික අයිතින් හා වගකීම් පිළිබද ප්‍රශ්න සාමාන්‍යයෙන් විසඳිය යුත්තේ නීතිය මතය. අභිමතය මත නොවේ.

එතුමා තව දුරටත් ප්‍රකාශ කරන්නේ, නිළධාරීන් හෝ අධිකරණයේ තීන්දු ගන්නන් සියලු අභිමතයන්ගෙන් තොර කළ යුතු යැයි නීතිය මත පාලනය විසින් ඉල්ලා සිටින්නේ නැත. ඒ වෙනුවට එයින් ඉල්ලා සිටින්නේ අත්තනෝමතික විය හැකි ලෙසට කිසිදු අභිමතයක් සීමාවන්ගෙන් තොර නොවිය යුතු බවයි. කිසිදු අභිමතයක් නෛතිකව නිර්බාධිත නොවි ය යුතු බවයි.

### යෝජිත ප්‍රතිත්‍රස්තවාදී පනත බලයෙන් අතුරුදහන් කිරීම්වලට මගපාදයි

යෝජිත ප්‍රතිත්‍රස්තවාදී පනත තුළ ඇති ප්‍රතිපාදනයන් ඉතා බරපතල මානව හිමිකම් කැඩීම්වලට මාවත විවෘත කර ඇත. රඳවා ගැනීම් පිළිබඳ නියෝග ඉහළ පොලිස් නිළධාරීන් විසින් කළ හැකිය යනුවෙන් සලසා ඇති ප්‍රතිපාදනය නිසා අත්තඩංගුවට ගැනීම් හා රඳවාගැනීම්වල නීත්‍යානුකූල භාවය තීන්දු කිරීමට අධිකරණයට ඇති බලය අහිමි වේ. මහේස්ත්‍රාත් වරයෙකු විසින් අත්තඩංගුවට ගැනීම් පිළිබඳව සලකා බලන්නේ එම අත්තඩංගුවට ගැනීම් හෝ රඳවා ගැනීම් නීත්‍යානුකූලද නැද්ද යන පදනම මතය. එය කිරීම පවරා ඇත්තේ අධිකරණ නිලධාරියෙකුටය. තරාතිරම කුමක් වුවත් පොලිස් නිලධාරියෙකු යනු විධායකය වෙනුවෙන් වැඩ කරන නිලධාරියෙකි. එවනි නිළධාරියෙකුට අධිකරණ නිලධාරියෙකු සතු බලතල පැවරීම තුළින් විධායක නිලධාරීන්ට ඔවුන්ට අයිති නැති බලයක් පැවරේ. ජන ව්‍යවහාරයේ එන විදියට බල්ලාගේ වැඩේ බූරුවා කිරීමට උත්සාහ කිරීම වැනි තත්ත්වයක් මෙහිදී නිර්මාණය වේ.  මේ අනුව ජනතාවගේ ආරක්ෂාව පිළිබඳව පවතින ගැඹුරුම මූලධර්ම උඩු යටිකුරු වේ. විනිශ්චයකාරවරයෙකුට අත්තඩංගුවට ගැනීම් හා රඳවා ගැනීම් පිළිබඳව නීත්‍යානුකූලභාවය සලස්වා ඇත්තේ හොරාගේ අම්මාගෙන් පේන ඇසීම වැනි අර්ථ විරහිත හා ව්‍යාජ තත්ත්වයන් ඇතිකිරීම සඳහාය. පොලිස් නිළධාරීන්ටම පොලීසිය විසින් කරනු ලබන අත්තඩංගුවට ගැනීම් හරිද වැරදිද කියා තීන්දු කිරීමට ඉඩදීම බරපතල වැරදි වසන් කිරීමට මාවත විවෘත කරනු ඇත. විශේෂයෙන්ම දේශපාලන හේතූන් මත යමෙක් අත්අඩංගුවට ගන්නේ නම්, එසේ කළ හැක්කේ ඉහළ පොලිස් නිලධාරීන්ගේ අනුදැනුම ඇතිව පමණි. එම නිසා එවැනි අත්අඩංගුවට ගැනීම් පිළිබඳ තීන්දුවල හරි වැරදි තීන්දු කළ හැක්කේ අධිකරණ නිලධාරීන්ට පමණය. තවදුරටත් යෝජිත පනත් කෙටුම්පත යටතේ නියෝජ්‍ය පොලිස්පතිවරුන් යටතේ අත්අඩංගුට ගත් අය රඳවා ගැනීමේ කඳවුරු පවත්වාගෙන යාමටද ඉඩදී ඇත. මේ අනුව එම රඳවා ගැනීම් ස්ථානයන් අධිකරණයේ මෙන්ම බන්ධනාගාර කොමසාරිස්ගේද අධීක්ෂණයෙන් බැහැර වේ. කොටින්ම කිවහොත් 1987-1991 කාලයේදී පැවතුනා

**ජනතාවගේ පරමාධිපත්‍ය යන සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තුළ නිර්මාණය වූයේ ශතවර්ෂ ගණනාවක වාද විවාද පමණක් නොව සිවිල් යුද්ධද පසුබිම් කරගෙනය. මෙහිදී ප්‍රධානම ප්‍රශ්නය හැටියට පැවතියේ අසාධාරණ නීති සම්මත කරගැනීම මගින් විධායකය අයුතු ප්‍රයෝජන ගැනීම වළක්වාලීමය. රාජ්‍ය බලය සතු පුද්ගලයන් මහජන කැමැත්ත වෙනුවට තමන්ගේ කැමැත්ත ඉදිරිපත් කරමින් ඒ මත නීතිය සාදාගැනීමට උත්සාහ දැරීම සාමාන්‍ය දේශපාලන අත්දැකීමකි. මේ නිසා නීති සෑදීමේදී සාධාරණත්වය පැවතිය යුතු බව පිළිබඳ සංකල්පය වර්ධනය වන්නේ එය හුදෙක්ම විධායකයේ අභිමතය පරිදි කිරීම වැළැක්වීමටත් එම නීතිවලින් පොදු යහපත ඉටුවෙනවාද යන්න සලකා බැලීමට ජනතාවටම ඇති අයිතිය තහවුරු කිරීම සඳහාත්ය. මෙහිදී යම් ඡන්දයක මාර්ගයෙන් බලයට පත්වන ආණ්ඩුවකට ජනයා විසින් තමන්ගේ පරමාධිපත්‍ය පවා දී ඇතය මේ නිසා ජනතාව වෙනුවෙන් එම පරමාධිපත්‍ය පාවිච්චි කිරීම පාර්ලිමේන්තුවේ පමණක් කටයුත්තක්ය යන සාවද්‍ය අදහස පිළිබඳව විවේචනාත්මකව සලකා බැලිය යුතුය.**



වැනි කඳවුරු එනම් බටලන්ද වැනි කඳවුරු ඇතිවීමට මාවත මෙයින් සැලසී ඇත. එවනි කඳවුරු පැවති කාලයේ රහසිගතව අත්තඩංගුවට ගැනීම් කිරීමටත්, රහසිගතව ඔවුන් රඳවා ගැනීමටත් රඳවාගෙන සිටින කාලය තුළ එම රැඳවියන් ඕනෑම වර්ගයක වධහිංසාවට හෝ වෙනත් වැරදි සහගත සැලකිල්ලට භාජනය කිරීමටත් හැකිවිය. ඉන් පසු එම රැඳවියන් අතරින් බොහෝ දෙනෙකු මරාදැමීමද වළලා දැමීමද රහසිගතව කර ගැනීමටද හැකිවිය. යෝජිත ප්‍රතිත්‍රස්තවාදී පනතේ මෙසේ ඉහළ පොලිස් නිළධාරීන් වෙත පවරා ඇති බලතල නැවත පැවරීම රාජ්‍ය ත්‍රස්තවාදය ලෙස හිස එසවීමට හා ඝාතන සංස්කෘතියක් ඇති කිරීම මගින් රට තුළ භීතියේ මානසිකත්වයක් නැවත නිර්මාණය කිරීමටත් තුඩු දෙනු ඇත. ඇත්තෙන්ම ප්‍රතිත්‍රස්ථවාදී පණතේ අරමුණද මෙවනි තත්ත්වයක් උදාකිරීමට අවශ්‍ය කොන්දේසි සැලසුම් කිරීමක් බව පෙනී යයි.

ඉහත සදහන් වන්නේ ප්‍රතිත්‍රස්තවාදී පනත් කෙටුම්පත යන නාමයෙන් ඉදිරිපත් කොට ඇති අති භයානක වූ නීති සම්පාදනයක් පිළිබඳ කරුණු කිහිපයක් සඳහන් කිරීමකි. මේ පිළිබඳව තවත් කිය යුතු බරපතල විවේචන විශාල වශයෙන් පවතී. දැනට මෙම පණත් කෙටුම් පතට විරුද්ධව විශාල මහජන මතයක් ගොඩ නැගී ඇත්තතේද මේ නිසාය. මෙම පනත පරාජය කළ යුතුය යන්න ගැන මහජන අවදිවීමක් පැවතීම සාධාරණය. එම විවේචනය ඉදිරියට ගෙන යාම ලාංකීය ජනතාවගේ අනාගත ආරක්ෂාව සඳහා හේතුවනු ඇත.

## නීති ප්‍රසිද්ධියේ සම්පාදනය කළ යුතුය

මෙම නීති සම්පාදනය ප්‍රසිද්ධියේ කළ යුතු බව එහි ප්‍රධාන අංගයකි. මෙහිදී ප්‍රසිද්ධියේ නීති නිර්මාණය කිරීම යන අදහස පිළිබඳව ලංකාවේ ඉතාමත් විශාල ව්‍යාකූලත්වයන් පවතින බව පෙනේ. සාමාන්‍යයෙන් වර්තමාන කාලය තුළ ප්‍රසිද්ධියේ නීති සෑදීම යන්නෙන් අදහස් වන්නේ යම් නීති කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර ගැසට් පත්‍රයක් මගින් නිකුත් කිරීමත් ඉන් පසු එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් අතරට ඉදිරිපත් කිරීමත් පසුව පාර්ලිමේන්තුව තුළදී ඒ පිළිබදව ඇතිවන සාකච්ඡාව හා එකඟතාවයන් ලබා ගැනීමත් එසේ කරන අතරතුරේදී එම පනත පිළිබදව යම් විරුද්ධත්වයක් ඇති පුද්ගලයින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට ගොස් එයට විරුද්ධතා දැක්වීමට ලබා දී ඇති කෙටි කාලයත් එම කාලය තුළ සලකා බැලීමෙන් පසු එම පනත පිළිබදව අධිකරණයෙන් කරන ප්‍රකාශය හා ඒ අනුව වෙනස්කම් ඇති කළ යුතුනම් එසේ කොට අවසාන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට එය එහිදී සම්මත කර ගැනීම මගිනි. එසේ ප්‍රසිද්ධියේ කරන සාකච්ඡාවට අඩංගු තව කරුණු දෙකක් නම්, යම් ආකාරයක මතවාදයට තුඩු දෙන හා ව්‍යවස්ථාවට පටහැනි සේ පෙනෙන යම් වගන්ති ඇතොත් ඒවා තුනෙන් දෙකක පාර්ලිමේන්තු ඡන්දයෙන් සම්මත කරගත යුතු හා අවශ්‍ය නම් ජනමත විචාරනයකට යටත් කළ යුතු බවය.

මෙය බැලූ බැල්මට ප්‍රසිද්ධියේ නීති නිර්මාණය කිරීමක් සේ පෙනෙන්නට ඇතත් ඇත්තෙන්ම මෙම වත් පිලිවෙත්හි ප්‍රධාන ගැටලු ගණනාවක් ඇත. ප්‍රසිද්ධියේ නීති සෑදීම යන්නෙන් අදහස් වන්නේ මහජනයගේ කැමැත්ත මත නීතියක් සම්මත වන බවය. එසේ සම්මත වන බවට නෛතික මූලධර්මය නම් ජනතාවගේ පරමාධිපත්‍ය යන සංකල්පයය. ලංකාවේ ව්‍යවස්ථාව ගොඩනැගී ඇත්තේ මෙම සංකල්පය මතය.

## ජනතා පරමාධිපත්‍ය හා නීති නිෂ්පාදනය

ජනතාවගේ පරමාධිපත්‍ය යන සංකල්පය ප්‍රජාතන්ත්‍රවාදී රටවල් තුළ නිර්මාණය වූයේ ශතවර්ෂ ගණනාවක වාද විවාද පමණක් නොව සිවිල් යුද්ධද පසුබිම් කරගෙනය. මෙහිදී ප්‍රධානම ප්‍රශ්නය හැටියට පැවතියේ අසාධාරණ නීති සම්මත කරගැනීම මගින් විධායකය අයුතු ප්‍රයෝජන ගැනීම වළක්වාලීමය. රාජ්‍ය බලය සතු පුද්ගලයන් මහජන කැමැත්ත වෙනුවට තමන්ගේ කැමැත්ත ඉදිරිපත් කරමින් ඒ මත නීතිය සාදාගැනීමට උත්සාහ දැරීම සාමාන්‍ය දේශපාලන අත්දැකීමකි. මේ නිසා නීති සෑදීමේදී සාධාරණත්වය පැවතිය යුතු බව පිළිබඳ සංකල්පය වර්ධනය වන්නේ එය හුදෙක්ම විධායකයේ අභිමතය පරිදි කිරීම වැළැක්වීමටත් එම නීතිවලින් පොදු යහපත ඉටුවෙනවාද යන්න සලකා බැලීමට ජනතාවටම ඇති අයිතිය තහවුරු කිරීම සඳහාත්ය. මෙහිදී යම් ඡන්දයක මාර්ගයෙන් බලයට පත්වන ආණ්ඩුවකට ජනයා විසින් තමන්ගේ පරමාධිපත්‍ය පවා දී ඇත. මේ නිසා ජනතාව වෙනුවෙන් එම පරමාධිපත්‍ය පාවිච්චි කිරීම පාර්ලිමෙන්තුවේ පමණක් කටයුත්තක්ය යන සාවද්‍ය අදහස පිළිබඳව විවේචනාත්මකව සලකා බැලිය යුතුය. **සාධාරණත්වයට අනුව නීති සෑදීම පිළිබඳ මූලික අයිතිය පවතින්නේ සෘජුවම ජනතාව තුළය. සාධාරණත්වයක් පවතිනවාද නැද්ද යන කරුණ සලකා බැලීමකින් තොරව යම් නීතියක් සාධාරණයයි සම්මත කිරීමට ජනතාවට බැරිය. යමක් සම්මත කිරීම යනු ඊට කැමැත්ත දීමක් වේ. කැමැත්ත දිය හැක්කේ තමන් සලකා බැලූ දේවල් ගැන පමණය. තමුන්ගේ දැනීමෙන් පරිභාජනය නොවූ සහ තමන්ගේ සැලකිල්ලට පරිභාජනය නොවූ දේ පිළිබඳව කැමැත්තක් හෝ අකමැත්තක් ප්‍රකාශ කිරීමට හැකියාවක් ඇත්තේ නැත. ඒ නිසා ජනතාවගේ කැමැත්තක් ලබා ගැනීම යනුවෙන් පනතක් සම්මත කර ගන්නේ නම් ඊට අත්‍යාවශ්‍ය කොන්දේසියක් වන්නේ ඉතා පළල් ආකාරයේ එම නීතිය පිළිබඳව ඉතා පැහැදිලි සාකච්ඡාවක් ඇති වීමට ඉඩ සැලැස්වීමය.**

## හොර රහසේ හෝ වංචනිකව නීති නිෂ්පාදනය නොකළ යුතුය

මේ නිසා මොනයම් ආකාරයකින් හෝ රහසිගත බාවයකින් යුතුව නීති නිර්මාණය කිරීම නීතිය මත පාලනය යන අදහසට මුළුමනින්ම පටහැනිය. රවට්ටා ලබා ගන්නා කැමැත්ත සැබෑ කැමැත්තක් නොවේ. මේ නිසා නීති සම්පාදනයේදී රැවටිලි නොතිබිය යුතුය. එක් කරුණක් පිළිබඳ මවාපාමින් ඊට හාත්පසින්ම

වෙනස් වන අදහස් ඉටුකර ගැනීම සඳහා නීති සම්මත කර ගැනීම වනාහි ජන සම්මතයෙහි යන සංකල්පය මුළුමනින්ම බැහැර කිරීමකි. මේ මගින් ජන සම්මතය වෙනුවට කිසියම් හෝ පාලක කණ්ඩායමක අවශ්‍යතාවය අනුව නීති නිෂ්පාදනය කිරීමක් සිදු වේ. මෙය සිදුවීමත් සමගම නීතිය මත පාලනය යන සංකල්පයට අනුව නීති සෑදීම පමණක් නොව නීතිය මත පාලනයේදී නොකිරිය යුතු කරුණු වක්‍රාකාරයකින් ඉටු කර ගැනීමක්ද සිදු කළ හැකිය. කෙටියෙන් කිවහොත් පළල් ජනතා සහභාගිත්වයකින් තොරව නීති නිෂ්පාදනය කිරීම යනු වංචනික වූ ක්‍රියාවකි. සකල රටකටම බලපාන නීති වංචනීය වශයෙන් නිර්මාණය වූවොත් එයින් සිදුවන විපත අති විශාල එකක් විය හැකිය.

නීති පැනවීම පළල් මහජන සහභාගීත්වයකින් කළ යුතුය යන අදහස යට ඇත්තේ එවැනි නීතියක් සම්මත වූවොත් ඒ මගින් සිදුවිය හැකි හොඳ මෙන්ම නරක ප්‍රතිඵලද දැන ගැනීමේ අවස්ථාව ජනතාවට සලසාදීමය. බොහෝ විට ජනතාව අතරින්ම විවිධ මත පැන නැගී මෙවැනි නීතියක් සම්මත කළහොත් එයින් සිදුවිය හැකි විනාශය පෙන්වා දෙන අවස්ථා ඇතිවිය හැකිය. සමහර නීති දැමීම නිසා ආර්ථිකයක් කඩා වැටිය හැකි බව, අධ්‍යාපන ක්‍රමයක් හෝ සමාජයේ වෙනත් සංස්ථාවක් කඩා වැටිය හැකි බව, විශේෂයෙන්ම යුක්තිය පසඳලීමේ සංස්ථාවන් වන පොලීසිය නීතිපති ක්‍රමය හා අධිකරණයට හානිකර දේ මෙම නීතිය තුළින් සිදුවිය හැකි බව ආදිය ජනතාව තුළින් යම් කොටසක් වටහා ගතහොත් ඔවුන්ගේ යුතුකම වන්නේ මෙය සමාජයට කියාදී එම වරද සිදුවීමට පෙර එය වළක්වාලීමය. එසේ නැතිවුවහොත් වැරදියට සාදාගත් නීතියක් සාධාරණත්වය ඉෂ්ඨකරනු වෙනුවට රටේ තවත් ගැටලු වැඩිකර අසාධාරණය වැඩි කරන තත්ත්වයක් ඇතිවිය හැකිය.

## පාලනය හා මර්දනය

**මිනිසුන් නීති සම්පාදනය කර ගන්නේ යහපත් මෙන්ම කාර්යක්ෂම පාලන ක්‍රමයක් තම සමාජය තුළ නිර්මාණය කර ගැනීම සඳහාය. මේ අනුව නීතිය ක්‍රියාත්මක කරවා ගැනීම තුළින් බලාපොරොත්තු වන්නේ සමාජය කෙරෙහි සාධනීය වන්නා වූ ප්‍රතිඵල ලබාගැනීමයි. මෙය වෙනත් ආකාරයකින් කියුවොත් සමාජය වඩාත් නරක තත්ත්වයකට හරවා ගැනීම නීති නිෂ්පාදනයේ අරමුණ හෝ බලාපොරොත්තුව නොවේ. නරක තැනක සිට හොඳ තැනකට ගමන් කිරීම සඳහා යම් පියවර ගැනීම නීතියේ අරමුණ වේ.**

**මේ අනුව හුදෙක්ම මිනිසුන් මර්ධනය කිරීම සඳහා සාදන නීති සාධනීය ප්‍රතිඵල ගෙන දෙන නීති නොවේ. 1970න් පමණ පසු කාලයේ ලංකාවේ නීති නිර්මාණය දෙස බැලීමේදී සමාජය වඩා නරක ප්‍රතිඵල දෙන නීතීන් පණවා ඇති බව පෙනී යයි. එවැනි නීති සාධරණ කිරීම සදහා නොයෙක් හේතු දක්වා ඇතත් ලාංකීය සමාජය දෙස වර්තමානයේදී බැලීමේදී පෙනී යන්නේ මෙසේ ඇති කරන ලද දැඩි මර්දන නීති නිසා සමාජය සෑම අංශවලින්ම අවුලට ගිය හා කඩා වැටුනු ආකාරයයි.** කෙටියෙන් කියුවොත් පසුගිය කාලය තුළ නිර්මාණය කර ඇති මර්දන නීතිවල ප්‍රතිඵල වී ඇත්තේ රට තුළ අවුල් ජාලයක් නිර්මාණය වීමයි. අද ලාංකික සමාජය ලිහාගන්නට බැරි ප්‍රමාණයකට ආරවුල්වල පැටලී ඇත. දැඩි මර්ධන නීතිවල ප්‍රතිඵල වශයෙන් නෙලා ගත හැකිව ඇත්තේ නීතියෙන් තොර, ආරක්ෂාවෙන් තොර, වංචාවෙන් පිරි, අපරාධවලින් ගහන, ආරථික වශයෙන් කඩා වැටුනු, දේශපාලන වශයෙන් ජරාපත් වුනු සමාජීය වශයෙන් අනාරක්ෂිත රටකි. රට හැර යාම රට ඇතුලේ සිටීමට වඩා හොඳය යන අදහස අනාගතයක් ගැන බපාපොරොත්තුවක් ඇති කාගේ වුවත් සිහිනයක් බවට දැන් පත්ව ඇත.

අතීතය තුළ නිර්මාණය කර රටේ නීතිය බවට පත් කළ "ප්‍රතිත්‍රස්ථවාදී" නීතිවල ඇත්තෙන්ම කිසිදු ත්‍රස්තවාදියෙකුට කළ නොහැකි ප්‍රමාණය හානියක් රටට සිදුකොට ඇත. "ප්‍රතිත්‍රස්තවාදී" නීති පදනම් වන්නේ වරදේ ප්‍රමාණයට වැඩි දඬුවම් නියම කිරීමය. මෙම අසමතුලිත දඬුවම් ක්‍රමය (Diss proptent punishment) "ප්‍රතිත්‍රස්තවාදී" නීතිවල නොවැළැක්විය හැකි ප්‍රතිඵලයකි. 1971 ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ගැටීම්වලදී ජනතා පෙරමුණේ යැයි කියන සාමාජිකයන් අතින් මරුමුවට පත් වූ පොලිස් හා වෙනත් ආරක්ෂක නිලධාරීන්ගේ ගණන 52 ක් පමණ යැයි ගණන් බලා ඇත. එහෙත් එම අවස්ථාවේදී ගත් "ප්‍රතිත්‍රස්තවාදී" ක්‍රියා මගින් මරණයට පත් කරන ලද තරුණයන්ගේ ගණන පන්දහසකට වැඩිය. තවත් දසදහසක් පමණ තරුණයන් බේරාග න්නා ලද්දේ දෙමව්පියන් විසින් දරුවන් ආරක්ෂක ස්ථානවලට බාරදීම මගිනි. 1987-1991 අතර කාලයේ ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ කලබලවලදී පොලීසිය හා හමුදාව විසින් මරාදමන ලද ප්‍රමාණය මේ පිළිබඳව පරික්ෂා කළ බලයෙන් අතුරුදහන් කළ වූවන්ගේ කොමිෂන් සභාවල වාර්තා අනුව 20000ක් පමණ යැයි සඳහන් කොට ඇත. එහෙත් එම ප්‍රමාණයට වඩා මරණ සිදු වූවා යැයි වෙනත් සංවිධාන ප්‍රකාශයට පත් කොට ඇත. උතුරු හා නැගෙනහිර පළාත්වල එසේ අතුරුදහන් වූවන්ගේ ප්‍රමාණය අතිවිශාල යැයි සලකනු ලබන නමුත් මේ පිළිබදව නිශ්චිත සංඛ්‍යා ලේඛන ඇත්තේ නැත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඕ.පී.එම්. කාර්යාලය මගින් ලබාගෙන යන තොරතුරුවලට අනුව විශාල ප්‍රමාණයක අතුරුදහන් සිදුවී ඇති බව පෙනී යයි. අත්අඩංගුවට පත් වූවන් මහා පරිමානයෙන් මරා දැමීම ජාත්‍යන්තර නීතියට අනුව යුද්ධ අපරාධයකි. එසේ වූවත් මේ අපරාධ කිරීමට මාවත සලසා දුන්නේ මේ කාලවල නිර්මාණය කොට ක්‍රියාවට දමන ලද "ප්‍රතිත්‍රස්තවාදී" නීති මගිනි.

## ප්‍රතිත්‍රස්තවාදී නීති රටට හා සමාජයට විනාශකාරී නොවිය යුතුය

රටටත් සමාජයටත් විනාශකාරී නොවන ලෙසට යම් ප්‍රතිත්‍රස්තවාදී නීතියක් නිර්මාණය කෙරෙන්නනේ නම් එහිදී අවම වශයෙන් පහත සඳහන් ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. මේ ප්‍රතිපත්ති අනුව සැලකිය යුතු පළමුවෙනිම කරුණ නම් බොරු හේතු හෝ වෙනත් අරමුණක් ඉටුකර ගැනීමේ සැඟවුනු අරමුණු ඇතිව මෙම නීති නිර්මාණය නොකළ යුතු බවය. එනම් සමාජය සාධාරණව පිළිගත හැකි ආකාරයක සාමයට සැබෑ තර්ජනයක් ත්‍රස්තවාදී ක්‍රියා සහ ත්‍රස්ථවාදී සංවිධාන මගින් පැහැදිලිව පෙනෙන තත්වයක් ඇතිවී තිබිය යුතුය. දැනට වර්ථමාන රජය විසින් යෝජනා කර ඇති "ප්‍රතිත්‍රස්තවාදී" පනතේ බිල්පත එනම් (2023 මාර්තු 22 නිකුත් කරන ලද) එවනි සාධාරණ හේතුවක් මත නිකුත් කරන ලද බිල්පතක් නොවේ. එම බිල්පතේ මෙම නීතිය හඳුන්වාදී ඇත්තේ "ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදුකරනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාවලින්, ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් වැරදිවලින් සහ ත්‍රස්ථවාදය පිළිබඳ වරද සංස්ථාවනය වන ඇතැම් නිශ්චිත ක්‍රියාවලින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව ශ්‍රී ලංකාවේ ජනතාව ආරක්ෂා කිරීම සදහාද ශ්‍රී ලංකාවෙන් පිටත ත්‍රස්තවාදය සදහා සූදානම් වීමට ශ්‍රී ලංකාවේ භූමිය හා එහි ජනතාව භාවිතා කිරීම වැළැක්වීම සඳහාද, ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ ත්‍රස්තවාදය ආශ්‍රිත වෙනත් යම් වරදක් සිදුකර ඇත්තා වූ යම් තැනැත්තෙකු හඳුනා ගැනීම, ග්‍රහණය කර ගැනීම, සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම, පරික්ෂණ පැවැත්වීම, නඩු පැවරීම සහ දඬුවම් ලබාදීම සදහා විධිවිධාන සැලැස්වීම පිණිසද, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලක විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහාද, ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සදහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."



නීතිඥ
බැසිල් ප්‍රනාන්දු



# සංහිඳියාවට අමතක වුණු යුක්තිය අයැදින උතුරේ ගෘහ මූලික කාන්තාවෝ

> යුද්ධය, වැන්දඹුවන් බවට පත්කළේ උතුරේ සහ නැගෙනහිර දෙමළ, මුස්ලිම් හා සිංහල කාන්තාවන් පමණක් නොවේ. සටන් පෙරමුණේ සිට සිංහල සොලදාදුවන් දහස් ගණනකගේ බිරින්දෑවරුන්ද වැන්දඹුවන් බවට පත් කළේය. හමුදා වැන්දඹුවන්ට සිය සැමියාගේ අවසන් වැටුපට සමාන විශ්‍රාම වැටුපක් සහ තවත් ප්‍රතිලාභ හිමි වන බැවින් සාමාන්‍ය කාන්තා වැන්දඹුවන්ට සාපේක්ෂව යහපත් ජීවිත ගත කිරීමේ අවස්ථාව හිමිව ඇත. විශේෂයෙන් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය පවත්වාගෙන යෑමට හැකියාව ලැබී තිබේ. මෙබඳු යුක්තියක්, සෙසු කාන්තාවන් හා දරුවන් වෙනුවෙනුත් ඉටු විය යුතු නොවේද? දශක තුනක සිවිල් යුද්ධය රටපුරා පැතිර ගිය කාලයේදී උතුරු නැගෙනහිරවත්, දකුණේවත් කිසිදු කාන්තාවක් සිය කැමැත්තෙන් ගෘහමූලික කාන්තාවක් බවට පත්වූයේ නැත. ඔවුනට තබා කිසිම පුරවැසියෙකුට අවැසි නොවූ, යුද වැදුණු පාර්ශ්වවල අවශ්‍යතාවට ඇතිකරගත් අවි ගැටුම් හේතුවෙන් ජාති, ආගම්, වයස් ,වර්ග භේදයකින් තොරව පුරවැසියන්ට සිය ජීවිතවලින් මෙසේ වන්දි ගෙවන්නට සිදුවීම ඛේදජනකය.

එළඹෙන මැයි මස 18 වෙනිදාට, දශක තුනක් පුරා ශ්‍රී ලංකාව තුළ පැවති යුද්ධය නිමා වී වසර 14ක් සපිරේ. පිරිසක් රට පුරා 'යුධ ජයග්‍රහණයක්' සැමරුමට සැරසෙති. තවත් පිරිසක් යුද්ධයේ අම්හිරි ම අත්දැකීම් ලැබ, සියල්ල අහිමිව 'සිය කඳුල' සමරන්නට සැරසෙති. එහෙත්, කුමන සැමරුම් තුළ වුවද, යුද්ධය විසින් උපරිම දඬුවම් ලබාදෙමින් ගෘහමූලික කාන්තාවන් බවට පත්කළ, උතුරේ සහ නැගෙනහිර දෙමළ හා සිංහල මව්වරුන්ගේ ජීවිත තවමත් ගෙවෙන්නේ කම්පනය, දරිද්‍රතාව, සමාජ ප්‍රචණ්ඩත්වය, සංස්කෘතික සහ ආගමික කෙනෙහිලිකම් සහ මානසික ආතතීන් අතර සිර වෙමිනි. වසර ගණනාවක ප්‍රයත්නයකින් පසුව පැමිණි සංක්‍රාන්තික යුක්තිය වෙතින් ද තාවකාලික පිළිසරණ මිස ඔවුන් වෙත ඉටුවුණු තිරසර යුක්තියක් හෝ සාධාරණයක් නොමැත. ඔවුන්ගේ පුරවැසි හිමිකම් අහිමිවී ගොසිනි.

එක්සත් ජාතීන්ගේ ඇස්තමේන්තුවලට අනුව, 2009 මැයි 19 වන දා අවසන් කළ බවට  ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාවේ දිගුකාලීන සන්නද්ධ ගැටුමේ අවසාන මාසවල දී 40,000ත් 70,000ත් අතර උතුරු නැගෙනහිර සිවිල් වැසියන් සංඛ්‍යාවක් මිය ගිය අතර, තවත් 150,000ක් පමණ වැසියන් 30 වසරක් පුරා ඇදුණු රජයේ සහ බෙදුම්වාදී දෙමළ කොටි සංවිධානයේ කුරිරුකම්වලින් ජීවිතයට සමු දී ඇත. ගැහැණු පිරිමි භේදයකින් තොරව 65,000ක් පමණ දෙනා අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාවලට එක්වන අතර, තවත් දස දහස් ගණනක් පවුල් සිය පාරම්පරික ගේදොර ඉඩම්වලින් මහමගට ඇද දමා 'අවතැන්වූවන්' යන ලේබලය යටතට වැටුණි. ඇතැමෙක් අදටත් යාපනය අර්ධද්වීපයේ ස්ථාපිත 'අවතැන් කඳවුරුවල' සිය ජීවිත ගෙවා දමන්නේ දරුණු කළකිරීම, ගැඹුරු විඩාව සහ දරාගත නොහැකි අපේක්ෂාභංගත්වයෙනි. යාපනය දිස්ත්‍රික් ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරයේ සම්බන්ධීකාරක නාගමුත්තු ඉන්බනායගම් ට අනුව, උතුරේ පමණක් අවතැන් කඳවුරු 48ක් පැවති අතර, වර්තමානයේදි යාපනයේ පමණක් සභාපති, නීලවාන්, යෝගපුරම් යනාදි වශයෙන් අවතැන් කඳවුරු 09ක් පවතියි.

## උතුරේ හා නැගෙනහිර අසූනවදාහක්

පාරම්පරික රැකියා බිම්, ගෙවල් දොරවල් උන්හිටිතැන් සියල්ලද අහිමිව, තම ස්වාමිපුරුෂයා, පියා හෝ සහෝදරයා ජීවිතක්ෂයට පත් ව, යුද්ධයේ උපරිම දඬුවමට යටත් වෙමින් 'ගෘහ මූලික කාන්තාවන්' යන මුද්‍රාව හිමිකරගත්, කාන්තාවන් 89,000ක ලැයිස්තුවක් තමන් සතු බව එවකට කාන්තා කටයුතු හා ළමා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මාධ්‍යයට ප්‍රකාශ කළේය. (2010 සැප්තැම්බර් 29)

එම පිරිසෙන් කාන්තාවන් 40,000ක් උතුරු පළාතෙන්ද 49,000ක් නැගෙනහිර පළාතෙන්ද වූ අතර, වයස අවුරුදු 40ට අඩු 12,000ක් සහ අවම වශයෙන් දරුවන් තිදෙනෙකු සිටි කාන්තාවන් 8,000ක් වූ බව එම සංඛ්‍යාලේඛන සඳහන් කළේය.

එහෙත් යාවත්කාලීන නොවන, 2020 වසරේ දී ගණනය කළ උතුරු නැගෙනහිර ප්‍රා.ලේ. කාර්යාල දත්තවලට අනුව උතුරේ ගෘහමූලික කාන්තාවන් 67,000ක්ද, නැගෙනහිර 127,000ක්ද වෙති. (යාපනය 35,000ක්, මන්නාරම 5,000ක්, වව්නියාව 14,000ක්, මුලතිව් 6,000ක්, කිළිනොච්චි 7,000ක්, මඩකළපුව 51,000ක්, අම්පාර 45,000ක්  සහ ත්‍රිකුණාමලය 28,000ක් වශයෙනි.) (දත්ත ලබාගැනීම 2023 මැයි 07) 2015 දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට එවක පැවති ආණ්ඩුව දුන් නිර්හීත පොරොන්දු වන සත්‍ය සෙවීමේ කොමිසමක්, විශේෂ අධිකරණයක් සහ අතුරුදහන්වූවන් පිළිබඳ විමර්ශනය කිරීමට සහ වන්දි ලබාදීමට කාර්යාලයක් පිහිටුවීම ඇතුළුව ගැටුම්වලින් පීඩාවට පත්වූ සියලු දෙනාගේ හදිසි ආර්ථික හා මනෝ සමාජීය අවශ්‍යතා ඉටුකරලීමට පවා රජය මේ වනතුරු අසමත් වී ඇත.

## ජීවත්වීමේ අභියෝගය

මන්නාරම, මුලතිව්, කිලිනොච්චි,

ත්‍රිකුණාමලය සහ කල්මුණේ යන ප්‍රදේශවල ජීවත්වන දෙමළ, සිංහල සහ මුස්ලිම් ගෘහමූලික කාන්තාවන් පනස් දෙනෙකු සමග පැවැත්වූ සංවාදයේදී රජයෙන් ලැබෙන සහන පිළිබඳ අප ඉදිරිපත් කළ ප්‍රශ්නයට ඔවුන්ගේ පිළිතුර වූයේ, සමෘද්ධි ආධාරය මාසිකව ලැබෙන නමුත් එය අතීතයේ මෙන්ම වර්තමානයේද පවතින භාණ්ඩ මිල ඉහළ යෑමට සාපේක්ෂව කිසිසේත් ප්‍රමාණවත් නොමැති බවයි. කෝවිඩ් වසංගතය හමුවේ සහ වෙනත් ව්‍යසන අවස්ථාවකදී ලබාදෙන සහන මල්ලක් හැරුණු කොට නිත්‍ය වශයෙන් රජයෙන් ලබාදෙන වෙනත් කිසිදු අතදීමක් හෝ දිරිදීමක් නොමැති බවයි.

එදා ජීවනෝපාය සඳහා යැයි හරකෙකු, එළුවෙකු, කුකුලන් කිහිපදෙනෙකු ලබාදුන්නද එම ජීවනෝපායන් සාර්ථක කර ගැනීමට සමත් වී ඇත්තේ කිහිපදෙනෙකු පමණි. ඇතැමෙක් පැවසුවේ කුඩා දරුවන් කිහිප දෙනෙකු සමග හිස තබාගැනීමටවත් නිසි තැනක් නොමැතිව දිවි ගෙවීමට සිදුවීම තුළ එකී ජීවනෝපායන් අසාර්ථක වූ බවයි. විශාල මානසීක කම්පනයක් සමඟ පොරබදිමින් ජීවිත ආරම්භ කළ ඔවුනට ඊට වඩා මානුෂීය ආකාරයේ අත්වැලක් සැපයි යුතුව තිබුණු බව ඔවුන් බොහෝ දෙනෙකුගේ ආකල්පයයි.

රාජ්‍ය නොවන සංවිධාන, දේවස්ථාන හෝ ඒ හා සම්බන්ධ ආයතනවලින් ලබාදූන් සහ දැනටත් ඉඳහිට හෝ ලබාදෙන ආර්ථික අතදීම් යාන්තම් හෝ හිස ඔසවාගෙන ජීවත්වීමට උපකාරී වූ බවත්, පැවති හෝ පවතින ආණ්ඩුවකින් නිසි ආකාරයේ ආර්ථික වැඩපිළිවෙළක් හෝ අධ්‍යාපනය හදාරන දරුවන් වෙත තිරසර අතදීමක් සිදු නොවූ බවත් ඔවුහු පැවසූහ.

එදා යුද්ධය විසින් සිය සැමියා පියා හෝ සහෝදරයා පැහැරගැනීම නිසා ගෘහමූලිකත්වයට පත් ඇතැම් කාන්තාවෝ අද වයෝවෘද්ධ තත්ත්වයෙන් පසුවෙති. ඇතැමෙක් මිය ගොසිනි. ඇතැමෙක් ආබාධිත තත්ත්වයටද මානසික රෝගී තත්ත්වයටද පත්ව සිටිති. තවත් අය දරුවන් මෙන්ම මුණුපුරු මිනිපිරියන්ද රකින්නට දැවැන්ත ජීවිත සටනක යෙදෙන, වයසට වඩා දුර්වල මානසික හා ශාරරීක ආතතියකින් පෙළෙන්නියන්ය. “බලහත්කාරයෙන් අපේ කරමත පැටවුණු මේ පීඩාවෙන් විනාශයට පත් අපට සැනසීමක් ලබන්නේ කවදාදැයි අපි දන්නේ නැහැ” යන්න ගෘහමූලික කාන්තාවන් බොහෝ දෙනෙකුගේ හිත අද්දර මුද්‍රණය වී ඇත.

### රීටා නම් සයදරු මව

පූනගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වලෛයිප්පාඩු ග්‍රාමයේ ජීවත්වන වයස අවුරුදු 49ක් වන වින්සන් ද පෝල් ඈන් රීටා දරුවන් හයදෙනෙකුගේ මවකි. ඇය ගෘහමූලික කාන්තාවක් බවට පත් වන්නේ, 2008 සිට බොහෝවර අවතැන්වීමෙන් පසුව, 2009 වසරේ පෙබරවාරි 02 මුලතිව් විශ්වමඩු ප්‍රදේශයේ ඔවුන් ජීවත් වෙමින් සිටි බංකරය තුළටම එල්ල වුණු ෂෙල් ප්‍රහාරයක් හේතුවෙනි. වේදනා පිරි දැඩි තුවාල සමඟින් රෝහල්ගත කළ සැමියා ජීවිතයත් මරණයත් අතර සටනකින් පසුව පෙබරවාරි 05 වෙනිදා දැස් පියාගෙන ඇති අතර, ගෙයක් දොරක් හිමිව සිටියද ඔවුන්ගේ නොවන යුද්ධයක් නිසා උපන් ගෙදර අහිමි වූ ඇයට, සිය සැමියාගේ නිසල දේහය රෝහල භාරයේ මිහිදන් කරන්නට සිදු විය. අනතුරුව, සිය කුඩා දරුවන් සය දෙනා සමග පුදුමාතලන් හරහා රැකවරණ පතා ඉදිරියට යන ගමනේදී ඒ ගමන් කළ පිරිසට එල්ල වූ වෙඩි ප්‍රාහාරවලින් ඇයගේ පපු ප්‍රදේශයටද තුවාල සිදුව තිබුණි.

පසුව ආනන්ද කුමාරස්වාමි කඳවුරේ ජීවත්වූ ඔවුන් 2009 දෙසැම්බර් 22 දා නැවතත් සිය වලෛයිපාඩු ගමට ගොස් බෝම්බ අවි ප්‍රහාරවලින් විනාශ වූ නිවසේ කූඩාරමක් අටවා ගෙන ජීවිත ආරම්භ කර ඇත. කතෝලික සභාවේ යාපනය කරිටාස් හියුඩෙක් ආයතනය විසින් තමන්ගේ නිවස මෙන්ම අන් අයගේ නිවාසද යළි ගොඩනගා දී තිබුණු අතර එවක පැවති ආණ්ඩුවෙන් ප්‍රා.ලේ. කාර්යාලය හරහා රුපියල් 35,000 බැගින් ජීවනාධාර ලබා දී තිබුණි. මුලදී වතාවන් කිහිපයක් මුදල් ආධාර සිදු කර තිබුණි.

කරිටාස් හියුඩෙක් ආයාතනයෙන් නිවෙස මෙන්ම බෝට්ටුවක් හා ඇන්ජිමක්ද, සෝවා ආයාතනයෙන් එළුවන් සහ නැෆ්සෝ ආයතනයෙන් කරවල වෙළදාම සඳහා රුපියල් 25,000ක මුදල් ආධාරයක්ද ලද ඇය ඒවා සකසුරුවමින් මෙහෙයවා දරුවන් හයදෙනෙක් උස මහත් කළාය. එහෙත් වර්තමානයේදී ඇය මුහුණ දෙන ප්‍රධානම අභියෝගය වන්නේ වත්මන් ආර්ථික අර්බුදයක් සමඟ අධ්‍යාපනය හදාරන දරුවන් සිව්දෙනා නඩත්තු කිරිමයි. ඉඳහිට පාසැලෙන් ආධාර ලැබෙන මුත්, දහය වසර, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ පන්තිවල අධ්‍යාපනය ලබන දරුවන් හතරදෙනා අධ්‍යාපනයෙන් එතෙර කර ගැනීම කිලිනොච්චියේ දිවි ගෙවන ගෘහමූලික ඈන් රීටාගේ අභියෝග යයි; එකම සිහිනයයි.

### නජීමාගේ කතාව

නැගෙනහිර පළාතේ කල්මුණේ ජීවත්වන එම්. නජීමා (49) සිවිල් යුද්ධය නිසා ඉතාම අවාසනාවන්ත ඉරණමකට සිය ජීවිතය පූජා කළ කාන්තාවකි. නැගෙනහිර පළාත තුළ එල්ටීටීය සහ ඉන්දියන් හමුදාව අතර දරුණු සටන් ඇවිළ ගිය අවධියේදී එළුවන් විකිණීමට ගොස් ආපසු නොපැමිණි සිය පියාගේ අතුරුදහන් වීම අදටත් අභිරහසකි. සෙවීම නිෂ්ඵල වූ අතර ඇගේ පියාද අතුරුදහන්වූවන්ගේ නාම ලේඛනයට එක් වූ තවත් එක් පුද්ගලයකු පමණක් විය. පියාගේ අතුරුදහන්වීම දරාගත නොහැකිව දැඩි කම්පාවට පත් වූ නජීමාගේ මව දැඩිව රෝගාතුරව, පවුලේ

**එහෙත් යාවත්කාලින නොවන, 2020 වසරේ දී ගණනය කළ උතුරු නැගෙනහිර ප්‍රා.ලේ. කාර්යාල දත්තවලට අනුව උතුරේ ගෘහමූලික කාන්තාවන් 67,000ක්ද, නැගෙනහිර 127,000ක්ද වෙති. (යාපනය 35,000ක්, මන්නාරම 5,000ක්, වව්නියාව 14,000ක්, මුලතිව් 6,000ක්, කිළිනොච්චි 7,000ක්, මඩකළපුව 51,000ක්, අම්පාර 45,000ක් සහ ත්‍රිකුණාමලය 28,000ක් වශයෙනි.) (දත්ත ලබාගැනීම 2023 මැයි 07) 2015 දී එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කවුන්සිලයට එවක පැවති ආණ්ඩුව දුන් නිර්භීත පොරොන්දු වන සත්‍ය සෙවීමේ කොමිසමක්, විශේෂ අධිකරණයක් සහ අතුරුදහන්වූවන් පිළිබඳ විමර්ශනය කිරීමට සහ වන්දි ලබාදීමට කාර්යාලයක් පිහිටුවීම ඇතුළුව ගැටුම්වලින් පීඩාවට පත්වූ සියලු දෙනාගේ හදිසි ආර්ථික හා මනෝ සමාජීය අවශ්‍යතා ඉටුකරලීමට පවා රජය මේ වනතුරු අසමත් වී ඇත.**



දරුවන් හදාවඩා ගන්නට නොහැකිව මානසික රෝගියකු බවට පත්ව ඇත. නජීමාට පවුලේ බර කරට ගන්නට සිදු වූ අතර කාලයාගේ ඇවෑමෙන් මවද මියගිය පසුව, යුද්ධයේ අකාරුණික බලපෑම නිසා තමන්ට වඩා වසර 30කින් වැඩිමහල් පුද්ගලයෙක් සමග විවාහ වන්නට ඇයට සිදු විය.

**එම විවාහය, පියාගේද අතුරුදහන් වීම තුළ මෙතෙක් තමන් වෙළාගෙන පැවති මානසික පීඩාව තව තවත් තීව්‍ර කළා මිස සිදු වූ සෙතක් නොමැති බව තවමත් තෙත් වන දෑස් ඇගේ හෘදසාක්ෂිය කියාපායි. ඔහුට දාව නජීමාට එක් දියණියක් සිටින අතර, ඇය ලබන වසරේදී අපොස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටී. ඇගේ පාසැල් ගමන සරල සෞම්‍ය ගමනක් නොව දැඩි ආර්ථික අපහසුතා මැද අසීරුවෙන් ඔසවාගෙන යන්නකි. නජීමාගේ මහළු සැමියා මෑතකදී මිය ගොස් ඇති අතර, ඇඳුම් මැසීමෙන් උපයාගන්නා සොච්චමින් දියණිය සමඟ දිවි ගැටගසා ගන්නීය.**

කොවිඩ් වසංගතය සමයේදී ලද ආධාර හැරුණුකොට ඔවුන්ට වෙනත් යමක් ලැබී නැත. විටින් විට ලබාදෙන ආධාරවලට වඩා, අවම වශයෙන් ගෘහමූලික කාන්තාවන්ගේ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඉදිරිපත් වන්නේ නම් එය බොහෝ සේ වටින බව නජීමාගේ අදහසයි.

**නිහඬවීමට බල කිරීම!**

සිය අනන්‍යතාවය පළනොකර සිටින්නැයි ඉල්ලාසිටි, නැගෙනහිර පළාතේ අසාධාරණයට පත් කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාකරන සංවිධානයක උප සභාපතිනිය කියා සිටියේ මුස්ලිම් ආගම ප්‍රමුඛව සිය ජන සමාජය තුළ ඇති ආකල්ප මත, ගෘහමූලික බවට පත් මුස්ලිම් කාන්තාවන්ගේ පීඩනය, දරිද්‍රතාව හා ඔවුන් මුහුණදෙන අසාධාරණයන් පිළිබඳව සාකච්ඡා කරන්නට හෝ විසඳුම් සඳහා බලපෑමක් කරන්නට එකී කාන්තාවන්ට සමාජමය අවකාශයක් සැලසී නොමැති බවයි. එමෙන්ම ඔවුන්ගේ පවුල්වල පුද්ගලයින් විසින්ද මෙවැනි ප්‍රශ්න පසුපස හඹා යෑමට වඩා නිශ්ශබ්දව දෙවන විවාහයක් සිදුකර ගැනීමට බලපෑම් කරනු ලබන බවත් ඔවුන්ගේ සමාජය තුළ මෙවැනි අසාධාරණයකට, කණ්ඩායමක් වශයෙන් ඒකරාශීව කටයුතු කළ යුතු යැයි යොමුවක් නොතිබුණු බවත් ඇය පැවසුවාය. අතුරුදහන්වූවන් සොයන්නට යෑමේදී ජීවත්ව සිටින අයටද බලපෑම් එල්ලවේය යන ආකල්පය මත හැකිතාක් එවැනි අවස්ථාවලින් ඉවත්ව සිටීමට ඔවුන් හුරුව ඇත.

**කාර්මලිට්ට්‍රා- නොනිමි ගිනි මැද**

වර්තමානයේදී මන්නාරමේ ජීවත්වන අරුමනායගම් කාර්මලිට්ට්‍රා (53) දරුවන් 05දෙනෙකුගේ මවකි. යුද්ධයෙහි ප්‍රතිඵලයක් ලෙස ඇයට ස්වාමිපුරුෂයාත් එක් පිරිමි දරුවෙකුත් අහිමි වී ඇත. යුද්ධය පැවති සමයේදී පිටස්තර සම්බන්ධතා පැවැත්වීමට නොහැකි වීමත්, සෞඛ්‍ය සේවා හා රෝහල් පද්ධති අකර්මණ්‍ය වීමත් හේතුවෙන් ගුරු සේවයෙහි නිරතව සිටි කාර්මලිට්ට්‍රාගේ සැමියා, උණ රෝගය වැළඳී වෛද්‍ය ආධාර ලබාගැනීමට නොහැකිව දින තුනකට පසුව මියගොස් ඇත. එම අවස්ථාවේදී සැමියාගේ වයස 45ක්ද කාර්මලිට්ට්‍රාගේ වයස 33ක්ද වූ අතර, අවුරුදු 14, 12, 10, 8, සහ 6 යන වයස්වල ගැහැණු දරුවන් දෙදෙනෙක් සහ පිරිමි දරුවන් තිදෙනෙක් ඇති දැඩි කර ගැනීමේ ගෘහමූලික වගකීම ඇය මත පැවරිණි.

කුඩා දරුවන් පස්දෙනෙකු නඩත්තු කිරීම සුළුපටු කාර්යයක් නොවන බැවින් නොයෙකුත් කුලී වැඩ කරමින් හිඳ එය ද ප්‍රමාණවත් නොවූ නිසා ඇය ඉස්සන් නිෂ්පාදනාගාරයක රැකියාවක් තෝරාගත්තාය. එම රැකියා ස්ථානයේ බොහෝ පුරුෂ පක්ෂයද සේවය කරන අතර විවිධ හිංසනයන්ට මුහුණ දෙන්නට ඇයට සිදුව ඇත. ස්වාමි පුරුෂයා අහිමි කාන්තාවන් වෙත සමාජයෙන් ද එල්ලවන කොන්කිරීම්, නොසලකා හැරීම් සහ විවිධ දෝෂාරෝපනවලට ලක්කිරීම් යනාදියටද ඇය මුහුණ පෑවාය. වසර 10ක් සේවය කළ ගුරුවරයෙකු වූ සැමියාගේ විශ්‍රාම වැටුප ඇයට ලැබීම හේතුවෙන් රජයෙන් ලබාදුන් කිසිදු ආධාරයක් ඇයට හිමි නොවූ අතර එම වැටුප ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, දරුවන් පස්දෙනකු සමග දිවි ගැටගසාගැනීමට ඇයට මහත් පරිශ්‍රමයක් දැරීමට සිදු විය.

2008 වසරේදී කාර්මලිට්ට්‍රාගේ එක් පිරිමි දරුවෙක්, සිය ආච්චි අම්මා ඇතුළු ඥාතීන් බැහැදැකීමට පේසාලේ සිට මුලන්කාවිල් වෙත ගිය ගමනේදී අවසානාවන්ත ලෙස අතුරුදන් විය. පොලීසියටද මානව හිමිකම් කොමිසමටද පැමිණිලි කළ නමුත් අද වන තුරු කිසිදු තොරතුරක් ලැබී නැත.

**එකම යුද්ධයක් - ඉරණම් දෙකක්**

යුද්ධය, වැන්දඹුවන් බවට පත්කළේ උතුරේ සහ නැගෙනහිර දෙමළ, මුස්ලිම් හා සිංහල කාන්තාවන් පමණක් නොවේ. සටන් පෙරමුණේ සිට සිංහල සොලදාදුවන් දහස් ගණනකගේ බිරින්දෑවරුන්ද වැන්දඹුවන් බවට පත් කළේය. හමුදා වැන්දඹුවන්ට සිය සැමියාගේ අවසන් වැටුපට සමාන විශ්‍රාම වැටුපක් සහ තවත් ප්‍රතිලාභ හිමි වන බැවින් සාමාන්‍ය කාන්තා වැන්දඹුවන්ට සාපේක්ෂව යහපත් ජීවිත ගත කිරීමේ අවස්ථාව හිමිව ඇත. විශේෂයෙන් ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය පවත්වාගෙන යෑමට හැකියාව ලැබී තිබේ. මෙබඳු යුක්තියක්, සෙසු කාන්තාවන් හා දරුවන් වෙනුවෙනුත් ඉටු විය යුතු නොවේද?

දශක තුනක සිවිල් යුද්ධය රටපුරා පැතිර ගිය කාලයේදී උතුරු නැගෙනහිරවත්, දකුණේවත් කිසිදු කාන්තාවක් සිය කැමැත්තෙන් ගෘහමූලික කාන්තාවක් බවට පත්වූයේ නැත. ඔවුනට තබා කිසිම පුරවැසියෙකුට අවැසි නොවූ, යුද වැදුණු පාර්ශ්වවල අවශ්‍යතාවට ඇතිකරගත් අවි ගැටුම් හේතුවෙන් ජාති, ආගම්, වයස් ,වර්ග භේදයකින් තොරව පුරවැසියන්ට සිය ජීවිතවලින් මෙසේ වන්දි ගෙවන්නට සිදුවීම ඛේදජනකය. අහිමිවූ සිය ඥාතියා වෙත යළි ප්‍රාණය දිය නොහැක. අහිමි වූ ඔවුන්ගේ ගේ දොර, බිම් , රැකියාවන් යළි ලබාදිය නොහැකි නම්, ආණ්ඩුවක යුක්ති සහගත ක්‍රියාව විය යුත්තේ කෙටි කාලීන හුදු ව්‍යාපෘති හරහා පැලැස්තර දැමීම නොව, හානි පූර්ණය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම වගවීමයි.

**යුද්ධය අවසන් වී වසර 14ක් සපුරන මේ මොහොතේදීවත්, යුද්ධයෙන් වැඩිපුරම බැටකා සිටින උතුරු නැගෙනහිර ගෘහමූලික කාන්තාවන් වෙත අර්ථාන්විත සංක්‍රාන්තික යුක්තියක් ඉටු විය යුතු නොවේද?**



**සටහන :**
**මෙලනි මානෙල් පෙරේරා**

**පරිවර්තන සහය - ඇන්තනි ජේසුදාසන්**
**විශේෂ ස්තුතිය - ඉන්ටර්නිවුස් ආයතනය**

melani.journalist@gmail.com




# කඳුළු ගෑස් කියන එක හඳුන්වන්නේ

# අඩු මාරාන්තික අවියක් විදිහට



"විශේෂයෙන් බලපුවාම සාමකාමී උද්ඝෝෂණවලදී කඳුළු ගෑස් යොදා ගන්නා බව මම දැක්කා. එය මූලික අයිතිවාසිකම් කඩකිරීමක්. උද්ඝෝෂණවලට දඬුවම් කිරීමක් හැටියට කඳුළු ගෑස් භාවිතා කරනවා මම දැක්කා. ඒ වගේම මිනිසුන්ගේ අයිතිවාසිකම් යටපත් කිරීමට කඳුළු ගෑස් භාවිතා කරනවා අපි දැක්කා. පටු වීදිවලද කඳුළු ගෑස් යොදා ගන්නවා දැක්කා. නොකළ යුතු දේවල් හැටියට තමා ඒවා සඳහන්වෙලා තියෙන්නේ. එක දිගට කඳුළුගෑස් යොදා ගැනීම සම්පූර්ණයෙන්ම නොකළ යුතු දෙයක්. පැහැදිලිව මෙයින් දැක්වෙන දේ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය කඩවීම. එයත් අප රටේ මූලික අයිතිවාසිකමක්. සාමකාමී රැස්වීමේ නිදහස කඩවෙනවා අපි අනන්ත වාරයක් දැක්කා පසුගිය කාලය පුරාවටම. මට කියන්න තියෙන්නේ මේ වගේ තත්තවයක් තමයි. කිසිම නීතියක්, කඳුළු ගෑස් කියන වචනයවත් නැහැ. කඳුළු ගෑස් කියන එක හඳුන්වන්නේ අඩු මාරාන්තික අවියක් විදිහට. එහෙම වචනයක් කොහේවත් නැහැ. දැන් ලෝකයේ යන ප්‍රවණතාවය තමා කඳුළු ගෑස් තහනම් කරන්න කියන එක. රාජ්‍යයන් අතරේ යුද්ධයකදී වුව කඳුළු ගෑස් භාවිතා කිරීම තහනම් කර තිබෙනවා. මොකද කඳුළු ගෑස් රසායනික අවියක් නිසා.

1914දී ප්‍රථම වතාවට ජර්මන් බලඇනි පලවා හැරීමට ප්‍රංශය විසින් කඳුළු ගෑස් භාවිතා කරන ලද අතර අනෙකුත් රසායනික හා ජීව අවි අතර කඳුළු ගෑස් තහනම් කිරීමේ පළමු අන්තර්ජාතික උත්සාහය වන්නේ 1 වන ලෝක යුද්ධයෙන් පසු 1925දී ජාතීන්ගේ ලීගය විසින් ගෙන එන ලද ජිනීවා ප්‍රොටෝකෝලයයි. හුස්ම හිර කරවන, විශ සහිත හෝ වෙනත් ගෑස් යුද්ධවලදී භාවිතා කිරීම මෙම ප්‍රොටෝකෝලය මගින් තහනම් කරනු ලැබූ අතර කඳුළු ගෑස් මෙම කාණ්ඩ තුනෙන් ඕනෑම එකකට වැටීමේ හැකියාව තිබුණත් එය නිශ්චිතව දක්වා නොතිබීම හේතුවෙන් වෙනත් රාජ්‍යයන් මෙම ප්‍රොටෝකෝලය මගින් කඳුළු ගෑස් තහනම් බව සලකමින් ක්‍රියා කරද්දී ඇමරිකාව එම නොපැහැදිලි බව ප්‍රයෝජනයට ගනිමින් වියට්නාම් යුද්ධයේදී කඳුළු ගෑස් අධික ලෙස යොදා ගන්නා ලදී.

ලෝකයේ කාලයක් පුරාවට භාවිතා වූ කඳුළු ගෑස් 1993දී රටවල් 193ක් විසින් අත්සන් තැබූ එක්සත් ජාතීන්ගේ රසායනික අවි ගිවිසුමට අනුව යුද්ධයන්වලදී භාවිතා කිරීම ජාත්‍යන්තර වශයෙන් තහනම් කරන අතර ශ්‍රී ලංකාවද 1993 ජනවාරි 14 වන දින මෙයට අත්සන් තබා පසුව මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 2007 අංක 58 දරණ රසායනික අවි සම්මුතිය පනත සම්මත කර ඇත. එම පනතේ 19 (1) (ට) වගන්තිය ප්‍රකාරව කැරලි මර්ධන නියෝජිත ද්‍රව්‍ය යටතේ වන කඳුළු ගෑස් යුද්ධයකදී භාවිතා කිරීම වසර 20ක් දක්වා සිර ගත කළ හැකි අපරාධ වරදක් බවට පත් කිරීම තුළ පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ නීතිය තුළද කඳුළු ගෑස් රසායනික අවියක් ලෙස සලකා ඇති බවයි.

ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන එක්සත් ජාතීන්ගේ රසායනික අවි ගිවිසුම මගින් යුද්ධයන්වලදී කඳුළු ගෑස් භාවිතා කිරීම තහනම් කිරීමට හේතු ලෙස සඳහන් වන්නේ යුද්ධයකදී, සටන් වදින සෙබලා සහ සිවිල් වැසියා වෙන් කර හඳුනා ගැනීමට කඳුළු ගෑස්වලට ඇති නොහැකියාවයි. කෙසේ වුවත් දේශීය වශයෙන්ද කැරලි මර්ධනයට කඳුළු ගෑස් භාවිතා කිරීමේදී තරුණ හෝ මහලු බව, රෝගී නිරෝගී බව, සාමකාමී හෝ ප්‍රචණ්ඩ බව කඳුළු ගෑස්වලට වෙන් කර හඳුනා ගැනීමට නොහැකි නිසා රාජ්‍යයන් කඳුළු ගෑස් තහනම් කළ යුතු බව පෙනෙන්නට තිබේ. උද්ඝෝෂණයකට ක්‍රියාකාරී ලෙස සහභාගී වූවකුද, හුදු ඒ දෙස බලා සිටි අයෙකුද යන්න සැලකීමකින් තොරව පුරවැසියන්ගේ සෞඛ්‍යයට මෙමගින් දැඩි හානි සිදුවේ. යුද්ධයන්හිදී කඳුළු ගෑස් භාවිතා කිරීම තහනම් කිරීම හරහා කඳුළු ගෑස් යනු යුද්ධයකදීවත් භාවිතා කිරීම පිළිගනු නොලබන හානිකර අවියක් බවට සම්මතයක් ලෝක මට්ටමින් ගොඩ නැගී ඇති අතර ශ්‍රී ලංකාවද එය පිළිගෙන ඇත. 1993 රසායනික අවි ගිවිසුම යටතේ කඳුළු ගෑස් දේශීය වශයෙන් භාවිතා කිරීම තහනම් නොකිරීම හුදු දේශපාලනික සාකච්ඡාවලදී සියලු රටවල් ගිවිසුම අත්සන් කිරීමට එකඟ කරවා ගැනීම සඳහා දරණ ලද උත්සාහයේදී මගහැරීගිය අත්‍යවශ්‍ය කොටසක් ලෙස දැක්විය හැක. කඳුළු ගෑස් සම්බන්ධ මෙම ජාත්‍යන්තර සම්මතය නැවත වතාවක් තහවුරු කරන ලද අවස්ථාවක් ලෙස ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ 8 වන ව්‍යවස්තාවට අනුව සන්නද්ධ අරගලවලදී රසායනික අවි භාවිතා කිරීම තහනම් කිරීම යටතේද කඳුළු ගෑස් තහනම් කර තිබීම දැක්විය හැකිය.

ජාත්‍යන්තර වශයෙන් කඳුළු ගෑස් භාවිතා කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් තියෙන ලේඛනයක් තමා United Nations Human Rights 'Guidance on Less-Lethal Weapons in Law Enforcement, 2020. මෙහි තියෙනවා කඳුළු ගෑස් යම් රාජ්‍යයක් භාවිතා කරනවා නම් කළ යුතු දේවල්. අපේ රටේ ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් කරලා නැහැ. කොහොමත් කඳුළු ගෑස් කියන එක භාවිතා කිරීම සුදුසු දෙයක් නෙමේ. මෙය රසායනික අවියක්. මේකෙන් සිදුවෙන දේ සම්බන්ධයෙන් තාම පර්යේෂණයකට ලක් කරලා හරි නිගමනයකට එළඹිලා නැහැ. විශේෂයෙන්ම මා සඳහන් කරනවා ජාත්‍යන්තර වශයෙන් කඳුළු ගෑස් රාජ්‍ය අතර නතර කිරීම තුළින් පුරවැසියන් ආරක්ෂා කිරීමට විශාල පසුබිමක් සකස්වෙලා තියෙනවා. 2014 වර්ෂයේදී දකුණු කොරියාව බහරේනයට කඳුළු ගෑස් යවන එක නතර කරලා තියෙනවා, බහරේනය දිගින් දිගටම කඳුළු ගෑස් භාවිතා කිරීම හේතුවෙන්. ඒ වගේම 2019දී බ්‍රිතාන්‍ය, හොංකොං රාජ්‍යයට කඳුළු ගෑස් යවන එක නතර කරලා තියෙනවා. හොංකොං රාජ්‍ය දුම්රිය උමං මාර්ග තුළදී කඳුළු ගෑස් ගැහැව්වා ළමයින්ට. ඒ නිසා බ්‍රිතාන්‍ය නතර කරනවා කඳුළු ගෑස් යවන එක. ඊට පස්සේ ස්කොට්ලන්තය, ඇමරිකාවට කඳුළු ගෑස් යවන එක නතර කරනවා. 2019 වර්ෂයේදී ඇමරිකාවේ කඳුළු ගෑස් ගහන එක තාවකාලිකව නතර කරනවා. ඒ වගේම ඇමරිකාවේ දැනටත් එක එක අවස්ථාවලදී කෙටුම්පත් ගෙනැවිත් තිබෙනවා. කඳුළු ගෑස් ගහන එක සම්පූර්ණයෙන්ම නතර කිරීම සම්බන්ධයෙන්.

**විශේෂයෙන්ම අපි පර්යේෂණයේදී ගොඩාක් සලකා බලපු එකක් තමයි කැනඩාවේ ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය කරලා තියෙනවා පර්යේෂණයක් කඳුළු ගෑස් සම්බන්ධයෙන්. එතකොට පැහැදිලිවම ප්‍රකාශ කරලා තියෙනවා. ලෝකේ තියෙන ලොකු ව්‍යාපාරයක් කියලා. විශාල ලාභයක් උපයා ගත හැකි ව්‍යාපාරයක් තමා කඳුළු ගෑස් කියන්නේ. එතකොට මේ කඳුළු ගෑස්වල හරි ප්‍රමිතියක් නැතිකම මේ සඳහා පාවිච්චි කරන්නේ මොනවාද කියලා. හරියට එකඟතාවයක් නැතිකම නිසා විශාල ලෙස ලාභ ලැබිය හැකි රසායනික අවියක්. මේ සමග තමා අපි ගනුදෙනු කරන්නේ.**

කඳුළු ගෑස් සම්බන්ධයෙන් අපේ රටේ කොහොමද තක්සේරු කරන්නේ කියලා ශ්‍රී ලංකා පොලීසියෙන් කඳුළු ගෑස් ගහන එක සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා තිබුණා. ප්‍රමිතියෙන් තොර කඳුළු ගෑස් භාවිතය පිළිබඳ චෝදනා ශ්‍රී ලංකා පොලීසිය ප්‍රතික්ෂේප කරයි. තවදුරටත් ප්‍රකාශ කරලා තිබුණා පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා, පොලීසිය නීති විරෝධී රැස්වීම් පාලනය කිරීමේදී අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය ඇතුළු රජයේ ප්‍රකාශිත නීති තරයේ පිළිපදින බව. අපරාධ නඩු විධාන නීති සංග්‍රහයේ තියෙන එක එක නීති දණ්ඩ නීති සංග්‍රහයේ තියෙන පුද්ගලික ආරක්ෂා යටතේ ඒවා මේකට අදාළත්වයක් නැහැ. මේ කිසිම දෙයක් කඳුළු ගෑස්වලට සම්බන්ධ නැහැ. කිසිම නීතියක එකම වචනයක්වත් කියලා නැහැ කඳුළු ගෑස් ගැන. එහෙම කඳු එගෑස් ගැන කියන්නේ නැතුව කඳුළු ගෑස් පාවිච්චි කරන්න බැහැ ජාත්‍යන්තර නීතීන්ට හා මේ තත්ත්වයන්ට අනුව. මොකද කඳුළු ගෑස් ලංකාවේ හදන්නේ නැහැනේ. ජාත්‍යන්තරයේ නිෂ්පාදනය කරලා ලංකාවට ගේන දෙයක්. එතකොට මෙය පාවිච්චි කරන්නේ කොහොමද? ඒවා ගැන යම් යම් තත්ත්වයන් තියෙනවා ජාත්‍යන්තර වශයෙන්.

**එක්සත් ජාතීන්ගේ සංවිධානය 2020 වර්ෂයේ ප්‍රකාශයට පත්කරපු අඩු මාරාන්තික ආයුධ සම්බන්ධයෙන් මාර්ග උපදේශකය කියලා. මේ සම්බන්ධයෙන් තියෙන පළමු තත්ත්වය තමයි, මෙය අවම බල යෙදීමට භාවිතා කරන ආයුධයක් නෙමේ. මෙය ජාත්‍යන්තර වහයෙන් හඳුන්වන්නේ අඩු මාරාන්තික ආයුධයක් කියලා. මෙය නියාමනය කිරීම සඳහා නීති රීති තියෙන්න ඕනා. අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඒක නැහැ. එතකොට තියෙන්න ඕනා දේවල් තමා ජාත්‍යන්තර නීති රීතිවලට අනුව දේශීය නීති තියෙන්න ඕනා. මේ සම්බන්ධයෙන් බලපාන රෙගුලාසි තියෙන්න ඕනා. ඒවා පැහැදිලි වෙන්න ඕනා. අපරාධ නඩු විධාන සංග්‍රහයේවත්, දණ්ඩ නීති සංග්‍රහයේවත් කිසි දෙයක් දක්වලා නැහැ. කොටින්ම කඳුළු ගෑස් ගැන වචනයක්වත් නැහැ.**

ජාත්‍යන්තර නීතියට අනුව කඳුළු ගෑස් වගේ දෙයක් ගහනවා නම්, ඒවා යොදා ගන්නේ කුමන තත්ත්වයන් යටතේද? පැහැදිලිව ලිඛිතව දක්වලා තියෙන්න ඕනා. ඒවාට තියෙන සීමාවන් දක්වලා තියෙන්න ඕනා. භාවිතා කරද්දී කොයි කොයි සීමාවන්ද ඒ සඳහා තියෙන්න ඕනේ කියලා. මේ කිසි දෙයක් අපේ රටේ නැහැ. අවධානමට ලක් විය යුතු පුද්ගලයාගේ සාමාන්‍යයෙන් දරුවන්, ගර්භණී කාන්තාවන්, ආබාධිත අය, මානසික රෝගීන්, මහළු අය. මේ අය ගැන විශේෂ අවධානයක් යොමු කරමින් තමා කඳුළු ගෑස් පාවිච්චි කරනවා නම් පාවිච්චි කළ යුත්තේ. කඳුළු ගෑස් භාවිතා කරනවා නම් කළ යුත්තේ අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විතරක්, අවශ්‍ය තරමට විතරයි. නීත්‍යානුකූල අරමුණ සඳහා විතරයි. සාමකාමී රැස්වීම් විසුරුවා හරින්න කඳුළු ගෑස් භාවිතා කරන්න බැහැ. ඒ වගේම වෙනත් විකල්ප නැති අවස්ථාවලදී විතරයි කඳුළු ගෑස් භාවිතා කරන්න පුළුවන් වෙන්නේ. ඒ වගේම මෙය පාවිච්චි කළ හැක්කේ අවම බලය යෙදුවත් සාර්ථක නොවූ විට. අපේ රටේ මේක පාවිච්චි කරන්නේ මේක අවම බලය කියලා. මේක පාවිච්චි කරනවා නම් අත්‍යවශ්‍ය භාවය නැතිවූ සැනින්ම පාවිච්චි කිරීම නතර කරන්න ඕනා. අපි දක්කේ අපේ රටේ දිගින් දිගටම කඳුළු ගෑස් ගහන තත්ත්වයන්. ඒ වගේම අත්‍යවශ්‍ය ලෙස දිගින් දිගටම නැවත නැවත කඳුළු ගෑස් ගැසීම වධහිංසනීය තත්ත්වයක්.

අපේ රටේ මූලික අයිතිවාසිකමක් ලෙස



> **ලෝකයේ කාලයක් පුරාවට භාවිතා වූ කඳුළු ගෑස් 1993දී රටවල් 193ක් විසින් අත්සන් තැබූ එක්සත් ජාතීන්ගේ රසායනික අවි ගිවිසුමට අනුව යුද්ධයන්වලදී භාවිතා කිරීම ජාත්‍යන්තර වශයෙන් තහනම් කරන අතර ශ්‍රී ලංකාවද 1993 ජනවාරි 14 වන දින මෙයට අත්සන් තබා පසුව මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 2007 අංක 58 දරණ රසායනික අවි සම්මුතිය පනත සම්මත කර ඇත. එම පනතේ 19 (1) (ට) වගන්තිය ප්‍රකාරව කැරලි මර්ධන නියෝජිත ද්‍රව්‍ය යටතේ වන කඳුළු ගෑස් යුද්ධයකදී භාවිතා කිරීම වසර 20ක් දක්වා සිර ගත කළ හැකි අපරාධ වරදක් බවට පත් කිරීම තුළ පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ නීතිය තුළද කඳුළු ගෑස් රසායනික අවියක් ලෙස සලකා ඇති බවයි.**




**කඳුළු ගෑස් සම්බන්ධයෙන් අපේ රටේ කොහොමද තක්සේරු කරන්නේ කියලා ශ්‍රී ලංකා පොලීසියෙන් කඳුළු ගෑස් ගහන එක සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරලා තිබුණා. ප්‍රමිතියෙන් තොර කඳුළු ගෑස් භාවිතය පිළිබඳ චෝදනා ශ්‍රී ලංකා පොලීසිය ප්‍රතික්ෂේප කරයි. තවදුරටත් ප්‍රකාශ කරලා තිබුණා පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා, පොලීසිය නීති විරෝධි රැස්වීම් පාලනය කිරීමේදී අපරාධ නඩු විධාන සංග්‍රහය, දණ්ඩ නීති සංග්‍රහය ඇතුළු රජයේ ප්‍රකාශිත නීති තරයේ පිළිපදින බව. අපරාධ නඩු විධාන නීති සංග්‍රහයේ තියෙන එක එක නීති දණ්ඩ නීති සංග්‍රහයේ තියෙන පුද්ගලික ආරක්ෂා යටතේ ඒවා මේකට අදාළත්වයක් නැහැ. මේ කිසිම දෙයක් කඳුළු ගෑස්වලට සම්බන්ධ නැහැ. කිසිම නීතියක එකම වචනයක්වත් කියලා නැහැ කඳුළු ගෑස් ගැන. එහෙම කඳු ළුගෑස් ගැන කියන්නේ නැතුව කඳුළු ගෑස් පාවිච්චි කරන්න බැහැ ජාත්‍යන්තර නීතීන්ට හා මේ තත්ත්වයන්ට අනුව. මොකද කඳුළු ගෑස් ලංකාවේ හදන්නේ නැහැනේ. ජාත්‍යන්තරයේ නිෂ්පාදනය කරලා ලංකාවට ගේන දෙයක්. එතකොට මෙය පාවිච්චි කරන්නේ කොහොමද? ඒවා ගැන යම් යම් තත්ත්වයන් තියෙනවා ජාත්‍යන්තර වශයෙන්.**

වධහිංසනයට ලක්නොවී සිටීමට ඇති අයිතිය තියෙනවා. අපි පැහැදිලිවම දන්නවා මේ කාලය පුරාවටම සිදුවූ සිදුවීම් ගත්තාම, බොහෝ විට මේ කඳුළු ගෑස් ගැසීම සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් කඩවීමක් හැටියට මේ කඳුළු ගෑස් ගැසීම ගැන ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමේ හැකියාවක් තියෙනවා. මේ වධහිංසනය සම්බන්ධයෙන් මේ ගහපු කඳුළු ගෑස් ඒ වගේ නැවත නැවත ගොඩාක් පාවිච්චි කිරීම සම්බන්ධයෙන්, ඒ වගේම යම්කිසි පිරිසක් යම් වරදක් කරන්න උත්සාහ කරනවා නම් ඒ වරදට සමානව තමා මේ කඳුළු ගෑස් ප්‍රහාරය පැවතිය යුත්තේ. ඒ වගේම යම් නියෝගයකට අවනත කර ගැනීම සඳහා පමණක් කඳුළු ගෑස් ගැසීම නොකළ යුතුය කියලා දක්වලා තියෙනවා. මේ ඔක්කොම තියෙන්නේ ජාත්‍යන්තර සම්මුතීන්වල. මේවාට අනුකූල වෙමින් රටේ නීතිය සකස් කළ යුතුව තිබුණා.

නමුත් අපි දූන් කියන්නේ නැහැ නීති සකස් කරන්න කියලා. අපි කියන්නේ දූන් තියෙන ජාත්‍යන්තර තත්ත්වය තමා කඳුළු ගෑස් ගැසීම සම්පූර්ණයෙන්ම නතර කරන්න කියන එක. නමුත් අපේ ජනතාවට උද්ඝෝෂණ අවස්ථාවලදී කඳුළු ගෑස් ගැහැව්වා මේ කිසිම නීතියක් නැතුව. කඳුළු ගෑස් කියන වචනයවත් අපේ නීති පොත්වල නැතුව තමා අපිට කඳුළු ගෑස් ගැහැව්වේ. එතකොට මේ කඳුළු ගෑස් ගහන ප්‍රදේශයේ බලා සිටින්නන්, පසුකර යන්නන්, මාධ්‍යවේදීන්, වෛද්‍යවරු මේ කිසිම කෙනෙකුට මෙය එල්ල නොකළ යුතුයි කියලා දක්වලා තියෙනවා. සෘජුවම කඳුළු ගෑස් මනුෂ්‍යයාට නොගැසිය යුතුයි කියන එක පැහැදිවම දක්වලා තියෙනවා.

ඒ වගේම තව වැදගත් කාරණයක් තමයි වගවීම කියන කාරණය. මේකේ සඳහන් කරලා තියෙනවා මේ වගවීම පිළිබඳව. මේ කඳුළු ගෑස් ගැසීම සම්බන්ධව වරදක් සිදුවෙනවා නම් ඒ වැරැද්ද පිළිබඳව ස්වාධීනව ඒ සම්බන්ධයෙන් විමර්ශණය කරන්න නිලධාරින් නොවන යාන්ත්‍රණයක් තියෙන්න ඕනේ කියලා. මම දන්න තරමින් නම් කිසිම පොලිස් නිලධාරියෙකුට හෝ ආරක්ෂක අංශයේ කෙනෙකුට නඩු පැවරීමක් හෝ විනය ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. කඳුළු ගෑස් ගැසීම සම්බන්ධයෙන් වූ වරදක් සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් අරන් තියෙන බවක් මම නම් දන්නේ නැහැ. ඒ වගේම කඳුළු ගෑස් ගහන්න යන නිලධාරින්ගේ නම් සහ අංක ඒ නිලධාරින්ගේ ඇඳුම්වල පැහැදිලිව සඳහන් වෙන්න ඕනේ. ඒ වගේම උණ්ඩ කීයක් ගැහැව්වාදැයි වාර්තා පවත්වාගෙන යන්න ඕනා. උණ්ඩ ගහපු අවස්ථා සම්බන්ධයෙන් වෙනම වාර්තා පවත්වාගෙන යා යුතුයි කියලා තියෙනවා.

අපි මේ තොරතුරු ඉල්ලීමේ පනත යටතේ මේ තොරතුරු ඉල්ලපුවාම දූකපු කාරණය තමයි කිසිම තොරතුරක් මේගොල්ලෝ ගාව නැහැ. හොය හොයා හද හදා තමා මේගොල්ලන්ට අපට දෙන්න සිද්ධ වුණේ. කිසිම දත්ත පවත්වාගෙන යාමක් සිදුවෙලා තිබුණේ නැහැ. ඒ වගේම යම්කිසි ආකාරයකින්. ඒකෙන් වින්දිත තත්ත්වයට පත්වන අයට වන්දි ගෙවීම සම්බන්ධයෙන් ඒ ජාත්‍යන්තර තත්ත්වය ඇතිවෙන්න ඕනේ. ජාත්‍යන්තර නීතියේ තියෙන්නේ එවැන්නක්. ඒ වගේම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් තියෙන තත්ත්වය වන්නේ කඳුළු ගෑස් නිෂ්පාදනයට අමතරව වෙනම පරීක්ෂණවත් අනිවාර්යයෙන්ම කළ යුතුයි කියන කාරණය. එය ජාත්‍යන්තර නීතියේ පැහැදිලිවම දක්වලා තියෙනවා. ඒ වගේ පරීක්ෂණයක් කළ යුත්තේ අපක්ෂපාතී නීතිමය සාක්ෂි එක්ක. වෛද්‍ය සහා සාක්ෂිත් ඇතුව කළ යුතු පරීක්ෂණයක් හැටියට තමා තියෙන්නේ. මේ වගේ කිසිම පරීක්ෂණයක් කරන්නේ නැතිව තමා මේ කඳුළු ගෑස් ලංකාවට ගෙනැවිත් තියෙන්නේ. මේවා පරීක්ෂා කරලත් නෙමේ ගෙනත් තියෙන්නේ, පසුව පරීක්ෂා කරලත් නැහැ. රටක් වශයෙන් ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කරලා තියෙනවා.

ඒ වගේම තව කාරණයක් තියෙනවා, අධීක්ෂණය. රජය මෙවැනි රසායනික අවි භාවිතා කරනවා නම් ඒවායින් සිදුවන බලපෑම සම්බන්ධයෙන් ඒවා භාවිතා කිරීම ගැන විශේෂ අධීක්ෂණයක් කළ යුතු වෙනවා. අධීක්ෂණය කරලා තමා ක්‍රියාමාර්ග ගන්න ඕනේ. ඒවා ප්‍රසිද්ධ කළ යුතුයි. දත්ත ප්‍රසිද්ධ කළ යුතුයි. ඒ දත්ත ප්‍රසිද්ධ නොකළ නිසා තමයි තොරතුරු දූන ගැනීමේ පනත හරහා මේවා සොයාගෙන යන්න සිද්ධ වුණේ. ඒ වගේම මොනවගේ නීති ප්‍රතිපාදනයක් රෙගුලාසියක් තියෙනවා නම් ජාත්‍යන්තර නීතිය තුළ හැමෝටම බලන්න පුළුවන් මට්ටමක තියෙන්න ඕනා. අවදානම් තත්ත්වයක් තියෙනවා නම් නිෂ්පාදකයා බැඳිලා සිටිනවා ඒවා දූනුම් දෙන්න. රජයත් බැඳිලා සිටිනවා ඒවා ජනතාවට දූනුම් දෙන්න. විශේෂයෙන්ම නිෂ්පාදනයේදී මාර්ග උපදේශක තියෙනවා. ඒවා ජනතාවට හෙළිකිරීමට බැඳිලා ඉන්නවා. ප්‍රසම්පාදනයට පෙර ජනතාවගේ අදහස් ගන්න ඕනා කියලා සඳහන් වෙනවා.

අනිත් කාරණය තමා පුහුණු කිරීම. මෙම රසායනික අවි පාවිච්චි කරන නිලධාරින්ට මේවා භාවිතා කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් තියෙන්න ඕනා. එහෙම පුහුණුවක් අපේ නිලධාරින්ට තිබෙන බවක් අපිට පෙනුණේ නැහැ. පසුගිය කාලය පුරාවට අවදානම් ඇති අය හඳුනාගෙන කටයුතු කළ යුතු බවක් පේන්න තිබුණේ නැහැ. අපි දූක්කේ සාමකාමී උද්ඝෝෂණවලට කඳුළුගෑස් ගහලා ඒ උද්ඝෝෂණයන් ප්‍රචණ්ඩකාරිත්වයකට ගෙන යන තත්ත්වයක් තමයි.

ඒ වගේම ප්‍රථමාධාර කිරීම මම දූක්කේ නැහැ කඳුළු ගෑස් ගහන කිසිම තැනක. කඳුළු ගෑස් වැදිලා අපහසුතාවයන්ට පත්වූවන්ට ප්‍රථමාධාර ලබාදීම පැහැදිලි කාර්යයක් හැටියට දක්වලා තියෙනවා. කඳුළු ගෑස් ගහන අය දන්නවා කඳුළු ගෑස් ගැහැව්වාම අපහසුතාවයට පත්වෙනවා කියලා. ඒ අයටම තමා වඩාත්ම

> **නමුත් අපි දැන් කියන්නේ නැහැ නීති සකස් කරන්න කියලා. අපි කියන්නේ දැන් තියෙන ජාත්‍යන්තර තත්ත්වය තමා කඳුළු ගෑස් ගැසීම සම්පූර්ණයෙන්ම නතර කරන්න කියන එක. නමුත් අපේ ජනතාවට උද්ඝෝෂණ අවස්ථාවලදී කඳුළු ගෑස් ගැහැව්වා මේ කිසිම නීතියක් නැතුව. කඳුළු ගෑස් කියන වචනයවත් අපේ නීති පොත්වල නැතුව තමා අපිට කඳුළු ගෑස් ගැහැව්වේ. එතකොට මේ කඳුළු ගෑස් ගහන ප්‍රදේශයේ බලා සිටින්නන්, පසුකර යන්නන්, මාධ්‍යවේදීන්, වෛද්‍යවරු මේ කිසිම කෙනෙකුට මෙය එල්ල නොකළ යුතුයි කියලා දක්වලා තියෙනවා. සෘජුවම කඳුළු ගෑස් මනුෂ්‍යයාට නොගැසිය යුතුයි කියන එක පැහැදිවම දක්වලා තියෙනවා.**



ලැස්තිවෙලා එන්න පුළුවන් අපහසුතාවයන්ට පත්වූවන්ට ප්‍රථමාධාර කිරීමට. ඒ වගේම පැහැදිලිව දක්වලා තියෙනවා ජාත්‍යන්තර ප්‍රමිතීන්වල සාමකාමී රැස්වීම්වලට ඒ අයිතීන්වලට ගරු කරන්න ඕනෑ කියලා. ඒක අපේ රටේ සිදුවුණේ නැහැ කියලා හොඳටම පැහැදිලියි. සාමකාමී උද්ඝෝෂණයකදී එක පුද්ගලයෙකු ප්‍රචණ්ඩාකාරීව හැසිරෙනවා නම් පොලීසියේ වගකීම තමා ඒ පුද්ගලයාව වෙන්කරලා අරගෙන අනිත් අයට සාමකාමී රැස්වීම් පවත්වාගෙන යන්නට ඉඩදෙන එක. එහෙම නැතුව කඳුඨ ගෑස් ගහන එක නෙමේ විය යුත්තේ. කඳුළු ගෑස් ගහන එක එකපාර කරන්න පුළුවන් එකක් නොවෙයි.

කඳුළුගෑස් ගහද්දී උඩට ගහන්න ඕනේ. නමුත් අපි දැක්කා සමාන්තර කෝණයකින් කඳුළු ගෑස් ගහනවා. නැවත නැවත කඳුළුගෑස් ප්‍රහාරය එල්ල කිරීම හරහා විශාල බලපෑමකට ලක්වෙනවා. එය නොකළ යුතුයි කියලා දක්වෙනවා. ඒ වගේම පුද්ගලයින්ට සෘජුව එල්ල කිරීම නොකළ යුතු දේවල් හැටියට දක්වලා තියෙනවා. මේ හැම දෙයක් ගැනම හිතුවාම මට හිතෙන කාරණයක් තමයි ජාත්‍යන්තර නීතිය පදනම්කරගෙන රටේ නීතියක් නොමැති වීම. ලංකාවේ අවියක් භාවිතා කරනවා නම් ඒ සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියට අනුකූලව යම් නීතියක් ගොඩනගා ගත යුතුව තිබුණා. නමුත් අපේ රටේ කඳුළු ගෑස් පාවිච්චි කරන්නේ කිසිම නීතියක් නොමැතිව. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියලා දන්නේ නැහැ. අඩුම තරමේ ප්‍රකාශයට පත්වෙලා තිබුණේ නැහැ. ඒගොල්ලෝ කියන නීති රීතිවලත් මේවා නැහැ. අපරාධ නඩු විධි විධාන සංග්‍රහය ගැන කියනවා, දණ්ඩ නීති සංග්‍රහය කියලා කියනවා, පොලිස් ආඥා පනත. එම ආඥා පනත එන්නේ 1880 ගණන්වල. කඳුළු ගෑස් ඒ වන විට හොයාගෙන තිබුණෙත් නැහැ.

විශේෂයෙන් බලපුවාම සාමකාමී උද්ඝෝෂණවලදි කඳුළු ගෑස් යොදා ගන්නා බව මම දැක්කා. එය මූලික අයිතිවාසිකම් කඩකිරීමක්. උද්ඝෝෂණවලට දඬුවම් කිරීමක් හැටියට කඳුළු ගෑස් භාවිතා කරනවා මම දැක්කා. ඒ වගේම මිනිසුන්ගේ අයිතිවාසිකම් යටපත් කිරීමට කඳුළු ගෑස් භාවිතා කරනවා අපි දැක්කා. පටු වීදිවලද කඳුළු ගෑස් යොදා ගන්නවා දැක්කා. නොකළ යුතු දේවල් හැටියට තමා ඒවා සඳහන්වෙලා තියෙන්නේ. එක දිගට කඳුළුගෑස් යොදා ගැනීම සම්පූර්ණයෙන්ම නොකළ යුතු දෙයක්. පැහැදිලිව මෙයින් දැක්වෙන දේ තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය කඩවීම. එයත් අප රටේ මූලික අයිතිවාසිකමක්. සාමකාමී රැස්වීමේ නිදහස කඩවෙනවා අපි අනන්ත වාරයක් දැක්කා පසුගිය කාලය පුරාවටම. මට කියන්න තියෙන්නේ මේ වගේ තත්තවයක් තමයි. කිසිම නීතියක්, කඳුළු ගෑස් කියන වචනයවත් නැහැ. කඳුළු ගෑස් කයන එක හඳුන්වන්නේ අඩු මාරාන්තික අවියක් විදිහට. එහෙම වචනයක් කොහේවත් නැහැ. දැන් ලෝකයේ යන ප්‍රවණතාවය තමා කඳුළු ගෑස් තහනම් කරන්න කියන එක. රාජ්‍යයන් අතරේ යුද්ධයකදී වුව කඳුළු ගෑස් භාවිතා කිරීම තහනම් කර තිබෙනවා. මොකද කඳුළු ගෑස් රසායනික අවියක් නිසා.

අවසාන වශයෙන් සාමකාමී උද්ඝෝෂණයන්ට කඳුළු ගෑස් භාවිතා කිරීම යනු මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමට භයානක රසායනික අවියක් යොදා ගැනීමක් බවත් ශ්‍රී ලංකාව විසින් යුද්ධයකදීවත් භාවිතා නොකිරීමට එකඟවී ඇති සහ ඒ සම්බන්ධව නීති පනවා ඇති මෙම අවිය පසුගිය දිනක පොලීසිය විසින් කොළඹ විශ්ව විද්‍යාල භූමිය තුළට කඩා පැන අධ්‍යයන කටයුතුවල නිරතව සිටි ශිෂ්‍යයන්ට විරුද්ධවද භාවිතා කිරීම ඉතාම නිර්ලජ්ජිත ක්‍රියාවක් බවත් මෙමගින් රටේ අනාගතය ගොඩනැගීමට විශාල කාර්යභාරයක් සිදු කිරීමට සිටින තරුණ තරුණියන්ට සිදුවිය හැකි සෞඛ්‍ය හානි සම්බන්ධව රජය වගකිවයුතු බවත් දක්වා සිටිමි.

**List of References**


1) United Nations Human Rights 'Guidance on Less-Lethal Weapons in Law Enforcement, 2020.
2) University of Toronto 'The Problematic Legality of Tear Gas Under International Human Rights Law
3) Chemical Weapons Convention Act, No. 58 of 2007



**නීතිඥ**
**සුරේන් පෙරේරා**

මාධ්‍ය අදහස් දැක්වීමක් ඇසුරෙන්
සටහන : **සනත් ප්‍රනාන්දු**

# ජනතා කඳුලින් පිරවෙන
# කිසිදා නොසිඳෙන යාන් ඔය




**"පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවන්ට අනුව මේ ව්‍යාපෘතිය නිසා සිදුවන පාරිසරික හානිය සුළුපටු එකක් නොවේ. ජලාශය ජලයෙන් පිරවීමේ දී වැව් 21 ජලයෙන් යටව ගොස් සත්ව විශේෂ 255 කට හා ශාක විශේෂ 79 කට සෘජු හෝ වක්‍ර බලපෑම් සිදුවන බව කියා තිබුණි. ඒ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයේ තැකීමක් නොදැක්වීය. එමෙන්ම යෝජිත ජලාශය හේතුවෙන් පුල්මුඩේ ඛණිජ වැලි නිධිය අවට ස්වභාවික සම්පත්වලට වන බලපෑම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව තුළ තක්සේරු කර නැති බව පරිසරවේදීන් පෙන්වා දෙනු ලැබීය. ඔවුන් පැවසුවේ යාන්ඔය ද්‍රෝණියේ නිමැවුමක් වන ඛණිජ වැලි නිධිය නොසලකා හැරීම සුළුපටු කරුණක් නොවන බවයි. නමුත් මේ කිසිවක් තඹයකට මායිම් නොකර ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩවම කරගෙන ගියේය.**

මහින්ද චින්තනය තුළ මහින්ද රාජපක්ෂ රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය වූයේ කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීමයි. ඒ අනුව ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික් ඊසාන දිග මායිමේ ජීවත්වන ජනතාවගේ ආර්ථිකය ඉහළ නංවා එම ප්‍රදේශ මිරිදිය ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තය ඇසුරෙන් ස්වයංපෝෂිත කිරීමට සැළසුම් කෙරිණි. ඒ අනුව හෙළ රජ සමයෙන් පසු මෙරට ඉදිවූ දිගම හා වැඩිම වේලි සහිත ජලාශය වන යාන් ඔය ජලාශය ඉදිකිරීමට මහින්ද රාජපක්ෂ රජය කටයුතු කළේය. වැඩ නිමවීමෙන් පසු එය මෙරට ඉදිවූ තුන්වන විශාලතම ජලාශය විය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වාරිමාර්ග සංවර්ධන සැළසුමට අනුව චීන ඉදිකිරීම් සමාගමක් වූ චයිනා CAMC ඉංජිනේරු පුද්ගලික සමාගම විසින් මෙහි ඉදිකිරීම් කරනු ලැබීය. ජලාශයේ වම් ඇල හා වැව් බැම්ම ඉදි කිරීම චීන සමාගම සිදුකළ අතර සෙසු ඉදිකිරීම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තු කළ මුදල ඇමරිකානු ඩොලර් මිලියන 210 කි. මේ මහා ව්‍යාපෘතිය හරහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අපේක්ෂා කළ ඉලක්ක කිසිවක් නිසියාකාරව ඉටු වූ බවක් පෙනෙන්නට නැත. ඒ වෙනුවට සමාජ ප්‍රශ්න ගණනාවකට ජනතාවට මුහුණ දෙන්නට සිදුවිය.

රිටිගල අවට දිය කඳුරකින් ගලාවිත් කල්ලරාවෙන් මුහුදට වැටෙන යාන්ඔය ගෝමරන්කඩවල, පඹුරුගස් වැව දී වේල්ලක් බැඳ හරස්කර ජලාශයක් තනා උතුරුමැද හා නැගෙනහිර පළාත්වල ජල සම්පත සංවර්ධනය කිරීම ජලාශය තැනීමේ මූලික අරමුණ වී තිබුණි. මෙම ජලාශය මගින් ඊසාන දිග ප්‍රදේශයේ තරුණ තරුණියන් 7200 කට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලැබෙන බවත් සියයට 85% ක චීනයේ අරමුදල් මත ඉදිවන ජලාශය හරහා ගොවි පවුල් 10,000 කට ප්‍රතිලාභ හිමිව හෙක්ටයාර් 9500 කට ජලය සැපයෙන බව 2012 වසරේ දී යාන්ඔය ජලාශයේ වැඩ ආරම්භ කරමින් එවකට ජනපති මහින්ද රජපක්ෂ කියා තිබුණි.

ජලාශය ඉදි කිරීම සඳහා 2011 වසරේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අරඹමින් ගැසට් නිවේදන රැසක්ම නිකුත් විය. තවමත් එකී ක්‍රියාවලිය අවසන්ව නැත. පසුගිය වසරේ දෙසැම්බර් 26 වැනිදා ගැසට් නිවේදනයක් හරහා පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ඉඩම් අත්පත් කරගැනීමක් සිදුවූයේය. 2013 වසරේ පෙබරවාරි මාසය වනවිට මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්) සමාගම ජලාශය ඉදි කරන ප්‍රදේශය තුළ ඊට අදාළ පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සකස් කර වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකාරන අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. ඊට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඇතුළත් පුරාවිද්‍යා හානි ඇගයුම් වාර්තාව ද එක්කර තිබුණේ සෘජු හා වක්‍ර බලපෑමට නතුවන පුරාවිද්‍යා ස්ථාන 49 ක් ගැනද සඳහන් කරමිනි.

පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවන්ට අනුව මේ ව්‍යාපෘතිය නිසා සිදුවන පාරිසරික හානිය සුළුපටු එකක් නොවේ. ජලාශය ජලයෙන් පිරවීමේ දී වැව් 21 ජලයෙන් යටව ගොස් සත්ව විශේෂ 255 කට හා ශාක විශේෂ 79 කට සෘජු හෝ වක්‍ර බලපෑම් සිදුවන බව කියා තිබුණි.

**"දැන් තත්ත්වය උග්‍රව තිබේ. වන සතුන් හා මිනිසුන් අතර ගැටුම ඇරඹී තිබේ. පසුගියදා ගෝමරන්කඩවල කෝනාබැඳිවැව පුද්ගලයකු වන අලි ප්‍රහාරයකින් මිය ගියේය. ගතවූ මාස දෙක තුළ ගෝමරන්කඩවල ප්‍රදේශයේ පුද්ගලයන් සිව්දෙනෙකු වන අලි ප්‍රහාර නිසා මිය ගොස් සිටිති. වන අලි තර්ජන උග්‍රවීම හේතුවෙන් කෝනාබැදි වැව ගම්මානයේ ජීවත් වූ පවුල් 35 ක් අතරින් මේ වනවිට ජීවත්වන්නේ පවුල් තුනක් පමණකි. සෙස්සෝ අලින් ගෙන් දිවි බේරා ගැනීමට ගම හැරගොසිනි. මේ තත්ත්වය ඇතිවන බව මෙයට පෙර පරිසර සංවිධාන පැහැදිලි කර තිබුණි. වන අලින්ට, දිවියන්ට හා වලසුන්ට නිජබිම වූ නොයිඳුල් වනාන්තර අක්කර 6000 ක් ජලාශයේ ජලයෙන් පිරවෙන ප්‍රමාණය සඳහා රජයේ රක්ෂිතයෙන් ලබාගත් අතර සෙසු ඉඩම් පදිංචිව සිටි ජනයාගෙන් අත්පත් කර ගත්තේය. ඊට පරම්පරා ගණනාවක් ගොවිතැන් කළ ඉඩම් හා මිනිසුන් ජීවත් වූ ගම්මාන 09 ක් ඇතුලත් විය. මෙම ඉඩම් ජලාශයකට යට කිරීම යනු  වනසතුන් ජීවත්වූ නිජබිම් බලහත්කාරයෙන් උදුරා ගැනීමකි.**



ඒ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයේ තැකීමක් නොදැක්වීය. එමෙන්ම යෝජිත ජලාශය හේතුවෙන් පුල්මුඩේ ඛණිජ වැලි නිධිය අවට ස්වභාවික සම්පත්වලට වන බලපෑම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව තුළ තක්සේරු කර නැති බව පරිසරවේදීන් පෙන්වා දෙනු ලැබීය. ඔවුන් පැවැසුවේ යාන්ඔය ද්‍රෝණියේ නිමැවුමක් වන ඛණිජ වැලි නිධිය නොසලකා හැරීම සුළුපටු කරුණක් නොවන බවයි. නමුත් මේ කිසිවක් තඹයකට මායිම් නොකර ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩවම කරගෙන ගියේය.

නමුත් දැන් තත්ත්වය උග්‍රව තිබේ. වන සතුන් හා මිනිසුන් අතර ගැටුම ඇරඹී තිබේ. පසුගියදා ගෝමරන්කඩවල කෝනාබැඳිවැව පුද්ගලයකු වන අලි ප්‍රහාරයකින් මිය ගියේය. ගතවූ මාස දෙක තුළ ගෝමරන්කඩවල ප්‍රදේශයේ පුද්ගලයන් සිව්දෙනෙකු වන අලි ප්‍රහාර නිසා මිය ගොස් සිටිති. වන අලි තර්ජන උග්‍රවීම හේතුවෙන් කෝනාබැදි වැව ගම්මානයේ ජීවත් වූ පවුල් 35 ක් අතරින් මේ වනවිට ජීවත්වන්නේ පවුල් තුනක් පමණකි. සෙස්සෝ අලින් ගෙන් දිවි බේරා ගැනීමට ගම හැරගොසිනි. මේ තත්ත්වය ඇතිවන බව මෙයට පෙර පරිසර සංවිධාන පැහැදිලි කර තිබුණි. වන අලින්ට, දිවියන්ට හා වලසුන්ට නිජබිම වූ නොයිඳුල් වනාන්තර අක්කර 6000 ක් ජලාශයේ ජලයෙන් පිරවෙන ප්‍රමාණය සඳහා රජයේ රක්ෂිතයෙන් ලබාගත් අතර සෙසු ඉඩම් පදිංචිව සිටි ජනයාගෙන් අත්පත් කර ගත්තේය. ඊට පරම්පරා ගණනාවක් ගොවිතැන් කළ ඉඩම් හා මිනිසුන් ජීවත් වූ ගම්මාන 9 ක් ඇතුලත් විය. මෙම ඉඩම් ජලාශයකට යට කිරීම යනු  වනසතුන් ජීවත්වූ නිජබිම් බලහත්කාරයෙන් උදුරා ගැනීමකි. එවිට නිජබිම්, ආහාර හා වාසස්ථාන අහිමිව යන වන සතුන්ටද මිනිසුන්ගේ භූමිවලට පය ගැසීමට සිදුවනු ඇත. එය වැළැක්විය නොහැකි එකකි.

එසේ තිබියදී ජලාශය නිසා ඉවත් කළ ජනයා නැවත පදිංචි කිරීම වෙනුවෙන් ගෝමරන්කඩවල කජුවත්ත ප්‍රදේශයෙන් තවත් අක්කර 700 ක කැලයක් යළි කැපීමට ආණ්ඩුවට සිදුවූයේ මහා පරිසර හානියක් ද සමාජ ප්‍රශ්න රැසක් ද ඇති කරමිනි. ඉන් සිදුවූයේ වන අලි, දිවියන් හා වළසුන්ගේ වාසස්ථාන උන්ට අහිමිව යාමය. ඒ පිළිබඳව මෑතකදී ඉදිරිපත් වූ පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ සමාලෝචනයක් මගින් ප්‍රකාශ වූයේ යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කරවීම නිසා උතුරු මැද පළාත තුළ අලි මිනිස් ගැටුම දැඩිලෙස වැඩි විමට ඉඩ ඇති බවයි. දැන් එකී වාර්තාවන් හි සඳහන් කරුණු සත්‍ය වෙමින් පවති. ඒවා නොසලකා හැරි නිලධාරින් මුනිවත රකිමින් සිටිති.

පාරම්පරික ඉඩම් ගම්බිම් අහිමිවන ජනතාවට වන්දි ලබාදී ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කිරීම සංවර්ධන ව්‍යාපෘතියක් ඇරඹීමේ දී පළමුව සිදුකළ යුතු ප්‍රධානතම කාර්ය වුවද මෙම ව්‍යාපෘතිය තුළ සිදුවූයේ ඉන් අනිත් පැත්තය. ජලාශයේ කටයුතු හිතුමතේ ආරම්භ කළ නමුත් බලපෑමට ලක්වන ජනයා ගැන හෝ ආර්ථික හා මහා පරිසර හානිය ගැන නොසිතීය. අවතැන්වන ජනයා වෙනත් ස්ථානවල පදිංචි කිරීමට සුදුසු ස්ථාන හඳුනාගනිමින් පාරිසරික බලපෑම් ඇගයුම් වාර්තා සකස් කර තිබුණ ද එකී වාර්තා සකස් කිරීමේ දී ජනතාව ඊට සහභාගිකර නොගැනීමත් ආණ්ඩුව තෝරාදුන් විකල්ප ස්ථානවලට යාමට මිනිසුන් අකමැති වීමත් නිසා නැවත අර්බුදයක් නිර්මාණය වූයේය.

මෙසේ තිබියදී පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ සමාලෝචනයක් මගින් ප්‍රකාශ වුයේ 1389 දෙනෙකුට නිවාස හෝ කෘෂි ඉඩම් හෝ දෙකම අහිමිවනු ඇති බවයි. මෙයින් අදහස් කරනුයේ පාරිසරික බලපෑම් තක්සේරු කරන වාර්තාවේ හඳුනාගෙන ඇති නැවත පදිංචි කිරීමේ ස්ථාන තුන තවදුරටත් ප්‍රමාණවත් නොවන බවයි. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව නැවත පදිංචි කිරීමේ ස්ථාන හතරක් හා නව වාරිමාර්ග ප්‍රදේශ හයක් නම් කරනු ලැබීය. එබැවින් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර ඉන් බොහෝ ස්ථාන තවමත් ජනයා වෙත ලබාදී නැති බව ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවසයි.

ජලාශයට යටව යන ඉඩම් හා කෘෂි බිම් සඳහා විකල්ප ස්ථාන ලබාදීම පමාවීමෙන් ජලාශය ඉදිවන වසර හතරක කාලය පුරාවටම වින්දිත ජනයාට කන්න හයක ගොවිතැන් කටයුතු කර ගැනීමට නොහැකිව ගියේය. ජලාශයට යටව යාම නිසා ඉන් අවතැන්ව ඉවත් කළ පවුල් 131 ක් සඳහා ගොඩ ඉඩම් අක්කරයක් හා මඩ ඉඩම් අක්කර 1 1/2 ක් හා ඉවත් කළ නිවාස සඳහා වන්දි ලබාදී දකුණු ඉවුර යටතේ මල්පෝරුව, මයිලවැව හා කජුවත්ත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කර යළි පදිංචිකර ඇත. නමුත් හොරොව්පොතාන, ගෝමරන්කඩවල හා පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවසන්නේ අවතැන් වූවන්ගෙන් බොහෝ පිරිසකට තවමත් වන්දි හා කුඹුරු ඉඩම් ලබා දීමට නොහැකිව ඇති බවයි. කෙසේ වෙතත් ඉඩම් ලබාදුන් ජනයාට ඉඩම් ලබා දීම සඳහා ඉදිරියේ දී තවත් කැලය කැපීමේ සූදානමක් පවති. නිලධාරින් ගේ අසාර්ථක ව්‍යාපෘතින් හි බර එක් පසෙකින් ගෝමරන්කඩවල පඹුරුගස් වැව, මාවතවැව ජනයා මත පැටවී ඇති අතර අනෙක් පසින් නිදහසේ දිවි ගෙවූ වන අලින් හා වන සතුන් ද අසරණ වී ගොසිනි. නොබෝ දිනකින්ම අලි - මිනිස් දෙපාර්ශවය අතර නොනවතින යුද්ධය ඇරඹෙනු ඇත. ඉන් කිසිවෙකුත් ජය නොලබනු ඇත.



ලක්මාල්
කේ. බඩුගේ

# මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් උදෙසා හඬ නගමු

**13 වන ව්‍යවස්ථාව අනුව නීතියට පටහැනිව සිරභාරයට (අත් අඩංගුවට) ගනු ලැබීමෙන් නිදහස අයිතියකි. සිරභාරයට ගැනීමේ දී එයට හේතුව දැනුම් දිය යුතුය. නීතියට පටහැනිව රඳවා තබා නොගත යුතුය. නමුත් මහජන ආරක්ෂක පනත යටතේ හදිසි නීතිය පැනවූ විට සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බොහෝ විට මෙම නීතියට පටහැනිව කටයුතු කරනු දක්නට ලැබේ. පසුගිය දිනවල උද්ඝෝෂණවල යෙදී සිටි තරුණ පිරිස් පිළිබඳව මේ නීති ක්‍රියාත්මක වූ ආකාරය දක්නට හැකි විය. මේ දිනවල කරළියට පැමිණෙමින් ඇති ප්‍රති ත්‍රස්ත පනත යෝජිත අයුරින් සම්මත වුවහොත් 13 වන ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වීම වැලැක්විය නොහැකි වනු ඇත.**



මිනිසා උපදින්නේ ජීවත්වීමේ අයිතිවාසිකම ඇතිවය. එය කිසිවෙකු විසින් ලබා දිය යුත්තක් නොවේ. ඉපදෙන විටම හුස්ම ගනී. මවගේ උණුසුම සොයයි. මවගෙන් ආහාර හා ආරක්ෂාව ලබා ගනියි. හඬමින් තමන්ගේ අවශ්‍යතාවයන් ප්‍රකාශ කරයි. හුස්ම ගැනීමේ අයිතිය, උණුසුම ලබා ගැනීමේ අයිතිය, ආහාරයේ අයිතිය, ආරක්ෂාවේ අයිතිය, තමන්ගේ අවශ්‍යතාවන් ලබා ගැනීම සඳහා හඬනැගීමේ අයිතිය සහ මානව ගරුත්වය ඇතිව ජීවත් වීමේ අයිතිය අහිමි කිරීමට කිසිවෙකුට නොහැකිය. ජීවත්වීමේ අයිතිය හා ජීවිතය පවත්වාගෙන යාමේ අයිතිය උදෙසා ආහාර, ජලය, වාතය, ඇඳුම්, නිවාස, සෞඛ්‍යාරක්ෂාව, අධ්‍යාපනය සහ ආරක්ෂාව වැනි දේ අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ජීවිතයට ඇති අයිතිය සමගම ජීවත්වීමට අත්‍යවශ්‍යය දේ ලබා ගැනීමට ද අහිමි කළ නොහැකි අයිතියක් මිනිසාට මිනිසෙකු නිසාම ඇත.

ජීවිතය රැක ගැනීම සහ පවත්වා ගෙන යැම සඳහා මිනිසා කළ අරගල නිසා ස්වභාව ධර්මයෙන් ලැබී ඇති අයිතිය පසුව ධර්මය මගින්, සමාජය මගින් හා නීතිය මගින් ද පිළිගනු ලැබිණ. එය සමාජ යහ පැවැත්මට අත්‍යවශ්‍ය වූ අතර ශිෂ්ඨාචාරයේ දියුණුවත් සමග එම අයිතීන් ද සංවර්ධනය විය. මෙම අයිතීන් ලැබෙන සමාජ පරිසරය ආරක්ෂාකර සංවර්ධනය කර ගැනීමට මිනිසා නිරන්තර අරගලයක යෙදී සිටී. එය මානව හිමිකම් පිළිබඳ ඉතිහාසය වේ.

පළමුවන ලෝක යුද්ධය සහ දෙවන ලෝක යුද්ධය නිසා ලෝ වාසීන්ට විවිධ හිරිහැරයන්ට මුහුණ දීමට සිදුවිණ. ඒ හිරිහැර දුක් වේදනා වලින් මිදී සාමයෙන් සතුටින් ජීවත් විය හැකි ලෝකයක් බිහි කර ගැනීමට සැමට අවශ්‍ය විය. එවැනි ලෝකයක් බිහි කර ගැනීමට නම් මානව හිමිකම් ගරු කරන සමාජයක් තිබිය යුතු බව පොදු පිළිගැනීම වූයේය. ඒ සඳහා විවිධ උත්සාහයන් ගනු ලැබූ අතර ඒවායේ එක් ප්‍රතිපලයක් ලෙස ජාතීන්ගේ සංගමය බිහිවිය.  දෙවන ලෝක යුද්ධයෙන් පසුව 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය රටවල් 51 ක් එකතු වී පිහිටුවා ගැණින. අද වන විට රටවල් 193 ක් එහි සාමාජිකත්වය ලබා ඇත. නැවත යුද්ධයක් ඇතිවීම වැළැක්වීමට මානව හිමිකම් ගරු කරනු ලැබීමේ වැදගත්කම අවබෝධ කරගත් සංවිධානය 1948 දෙසැම්බර් මස 10 වන දා මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සම්මත කර ගන්නා ලදී. එය මානව හිමිකම් සුරැකීම පිළිබඳ ඉතාම වැදගත් යෝධ පියවරක් විය.

### මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පූර්විකාව

ලෝකයේ පවත්නා නිදහස, යුක්තිය සහ සාමය යන්නෙහි පදනම මිනිස් පවුලේ සියලු දෙනාගේම සහජ ගරුත්වය හා අන්සතු කළ නොහැකි වූ සම අයිතිවාසිකම් පිළිගැනීම වන හෙයින් ද,

මානව අයිවාසිකම් නොතැකීමේ හා අවඥාවට ලක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂිය සාහසික පීඩනයකට භාජනය කෙරෙන ම්ලේච්ඡ කෲරකම් සිදු වී ඇති හෙයින් ද, මිනිස් වර්ගයාට අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහසත්, බියෙන් හා අගහිඟකමින් තොරවීමේ නිදහසත් බුක්ති විඳීමට හැකි ප්‍රජාවක් ඇරඹීම පොදු ජනතාවගේ ශ්‍රේෂ්ඨතම අපේක්ෂාව ලෙස ප්‍රකාශයට පත් වී ඇති හෙයින් ද,

දුෂ්ඨ පාලකයන්ට හා පරිපීඩකයන්ට විරුද්ධව අන්තිම ක්‍රියාමාර්ගයක් වශයෙන් කැරලි කෝලාහල ඇති කිරීමට මිනිසා පෙළඹවීම වැළැක්වීමට නම් නීති මගින් මානව හිමිකම් ආරක්ෂා කරදීම අත්‍යවශ්‍ය වන හෙයින් ද,

මූලික මානව අයිතිවාසිකම් කෙරෙහිත් මිනිසාගේ ගරුත්වය හා අගය කෙරෙහිත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ සමාන අයිතිවාසිකම් කෙරෙහිත්, තම විශ්වාසය හා භක්තිය එක්සත් ජාතීන්ගේ සාමාජික ජාතීන් විසින් ප්‍රඥප්තියෙහි ස්ථිර ලෙස නැවත පිළිගෙන ඇති හෙයින් ද, සමාජ ප්‍රගතිය හා වඩා යහපත් ජීවන තත්ත්වයක් වඩා පුළුල් ලෙස වර්ධනය කිරීමට අධිෂ්ඨානය කර ඇති හෙයින් ද,

මානව අයිතිවාසිකම් හා මූලික ස්වාධීනත්වයන් කෙරෙහි විශ්ව ගරුත්වයත්, ඒවා රැක දීමත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහයෝගිත්වයෙන් වර්ධනය කිරීමට සාමාජික රාජ්‍ය ප්‍රතිඥා දී ඇති හෙයින් ද,

ඒ ප්‍රතිඥාව පරිපූර්ණව සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අයිතිවාසිකම් හා ස්වාධීනතා පිළිබඳව පොදු අවබෝධය ලබා ගැනීම අතිශයින් වැදගත් වන හෙයින් ද, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මෙසේ ප්‍රකාශ කර සිටී.

**කරුණාතිලක හා තවත් අය එදිරිව දයානන්ද දිශානායක මැතිවරණ කොමසාරිස් හා තවත් අය (1999 SLR 157) නඩුව ද ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය පිළිබඳ වැදගත් නඩුවකි. අත්තනෝමතික ලෙස තැපැල් ඡන්දය නවත්වා ඡන්ද විමසීමේ දිනය අවලංගු කිරීම හා ඡන්ද විමසීමේ දිනය නැවත නියම නොකිරීම මගින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව පවසමින් පෙත්සම්කරුවන් විසින් නඩු පවරන ලදී. විනිසුරු මඩුල්ල වෙනුවෙන් තීරණය ලබා දුන් මාර්ක් ප්‍රනාන්දු විනිසුරු තුමන් ප්‍රකාශ කර සිටියේ " ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ද භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට ඇතුළත් වන සේ අර්ථ නිරූපනය කළ යුතුය යන්නයි. එසේම එම ප්‍රකාශය තහවුරු කරමින් සිය තීන්දුව තුළ කරුණු දැක්වූ විනිසුරු තුමා "ඡන්දය ප්‍රකාශ කිරීම මගින් පුරවැසියෙකු රහසිගතව හා නිහඬව එක් අයෙකුට මනාපය ප්‍රකාශ කිරීම, මහජන වේදිකාවක් මත කරනු ලබන ව්‍යක්ත කතාවකට ඇති ප්‍රකාශනයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට වඩා අඩු වන්නේ නැත." කියා ද පෙන්වා දෙන ලදී. මේ වන විට පළාත් පාලන ඡන්ද පැවැත්වීමට මුදල් ලබා නොදීම මගින් ප්‍රධාන වශයෙන් උල්ලංඝණය වන්නේ ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍යය සහ ප්‍රකාශනයේ අයිතියයි.**




මානව අයිතිවාසිකම් පිළිබඳ මෙම විශ්ව ප්‍රකාශනය, සෑම පුද්ගලයකු හා සංවිධානයක් විසින් නිරන්තරයෙන්ම සිහිපත් කෙරෙමින් සකල ජනතාවට හා සියලු ජාතීන්ට සාක්ෂාත් කරගත යුතු පොදු තත්ත්වයක් වශයෙන් අධ්‍යාපනයෙන් හා අධ්‍යයනයෙන් මෙම අයිතිවාසිකම් හා ස්වාධීනත්වයන් ගරු කළ යුතු යයිද, ජාතික වූත්, ජාත්‍යන්තර වූත්, ප්‍රගතිශීලී විධිවිධාන මගින් මේ හිමිකම් සාමාජික රටවල මෙන්ම ඒවායේ බලයට අවනත සෙසු රටවල ජනතාව අතර ද අගය කිරීමට සැලැස්වීමෙන් ලෝකය මුළුල්ලේම ඒ පිළිබඳ ගරුත්වය හා ක්‍රියාකාරිත්වය සැලසිය යුතුයයි ද ප්‍රකාශ කර සිටී.

අප රට ද එකඟ වී තිබෙන විශ්ව මානව හිමිකම් ප්‍රඥප්තියට අප පුද්ගලයින් වශයෙනුත්, කණ්ඩායම් වශයෙනුත්, රජයක් වශයෙනුත් කොතරම් ගරු කරනවා ද? එම අයිතිවාසිකම්වලින් කොටසක් අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ලෙස ඇතුලත් කර නීතියක් බවට පත්ව තිබුණ ද ඒවාට හෝ ගරු කිරීමක් තිබේද? මානව අයිවාසිකම් නොතැකීමේ හා අවඥාවට ලක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වර්ගයාගේ හෘදය සාක්ෂිය සාහසික පීඩනයකට භාජනය කෙරෙන ම්ලේච්ඡ කෲරකම් අප සමාජය තුළ කොතරම් සිදු කෙරේද? අදහස් ප්‍රකාශ කිරීමේ හා විශ්වාස ඇදහිලි දැරීමේ නිදහසත්, බියෙන් හා අගහිඟ කමින් තොරවීමේ නිදහසත් බුක්ති විඳීමට හැකි ප්‍රජාවක් අප සමාජය තුළ බිහි කිරීමේ ප්‍රමාණවත් උත්සාහයක් කිසිඳු රජයක් විසින් ගනු ලැබ තිබේද?

1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මුල්වරට අප නීතියට මූලික අයිතිවාසිකම් හඳුන්වා දුන්නද අයිතීන් කඩවීමක දී ප්‍රතිකර්ම ලබා ගැනීමට හැකිවූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමගය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ව්‍යවස්ථාව අර්ථකථනය කරමින් මෙම අයිතිවාසිකම් තව දුරටත් පුළුල් කිරීමට කටයුතු කර ඇත.

**නඩු තීන්දු මගින් අයිතිවාසිකම් පුළුල් කිරීම**

ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව අනුව සිතීමේ නිදහස, කැමති ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස සහ හෘදය සාක්ෂියේ නිදහස සෑම අයෙකුටම ඇත. සිතීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ද, ඇදහීමේ නීතිය යටතේ යම් විශ්වාසයක් ප්‍රශ්න කිරීමට ද, අත් හැරීමට ද, නිදහස ඇත. මේ අයිතිය පරම අයිතියකි. කිසිඳු සීමා කිරීමක් කළ නොහැකිය.

ප්‍රේමලාල් පෙරේරා එදිරිව වීරසූරිය (1985-2SLR177) නඩුවෙහි තීන්දුව හෘදය සාක්ෂිය සම්බන්ධයෙන් වැදගත් තීන්දුවකි. දුම්රිය අධිකාරී විසින් චක්‍ර ලේඛයක් නිකුත් කරමින් ජාතික ආරක්ෂක අරමුදල සඳහා ඔහුගේ කැමැත්ත නොමැතිව මාසික වැටුපෙන් දිනක වැටුප කපා ගැනීමට එරෙහිව ප්‍රේමලාල් පෙරේරා නම් දුම්රිය සේවකයා මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරීය. එම මුදල යෙදෙන්නේ අවි ආයුධ මිලට ගැනීමට හා මිනිස් ජීවිත විනාශ කිරීමට බැවින් තමන් අදහන බුදු දහමට එය පටහැනි බව ඔහු කියා සිටියේය. එසේ වැටුප කැපීම 10 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් බව තීන්දු විය.

ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව අනුව වධ හිංසාවලින් නිදහස, කුරිරු අමානුෂික දඬුවම්වලින් නිදහස සහ අවමන් සහගත සැලකිල්ලෙන් නිදහස, සෑම පුද්ගලයෙකුටම ඇති සීමා කළ නොහැකි පරම අයිතියකි. එය ශාරීරික හෝ මානසික හිංසාවක් පීඩාවක් විය හැකිය.

මෙයට අදාල වැදගත් නඩුවකි සුදත් සිල්වා එදිරිව කොඩිතුවක්කු (**1987-2 SLR 119**) නඩුව. පෙත්සම්කරුව නීති විරෝධී ලෙස දින 5ක් පොලිස් ස්ථානයේ රඳවා බාල්කයක අත්දෙකින් එල්ලා බැටන් වලින් පහර දී ඇත. ඔහුගේ ලිංගය මේස ලාච්චුවකට දමා වැසීමෙන් තද කොට දැඩි වේදනා පැමිණවීමත් මිරිස් කුඩු දමූ වතුර බොන්නට දීමත් සිදු විය.

මෙම නඩුවේ දී අතුකෝරාළ විනිසුරුතුමා මෙසේ ප්‍රකාශ කර ඇත. ''අත්අඩංගුවේ පසුවූ මිනිසෙකුට දෙන ලද එවැනි ම්ලේච්ඡ අමානුෂික දඬුවම් නිසා නීතිය කෙරෙහි මිනිසුන් ද්වේෂයක් ඇතිකර ගනු ඇත. පොලීසියට නීතිය හා පාලනය ඇති කළ හැකිය යන විශ්වාසය තුරන් වනු ඇත. අත් අඩංගුවට පත් වූ තැනැත්තා දරුණු අපරාධකාරයකු විය හැකිය. එහෙත් ඔහුට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර දී ඇති නීතියේ ආරක්ෂාව අහිමි කළ යුතු නැත.''

නීතියේ එසේ තිබුණ ද මෙම අයිතිවාසිකම පිළිබඳව අද පවතින ප්‍රායෝගික තත්ත්වය, විවිධ සාමකාමී උද්ඝෝෂණවල යෙදී සිටින්නන්ට පොලීසිය හා සන්නද්ධ හමුදා විසින් සළකන ආකාරයෙන් පෙනී යයි.

12 වන ව්‍යවස්ථාව අනුව නීතිය පසිඳලීම, නීතිය ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතු යයි දැක්වේ.

මේ අනුව කිසිම පුද්ගලයකුට අඩු සැලකිල්ලක් හෝ වැඩි සැලකිල්ලක් නොවිය යුතුය. සමානයන් අසමාන ලෙස නොසැලකිය යුතුය. අසමානයන් සමාන කොට සැලකීම ද නොකළ යුතුය.

මේ පිළිබඳව රජයේ සේවකයන් විසින් වෙනස්කම් කොට සැලකීමට එරෙහිව ඉදිරිපත් කළ නඩු වලට අදාලව ලබා දී ඇති වටිනා නඩු තීන්දු රාශියක් ඇත.

13 වන ව්‍යවස්ථාව අනුව නීතියට පටහැනිව සිරභාරයට (අත් අඩංගුවට) ගනු ලැබීමෙන් නිදහස අයිතියකි. සිරභාරයට ගැනීමේ දී එයට හේතුව දැනුම් දිය යුතුය. නීතියට පටහැනිව රඳවා තබා නොගත යුතුය.

නමුත් මහජන ආරක්ෂක පනත යටතේ

හදිසි නීතිය පැනවූ විට සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බොහෝ විට මෙම නීතියට පටහැනිව කටයුතු කරනු දක්නට ලැබේ. පසුගිය දිනවල උද්ඝෝෂණවල යෙදී සිටි තරුණ පිරිස් පිළිබඳව මේ නීති ක්‍රියාත්මක වූ ආකාරය දක්නට හැකි විය.

මේ දිනවල කරළියට පැමිණෙමින් ඇති ප්‍රති ත්‍රස්ත පනත යෝජිත අයුරින් සම්මත වුවහොත් 13 වන ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වීම වැළැක්විය නොහැකි වනු ඇත.

14 වන ව්‍යවස්ථාව අනුව භාෂණයේ ප්‍රකාශනයේ අදහස් පළ කිරීමේ නිදහස ඇත. මෙයට අදාල ඉතා වැදගත් නඩුවකි **ජෝසප් පෙරේරා එදිරිව නීතිපති** (1992-1 SLR 199) නඩුව. හදිසි නීති ක්‍රියාත්මකව පැවති දිනක දී අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහිව පත්‍රිකා බෙදමින් සිටි සිසු පිරිසක් අත් අඩංගුවට ගනු ලැබූහ. එයට එරෙහිව පැවති මූලික අයිතිවාසිකම් නඩුවේ දී ප්‍රකාශ වූයේ 15 වන ව්‍යවස්ථාවේ සඳහන් සීමාව ඉක්මවා රෙගුලාසි පැනවීමට ජනාධිපතිට නොහැකි බවය. එම රෙගුලාසි බල රහිත බවය.

මෙම ව්‍යවස්ථාවට අදාළ තවත් වැදගත් නඩුවකි. **අමරතුංග එදිරිව සිරිමල්** (1993-1 SLR 264) නඩුව. 1992 වසරේ පැවති භාණ්ඩ මිල ඉහළ යෑම විරැකියාව වැනි ප්‍රශ්න හා ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට විරෝධය හා අප්‍රසාදය පළ කිරීම සඳහා 'ජනඝෝෂා' නමින් දීප ව්‍යාප්ත විරෝධතා ව්‍යාපාරයක් පැවැත්විණි. පෙත්සම්කරු බෙරය වාදනය කරන විට පොලීසිය විසින් එයට බාධා කරනු ලැබීය. මෙම නඩුවේ තීන්දුව ලබාදෙමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) (අ) ව්‍යවස්ථාව යටතට රජය හා දේශපාලන පක්ෂ විවේචනය කිරීමේ අයිතිය ද ඇතුළත් වන බවයි.

**කරුණාතිලක හා තවත් අය එදිරිව දයානන්ද දිශානායක මැතිවරණ කොමසාරිස් හා තවත් අය** (1999 SLR 157) නඩුව ද ප්‍රකාශනයේ නිදහසට ඇති අයිතිය පිළිබඳ වැදගත් නඩුවකි. අත්තනෝමතික ලෙස තැපැල් ඡන්දය නවත්වා ඡන්ද විමසීමේ දිනය අවලංගු කිරීම හා ඡන්ද විමසීමේ දිනය නැවත නියම නොකිරීම මගින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව පවසමින් පෙත්සම්කරුවන් විසින් නඩු පවරන ලදී. විනිසුරු මඬුල්ල වෙනුවෙන් තීරණය ලබා දුන් මාර්ක් ප්‍රනාන්දු විනිසුරු තුමන් ප්‍රකාශ කර සිටියේ '' ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ද භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට ඇතුළත් වන සේ අර්ථ නිරූපනය කළ යුතුය යන්නයි.

එසේම එම ප්‍රකාශය තහවුරු කරමින් සිය තීන්දුව තුළ කරුණු දක්වූ විනිසුරු තුමා ''ඡන්දය ප්‍රකාශ කිරීම මගින් පුරවැසියෙකු රහසිගතව හා නිහඬව එක් අයෙකුට මනාපය ප්‍රකාශ කිරීම, මහජන වේදිකාවක් මත කරනු ලබන ව්‍යක්ත කතාවකට ඇති ප්‍රකාශනයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට වඩා අඩු වන්නේ නැත.'' කියා ද පෙන්වා දෙන ලදී. මේ වන විට පළාත් පාලන ඡන්ද පැවැත්වීමට මුදල් ලබා නොදීම මගින් ප්‍රධාන වශයෙන් උල්ලංඝණය වන්නේ ව්‍යවස්ථාවේ ජනතා පරමාධිපත්‍යය සහ ප්‍රකාශනයේ අයිතියයි.

මේ වන විට ප්‍රකාශන අයිතියට බරපතල අභියෝගයක් එල්ල විය හැකි විකාශන අධිකාරි පනතක් ගෙන ඒමට සූදානම් වෙමින් පවතී. එමගින් තොරතුරු දැනගැනීමේ අයිතිය ද උල්ලංඝණය වනු ඇත.

මානව අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් වැළැක්විය හැක්කේ කෙසේ ද? එසේ කළ හැකි වන්නේ මානව හිමිකම් සංස්කෘතියක් ගොඩනැගීමෙනි. මානව අයිතිවාසිකම්, නෛතික හා සදාචාරාත්මක හිමිකම් ලෙස ද දැක්විය හැකිය. එය වර්ධනය වී ඇත්තේ රාජ්‍ය බලය භාවිත කළ යුතු ආකාරය ගැන පදනම ලෙස, මෙන්ම පුරවැසි අයිතිවාසිකම් වලට එරෙහිව එම බලය සීමා කිරීමක් ලෙස ය. අයිතිවාසිකම් උපතින් හිමිවන උරුමයකි. ඒ නිසා මිනිසා හදන නීතියකින් ඒවා අහිමි කළ නොහැකිය. ස්වෛරීභාවය යන ජනප්‍රිය සංකල්පය අනුව මහජනයා ආණ්ඩුවේ ආයතනවලට බලය පවරා දෙයි. මෙම අයිතිවාසිකම් සහ බලය පැවරීම සම්බන්ධ නීතිමය හා දේශපාලන ක්‍රමවේද සැලසෙන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙනි. ඒ නිසා මානව අයිතිවාසිකම් සංස්කෘතිය තීරණය වීමට ප්‍රධාන වශයෙන් බලපාන්නේ ව්‍යවස්ථාවයි. එහෙත් ව්‍යවස්ථාවේ තිබූ පමණින් අයිතීන් ආරක්ෂා නොවන බව අපි අත්දැකීමෙන්ම දනිමු. ව්‍යවස්ථාව පුරවැසි අයිතීන් වැඩිවැඩියෙන් තහවුරු කරන්නාවූත් පාලකයින්ගේ බලය හා වරප්‍රසාද අඩු කරන්නාවූත් විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය යන ආයතන තුනේ සමතුලිතභාවය වඩවඩාත් රැකෙන්නාවූත් දිශාවට තවතවත් ගමන් කළ යුතුය. ඒ සඳහා පුරවැසියෝ හඬ නැගිය යුතුය.

**මානව හිමිකම් ගරු කරන සංස්කෘතියක් ගොඩනැගීම සඳහා**

- ඒ පිළිබඳ දේශපාලන අභිලාෂයක් ඇති පාලකයින් පත් කර ගැනීම.
- ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිතව පුළුල් ලෙස අයිතීන් පිළිගැනීම සහ ඒවා කඩ වූ විට පහසු වියදම් අඩු ප්‍රතිකර්ම සැළසීම. එහිදී එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ මූලික ලේඛණ හතට අදාල නීති රට තුළ පැනවීම හා ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම. ව්‍යවස්ථාව මගින් යම් ක්‍රියාමාර්ග සීමා කළ යුතුය. නිදසුන් ලෙස විධායකයේ බලය සීමා කිරීම, දේශපාලන පක්ෂ ක්‍රියාකාරිත්වයට නිදහස සහතික කිරීම, නිසි කලට නිදහස් හා සාධාරණ ඡන්ද පැවැත්වීම සහතික කිරීම, සන්නද්ධ හමුදා සහ නීති ක්‍රියාත්මක කරන නිලධාරීන් කෙරෙහි මහජන බලපෑම දිරි ගැන්වීම, විධායකය ව්‍යවස්ථාදායකය හා අධිකරණය අතර නිසි බලය බෙදීමක් සහ තුලන හා සංවරණ ක්‍රම ඇති කිරීම
- අධ්‍යාපනය, මාධ්‍ය, ආගම් සහ කලාව ආදී සෑම මාර්ගයකින්ම මෙහි වටිනාකම සමාජගත කිරීම.
- පොලීසිය ත්‍රිවිධ හමුදා ඇතුලු සියලුම රාජ්‍ය නිලධාරීන්ට වරින්වර මේ පිළිබඳ ඵලදායී පුහුණු ලබා දීම.
- මහජන සුබසාධක නඩු දිරි ගැන්වීම.
- අන්තර් ජාතික මානව හිමිකම් සම්මුති නොපමාව අපරානුමත කිරීම සමග නීතිගත කිරීම.
- හදිසි අවස්ථා බලතල, යුද නීති ඇතුලු විශේෂ නීති භාවිතය දැඩි ලෙස සීමා කිරීම.
- ස්වාධීන නිදහස් මාධ්‍ය භාවිතය සහතික කිරීම.
- ලොව පිළිගත් යහපාලන මූලධර්ම පිළිගෙන ක්‍රියාත්මක කිරීම.
- ස්වාධීන කොමිෂන් සභාවලට සුදුසු පුද්ගලයින් පත් කිරීම, ඔවුන්ට නිදහසේ බලපෑම්වලින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් හා පරිසරය සැකසීම.

මේ සියල්ල ඉටු කර ගැනීමට සක්‍රිය පුරවැසි ක්‍රියාකාරිත්වයක් අත්‍යවශ්‍යය. පුරවැසියන් අතවැසියන් වූ සමාජයක මානව අයිතිවාසිකම් කිසිදා නොරැකේ. එනිසා අපි අද සිටම පුරවැසියන් ලෙස කටයුතු කිරීම අරඹමු. අන් අයවත් සැබෑ පුරවැසියන් කර ගැනීමට ක්‍රියා කරමු.



නීතිඥ
වින්සන්ට් බුලත්සිංහල
ජනාවබෝධ කේන්ද්‍රය

# වතු කම්කරුවන් පැමිණ වසර 200 යි, ඔවුන්ට යුක්තිය ඉටුවී තිබේද?

"තේ උගුරක" රස දන්නා සෑම ජීවිතයකට ම ලංකාවේ "වතු කම්කරුවා" සුවිශේෂී පුද්ගලයෙකි. ඒ, දැත් රත්පැහැ ගැන්වෙන තුරු තේ දළු නෙලීමේ භාවනාවේ "සාරය" අප භුක්ති විඳින නිසාය. "වතු දෙමළ" යන නාමය දරණ ඔහු එදා ලංකාවට නොපැමිණියේ නම් අපට එකී "සිලෝන් ටී" භුක්තිවිඳින්නට නොලැබෙනු ඇත. ඔහුගේ ලංකා ගමනය, අපට බොන්න තේ දෙනවා පමණක් නොව, ලංකාව් ආර්ථිකය පවත්වාගෙන යන්නට ලබා දෙන ශක්තිය කෙතරම් ද? එසේ අපි වෙනුවෙන් කඹුරන්නට පටන් ගෙන මේ වසරේ දී වසර 200 ක් සපුරන ඔවුන්ගේ පසුබිම, කාලීන තත්ත්වය ගැන "තේ බොන මිනිසුන්" ලෙස අපට දැන්නේ කෙසේද? ඔවුන්ගේ සේවා දායකත්වයට නිසි ඇගයීමක් සහ වටිනාකමක් ලැබී තිබේ ද?

"කඳුකර දෙමළ ජනතාව" නැතිනම් ලංකාවේ තේ කර්මාන්තයේ උන්නතිය සඳහා සොච්චමකට සිය ශ්‍රමය පුදන්නට දකුණු ඉන්දියාවෙන් දෙමළ ජනතාව ලංකාවට පැමිණ වසර 200ක් සම්පූර්ණ වීමත්, 137 වැනි ලෝක කම්කරු දිනයක් පැවැත්වීමත්, ජාත්‍යන්තර තේ දිනය මැයි මාස 21 වෙනි දා ට යෙදී තිබීමත් මේ මැයි මාසය සුවිශේෂනීය මාසයක් සේ සැළකුණි. එහෙත්, ලංකාවට පැමිණ වසර 200ක් ලෙස ඉතිහාසයට එක් වුව ද, අදටත් විදේශ විනිමයෙන් 12% ක් උපයා දෙන මලයහා මක්කල් ජනතාව සමාජ, ආර්ථික, දේශපාලන වශයෙන් නිදහස් නොවී සිටීම බේදවාචකයකි. ඔවුන්ගේ සාරය උරා බී නිකමුං සේ සිටීම ප්‍රජාතන්ත්‍රවාදී රටක්, ජාතීන් අතර සාමය ගරුත්වය ඇති රටක් සේ හඳුන්වා දෙන අපේ ලංකා නාමයට මහත් නින්දාවකි.

වසර 200ක් සපුරන මොහොතක දී ද වහල් සේවයෙහි නිරත "මලයහා මක්කල්" කුටුම්භය ගැන දමිළ ජාතික මානව ක්‍රියාකාරීන් වන මාරිමුත්තු සත්‍යවේල් පියතුමා, ඇන්තනි ජේසුදාසන් සහෝදරයා සහ ජීවරත්නම් සුරේෂ් සහෝදරයා "සාධාරණය" සමග මෙවැනි අදහස් බෙදාගන්නා ලදී.

"අවුරුදු 200ක් මේ රටේ ආර්ථිකය ගොඩනගන්න ශ්‍රමය කැපකරපු කණ්ඩායමක් විදියට වතුකර ජනතාවට ඉඩමක අයිතිය සහ නිවසක අයිතිය තහවුරු කරන්න ඕනේ. ඒ වගේ ම මේ ජනතාවගේ අනන්‍යතාවය ජාතික වශයෙන් පිළිගන්න ඕනේ "මලයගම් ජනතාව" විධියට. මේ රටේ සිංහල, ශ්‍රී ලාංකීක දෙමළ කියලා කියාගන්න කණ්ඩායම් සහ මුස්ලිම් ජනතාවට පොදු පරිපාලන සේවාවන් ලබාගන්නට හැකියාවක්, අයිතියක් තියෙනවා වගේ ඒ පොදු පරිපාලන සේවාව සමස්ත වතු ජනතාවටත් ඒ හා සමානව භුක්ති විඳිමේ අයිතිය ලබාදීමේ වැඩපිළිවෙලක් රජය ලබාදෙන්න ඕනේ.


## ඇන්තනි ජේසුදාසන්
### - සභාපති, වතුකරයේ ජනතා හඬ සංවිධානය




# වතුකර ජනතාවට ඉඩමක අයිතිය සහ නිවසක අයිතිය තහවුරු කරන්න ඕනේ

අපේ ශ්‍රී ලාංකීකයින් විදේශ රටකට ගියා ම වසර 5ක් සම්පූර්ණ වෙනකොට ඒ රටේ පුරවැසි භාවයත් අරගෙන ඒ රටේ තිබෙන සියලු සැප පහසුකම් සහ රැකියාව තුළ තිබෙන සියලුම අයිතිවාසිකම් භුක්ති විඳිනවා. සම්පූර්ණයෙන් ම ඒ රටේ ම පුරවැසියෙක් ආකාරයට තමයි ජීවත් වෙන්නේ. නමුත්, වසර 5ක් හෝ 10යක් නොවෙයි, වසර 200ක් මේ රටේ ජීවත් වෙච්ච මේ දෙමළ ශ්‍රමිකයින්ට ඔවුන්ගේ මූලික පහසුකම්වත් ලැබිලා නැහැ. ඒ කියන්නේ ඒක මහ

Photo Creadit : The Sunday Observer



**බේදවාචකයක් නෙවෙයි ද?**

අපි ඇමරිකාව ගත්තොත් රටක් වශයෙන් ඔවුන් අවුරුදු 200ක් වෙනවා. ඇමරිකාව ඒ වසර 200ට කෙතරම් දියුණුද? ලෝකය තුළ කෙතරම් බලවත් ද? කෙතරම් ඉදිරියක සිටිනවාද? රටක් ඒ සා මහත් විධියට දියණුවෙලා තිබෙද්දී, මිනිස් සමාජයක් විධියට ආව මේ ජනතාව සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් මේ තරම් පීඩාකාරී තත්ත්වයක් තුළ ජීවත්වනවා කියන්නේ, සාමාන්‍යයෙන් මනුෂ්‍ය සමාජයක් සඳහා  පිළිගන්න සුදුසු, පිළිගන්න පුළුවන් තත්ත්වයක් නෙවෙයි. වතු කම්කරු අම්මලාගේ දෑත්වල රුධිරය කූඩැල්ලන්ට පුදකරලා, තේ ගස්වලට යටකරලා උපයාගත්ත සොච්චම නිසා වතු දරුවෝ අධ්‍යාපනයෙන් ටිකක් ඉදිරියට ඇවිත් ඉන්නවා. මම දෙමළ ජාතිකයෙක් විධියට, ඒ සමාජයෙන් පැමිණි පුද්ගලයෙක් විධියට මම දකින්නේ අවුරුදු 125ක් බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මේ මිනිස්සු දුක්විඳලා තියෙනවා. තවත් අවරුදු 75ක් නිදහස් රාජ්‍ය තුළත් එකහා සමානව දුක්විඳලා තියෙනවා. සම්පූර්ණ වශයෙන් අවුරුදු 200 ය ම ඔවුන් දුක්විඳ තිබෙනවා. එසේ දුක්විඳලා තියෙනවා කියන්නේ ඔවුන් වෙනුවෙන් කිසිම වැඩපිළිවෙලක් තිබිලා නැහැ. වතු සඳහා විවිධ නිලතල, ඇමතිවරු පත්කළාට ඔවුන් නාමික වශයෙන් හිටියට, වතුකර ජනතාව වෙනුවෙන් නිසි වැඩපිළිවෙලක් නොතිබීම අපට ඉතා හොඳින් පෙනෙනවා.

එක පැත්තකින් බ්‍රිතාන්‍ය මේකට වග කියන්න ඕනේ මොකද, දකුණු අප්‍රිකානු රටවල් බ්‍රිතාන්‍යට විරුද්ධව වන්දි ඉල්ලා සිටිමින් නඩු පැවරුම් ක්‍රියාවලියක් සිදුවෙමින් පවතිනවා. බ්‍රිතාන්‍යට එරෙහිව ශ්‍රී ලංකාව අඩුම තරමේ එවැනි නඩු මග කට නොබැස්සට, බ්‍රිතාන්‍ය ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා ශ්‍රී ලංකා ආණ්ඩුවට යම් බලපෑමක් කරන්න, මේ ජනතාව සඳහා විශේෂ අවධානයක් යොමුකරන්න කියලා. ඒ වගේම ඉන්දියානු රජයටත් අත්සෝදාගෙන ඉන්න බැහැ උතුරු නැගෙනහිර දෙමළ ජනතාව ගැන අවධානයක් යොමුකළා වගේ තමුන්ගේ රටෙන් මෙහාට පැමිණිච්ච මේ ජනතාවට විශේෂ අවධානයක් යොමුකරන්න කියන කාරණාව. අනෙක් කරුණු තමයි, අවුරුදු 200ක් මේ රටේ ආර්ථිකය ගොඩනගන්න ශ්‍රමය කැපකරපු කණ්ඩායමක් විදියට වතුකර ජනතාවට ඉඩමක අයිතිය සහ නිවසක අයිතිය තහවුරු කරන්න ඕනේ. ඒ වගේ ම මේ ජනතාවගේ අනන්‍යතාවය ජාතික වශයෙන් පිළිගන්න ඕනේ "මලයගම් ජනතාව" විධියට. මේ රටේ සිංහල, ශ්‍රී ලාංකීක දෙමළ කියලා කියා ගන්න කණ්ඩායම් සහ මුස්ලිම් ජනතාවට පොදු පරිපාලන සේවාවන් ලබාගන්නට හැකියාවක්, අයිතියක් තියෙනවා වගේ ඒ පොදු පරිපාලන සේවාව සමස්ත වතු ජනතාවටත් ඒ හා සමානව භුක්ති විඳිමේ අයිතිය ලබාදීමේ වැඩපිළිවෙලක් රජය ලබාදෙන්න ඕනේ.

ගංවතුරින් හා නාය යෑම්වලින් විපතට පත්වෙච්ච මිනිස්සුන්ට ආණ්ඩුවෙන් මේ වන විට ඉඩම් ලබාදී තිබෙනවා, නමුත් ඒ මිනිස්සුන්ට කැමති විදියට ඒ ඉඩමේ නිවස හදාගන්න බැහැ, හැම දේම වතු වල අතපෙවීමට ලක් වී තිබෙනවා. හැමදෙයම වත්තට වාර්තා කරන්න ඕනේ. ඒ නිසා වතුකරයේ ජනතා හඬ හැටියට අපි ඉල්ලා සිටිනවා මේ  ඉඩම්වලට ඔප්පු ලබාදෙන්න කියලා. මේ සම්බන්ධයෙන් අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලිව්වා. නමුත් ඔවුන් අපට දැන්වුවා මේ ප්‍රශ්නය ඉඩම් අමාත්‍යංශයත් එක්ක යායුතුයි කියලා. පසුගිය ජනවාරි 25දා ජනාධිපතිතුමා මුණගැසීමට පැමිණියාම අපිව ජනාධිපති මහජන සබඳතා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමුකළා. එතුමාට අපි අපේ අවශ්‍යතාවය විශේෂකොට පෙත්සමක් භාරදුන්නා. එහිදී එතුමා, දිස්ත්‍රික්ක ලේකම් සහ ආණ්ඩුකාරවරයා අමතලා අපේ අවශ්‍යතාවය ගැන දැනුම් දුන්නා. පසුව මහා බලපොරොත්තුවක් ඇතිව අපි ආණ්ඩුකාරවරයාගේ ලේකම්තුමියවත් මුණගැසුණා. නමුත් ඒවා ඔක්කෝම හමුවීම්, සාකච්චා පමණයි. ගනුලැබූ කිසිම පියවරක් නැහැ. කෙසේ හෝ මේ ජනතාවට ඔප්පු ලබාදිය යුතුයි කියන ඉල්ලීම වගේ ම සමස්ත වතුජනතාවට ඉඩමක නිවසක අයිතිය ලබාදිය යුතුයි කියන ඉල්ලීම අපි ඉදිරිපත් කරනවා. මොකද මේ ඉල්ලීම් මේ මිනිසුන්ගේ ප්‍රධාන අයිතිවාසිකමක්.


**අනෙක් අයිතිවාසිකම තමයි මේ ජනතාවට රටේ පවතින පරිපාලනය සමඟ කිසිම සෘජු සම්බන්ධතාවක් පවත්වන්න හැකියාවක් නැහැ. දිස්ත්‍රික්ක ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිළධාරී යන නිළධාරීන්ගෙන් තමන් ම ගොස් අවශ්‍ය වැඩකටයුත්තක් කරගැනිමේ නිදහස වතුජනතාවට නැහැ. ඒ සඳහා වතු අධිකාරියේ ලිපියක් ලබාගෙන තමයි ඒ ඒ කාර්යාල සහ නිළධාරීන් මුණගැසීමේ කටයුතු සිදුවන්නේ. අතලොස්සක්වගේ තැනක දෙකක මේ ක්‍රියාවලියෙන් බැහැරව යාන්තමට ග්‍රාම නිළධාරිවරයා මුණගැසීමේ හැකියාව ලබා තිබුණත් සමස්තය ක්‍රියාත්මක වන්නේ වතු අධිකාරියේ බලය යටතේයි. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා මේ වහල් භාවයෙන් තොරව රටේ සාමාන්‍ය ජනතාව භුක්ති විඳින පරිපාලනමය කටයුතුවලදී සෘජු පෙනී සිටීමක් තුළ තමන්ගේ වැඩ කටයුතු කරගැනීමට ඒ අයිතිවාසිකම සමස්ත වතුජනතාවට ලබාදිය යුතුයි කියා.**

අනෙක් කාරණාව තමයි මේ වනතුරු දකුණේ වතුකරයෙන් බිහිවුණු කිසිම දේශපාලන නායකයෙක් නැහැ. වතුවලින් දේශපාලනයට සම්භන්ධකර ගැනීමේ කිසිම උත්සාහයක් හෝ තල්ලුවක්, වැඩපිළිවෙලක් නැහැ. දකුණේ ප්‍රධාන වතු 18ක් පමණ තිබෙන අතර, දැනට වතුකරයෙන් මාතර දිස්ත්‍රික්කයට ඡන්ද 25000 ක් පමණ තිබෙනවා. එතකොට මේ අතර දේශපාලන නායකත්වයට සුදුසු අය ඇත්තේ ම නැද්ද? යාන්තම් පුද්ගලයින් දෙන්නෙක් හෝ තිදෙනෙක් පහුගිය සමයේ ප්‍රාදේශීය සභාවට සම්භන්ධ වීම පමණයි දකුණේ වතුජනතාව අතර සිදුවුණු එකම පැමිණීම.

ඒ වගේම, වතුකරය කියපුව ම හැමෝ ම කථා කරන්නේ මාතලේ, නුවර, නුවරඑළිය, බදුල්ල, බණ්ඩාරවෙල තිබෙන වතු ගැන සහ වතු ප්‍රජාව ගැන පමණයි. දකුණේ වතු ගැන කිසිවෙක් කථාකරන්නේත් නැහැ. රටේ ජනතාව දන්නෙත් නැහැ දකුණේ වතු තිබෙනවා කියා. මේවා සියල්ල ඒ ජනතාවට කරනු ලබන මදිපුංචිකම්.

> ඊට පස්සේ 2003 වසර වන විට ඡන්ද අයිතිය ලැබෙනවා මිස එනම් කතිරය ගසන්න අයිතිය ලැබෙනවා මිස ඒ කතිරයට තිබෙන අයිතිය නිවරැදිව මොවුන්ට ලැබුණේ නැහැ. ප්‍රාදේශීය සභාවට නියෝජිතයින් තෝරන්න පත්කර ගන්න තමන්ගේ ඡන්දය පාවිච්චි කළත්, ඒ ප්‍රාදේශිය සභාවේ මුදලින් තමන්ට කිසිවක් කරගන්න බැහැ. 1987 ගෙනා ඒ පනතින් සඳහන් කරනවා ප්‍රාදේශීය සභාවේ මුදල් වතුවලට යොදවන්න බැහැ කියලා. මීට වසර කිහිපයකට පෙර උඩ පළාත ප්‍රාදේශීය සභාවේ සභාපති පෙරුමාල් යන අය ප්‍රාදේශීය සභාවේ මුදල් භාවිතා කරලා වත්තට යන පාරට කොන්ක්‍රීට් දැමූ නිසා ඔහුගේ සභාපති ධූරය අහිමි කළා. ඔවුන්ගේ බලය උදුරාගත්තා. අපිට පෙනෙනවා නීතිමය ආකාරයෙනුත් කොච්චර දුරට මේ ජනතාවගේ අයිතින් උල්ලංඝණය කර තිබෙනවාද කියන කාරණය.

## මාරිමුත්තු සත්‍යවේල් පියතුමා
### - මානව හිමිකම් ක්‍රියාධර



# අපිට පෙනෙනවා නීතිමය ආකාරයෙනුත් කොච්චර දුරට මේ ජනතාවගේ අයිතින් උල්ලංඝණය කර තිබෙනවාද කියන කාරණය

1931 දී ලංකාවේ මිනිස්සුන්ට සර්වජන ඡන්ද අයිතිය ලැබුණා. ගම් සභාවලට පවා ඡන්දය භාවිතා කිරීමේ අයිතිය තිබුණා. නමුත් 1938 දී ගම් සභාවලට ඡන්දය භාවිතා කිරීම කඳුකර ජනතාව ගෙන් උදුරාගනු ලැබුවා. එය ආරම්භ කළේ 1937 දී. පසුව 1947 වන විට ඒ ඡන්ද අයිතිය සම්පූර්ණයෙන් ම උදුරාගත්තා. පසුව 1949 වන විට ප්‍රජා අයිතිය යනුවෙන් පනතක් ගෙනාවා. ඒ තුළින් එවකට නවලක්ෂයක් පමණ වූ ජනතාවගේ සියලුම අයිතීන් උදුරාගනු ලැබුවා. ඉන්පසුව 1964 දී සිරිමා සාස්ත්‍රිය ගිවිසුම ගෙනාවා. ඒ ගිවිසුම තුළින් ඉන්දියාව පන්ලක්ෂ විසිපන්දහසකට ඉන්දියානු පුරවැසිභාවය ලබාදීමට ඉදිරිපත් වුණා. තවත් තුන්ලක්ෂයකට පුරවැසිභාවය ලබාදෙන්නට ලංකාව එකඟ වුණා. නමුත් එය මානුෂීය අයිතිවාසිකමක් උදුරාගනු ලැබූ ප්‍රධාන අවස්ථාවක් බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය පවා ප්‍රකාශ කළා. මොකද ඒ එකඟතාවන් සිදුවුණේ ජනතාවගේ කැමැත්තෙන් තොරව. ඒ නිසා, ඒ ජනතාව මේ රටේ පුරවැසියන් වශයෙන් පිළිගත්තේ නැහැ, සැළකුවේ නැහැ කියන එක අවධාරණය කරනවා.

ඊට පස්සේ 2003 වසර වන විට ඡන්ද අයිතිය ලැබෙනවා මිස එනම් කතිරය ගසන්න අයිතිය ලැබෙනවා මිස ඒ කතිරයට තිබෙන අයිතිය නිවරැදිව මොවුන්ට ලැබුණේ නැහැ. ප්‍රාදේශීය සභාවට නියෝජිතයින් තෝරන්න පත්කර ගන්න තමන්ගේ ඡන්දය පාවිච්චි කළත්, ඒ ප්‍රාදේශිය සභාවේ මුදලින් තමන්ට කිසිවක් කරගන්න බැහැ. 1987 ගෙනා ඒ පනතින් සඳහන් කරනවා ප්‍රාදේශීය සභාවේ මුදල් වතුවලට යොදවන්න බැහැ කියලා. මීට වසර කිහිපයකට පෙර උඩ පළාත ප්‍රාදේශීය සභාවේ සභාපති පෙරුමාල් යන අය ප්‍රාදේශීය සභාවේ මුදල් භාවිතා කරලා වත්තට යන පාරට කොන්ක්‍රීට් දැමූ නිසා ඔහුගේ සභාපති ධූරය අහිමි කළා. ඔවුන්ගේ බලය උදුරාගත්තා. අපිට පෙනෙනවා නීතිමය ආකාරයෙනුත් කොච්චර දුරට මේ ජනතාවගේ අයිතින් උල්ලංඝණය කර තිබෙනවාද කියන කාරණය.

ඒ සමඟම, 2019 ඔක්තෝබර් මාසයේ 29වෙනිදා ගැසට් මගින් නිවේදනය කරනවා එවකට තිබුණු ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතරව තවත් අලුතින් ලේකම් කාර්යාල 03ක් පිහිටුවන බවත් කඳුකරයටත් තිබුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතරව කාර්යාල 05ක් පිහිටුවන බව. ඒ කියන්නේ සිටින ජනගහනය අනුව එසේ කිරීම සාධාරණයි. නමුත් අවසානයේදී ගාල්ලේ කාර්යාල තුන පිහිටෙව්වෙ නිසා කඳුකරයේ කාර්යාල පහ පිහිටෙව්වෙ නැහැ. ඒ සඳහා දැවැන්ත උද්ඝෝෂණයක් ඇතිවුණාට පස්සේ උප කාර්යාල දෙකක් පිහිටෙව්වා. උප කාර්යාලවලින් මිනිස්සුන්ට අවශ්‍ය හැමදෙයක්ම ලබාගන්න බැහැ. විසඳා ගන්න බැහැ.

මේ සඳහා විවිධ උත්සාහයන් ගනු ලැබුවා. කෙසේවෙතත්, පසුගිය 29 වෙනිදා (මැයි 29) ඒ උප ලේකම් කාර්යාලවල තිබුණු නාමපුවරු ගලවලා පාට වෙනස් කරලා ඒ නාමපුවරුම යළිත් සවිකරලා තියෙනවා. ඉතිං මේවා මහා රැවටීම් නෙවෙයිද? ගැසට් නිවේදනයට පිටුපාලා සිදුකර තිබෙන වැරැදි වැඩක් නිසා මේ පිළිබඳව සොයා බලා ඊට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගන්න, දඬුවම් කරන්න අදාළ ඇමතිට පුළුවන්. නමුත් එසේ නොකළේ කඳුකර දෙමළ ජනතාව නිසාද? නමුත් කොමිස් ගැනීමේ පරමාර්ථයෙන් කාර්යාල පහකට අවශ්‍ය සියලුම බඩු භාණ්ඩ යනාදිය මිළ දී ගත්තා. ඒවා කාටද? කොහේද තියෙන්නේ? මොවුන් කඳුකර ජනතාව වශයෙන් මේ රටේ පුරවැසියෝ විදියට පිළිගැනීමට ඇති අකමැත්ත නිසා තමයි මේ සියලුම අසාධාරණ සැළකිලි.

1947 වන විට ලංකාවේ පළමුවෙන් ම සිංහල ජනතාව හිටියා. ඊට පසුව කඳුකර දෙමළ ජනතාව 11.9 ක් හිටියා. ඊට පසුව තමයි ලාංකීය දෙමළ ජනතාව නැතිනම් උතුරු නැගෙනහිර දෙමළ ජනතාව. එදා 11.9ක් හිටිය කඳුකර දෙමළ ජනතාව අද

වන විට 4.8 කට අඩුවෙලා තිබෙනවා. නමුත් අපි මේ බැස්ම හඳුන්වන්නේ අඩුවෙලා නෙවෙයි අඩු කෙරුවා කියලයි. අපි කියනවා, සංඛ්‍යාලේඛණ ගැනීමේ දී වෙනම තීරුවක් තියෙන්නට අවශ්‍යයි කඳුකර දෙමළ ජනතාව වෙනුවෙන්. ඒ සාධාරණය ඉටුවිය යුතුයි. අනෙක් ඉටුවිය යුතු සාධාරණය තමයි ඒ මිනිස්සුත් මේ රටේ තවත් ජාතියක් හැටියට පිළිගන්න ඕනේ. (දැනටත් ඔවුන් ව හඳුන්වන්නේ බර්ග, මැලේ විදියටයි.) ඔවුන්ගේ ජාතිකත්වය පිළිගන්න අවශ්‍යයි. ඒ ජාතිකත්වයට හිමි පුරවැසියන් මේ රටේ සිටිනවා කියන එක පිළිගන්න ඕනේ. ඒ සමගම ඒ ජාතියට, පුරවැසිභාවයට ලැබිය යුතු හිමිකම් ලැබිය යුතුයි. ඒ හිමිකම්වල පළමුවැන්න ඉඩමක අයිතිය. අවුරුදු 200ක් ජීවත්වෙන ප්‍රදේශයේ පොළොව ඒ ජනතාවට අයිති නැහැ තවම?



**සාමාන්‍යයෙන් රජයේ ඉඩමක** දිර්ඝකාලීනව ජීවත්වුනොත් ඒ ඉඩම පවරා දෙනවා. කඳුකරය කියන දේශය නිර්මාණය කළේ මේ ජනතාව. පෝෂණය කළේ මේ ජනතාව. ඒ නිසා ඒ දේශයේ ජීවත්වීමේ අයිතිය ලැබෙන්න ඕනේ. ඒ නිසා අපි කියන්නේ මේ ජනතාවට ඉඩමක නිවෙසක අයිතිය අනිවාර්යයෙන් හිමිවිය යුතුයි. වතු කොම්පැණිවලට දෙන අවස්ථාවේදී 1990 ගණන්වල කම්කරුවන් ලක්ෂ 05ක් සිටියත් අද දවස වන විට සේවයේ යෙදෙන්නේ 123000ක් පමණයි. අනික් කම්කරුවන්ට මොකද වුණේ? ඒ ඒ ප්‍රදේශවල අනාථයෝ බවට පත්වෙලාද? රැකියාවෙන් ඉවත්වෙලාද? ඔවුන්ට කුමක් සිදුවුණාද කියලා ආණ්ඩුව සොයා බලන්න ඕනේ.

වතු රැකියාව කියන්නේ ගෞරවනීය රැකියාවක්. නමුත් මේ රැකියාව තුළ ආරක්ෂාවක් නැහැ. රැකියා අයිතීන් නැහැ. වහල් සේවයක යෙදෙන්නේ. මෙවැනි කාරණා නිසා මිනිස්සු ඉබේම රැකියාවෙන් ඉවත් වෙනවා. එසේ රැකියාව අත්හරින්නට ඔවුන්ව පත්කරලා තිබෙනවා. මේ වහල් බැම්වලින් මේ ශ්‍රමිකයින්ව නිදහස් කරන්නේ කවදාද?

> ඇත්තටම අපේ පුංචිකාලේ ඉඳලාම හිතට වැදුණු කාරණාවක්. අල්ලපු ගමට ලියුං එනව අපිට එන්නේ නැහැ. අපිට ගෙදරට ලියුං එන්නේ නැහැ. ලියුං එන්නේ වත්තෙ පරිපාලනයට තමයි ලියුං යන්නේ. හැමදාම ගිහිං බලන්න ඕනේ අපට ලියුං ඇවිත්ද කියලා. නොගියොත් අපිටම තමා අවාසි. අපේ සියලුම කාරණා සිදුකෙරුණේ ඒ ආකාරයෙන් තමයි. නමුත් ඇතැම් වතුවල තැපැල් බෙදන්නෝ කියලා කණ්ඩායම් දමා තිබෙනවා. දැනටත් කඳුරට වතු කිහිපයක මේ සේවාව සිදුවෙනවා. නමුත් බහුතරය කළමණාකාරීත්වය සතු තැපැල් පෙට්ටියට තමා ලිපි දමන්නේ. විධිමත් ලිපිනයන් නැතිව මේතාක් නොයෙකුත් කලබල, ගැටුම්, ගැටළු ඇති වී තිබෙනවා.

## ජීවරත්නම් සුරේෂ්
### - මානව හිමිකම් ක්‍රියාධර



# විධිමත් ලිපිනයන් නැතිව මේතාක් නොයෙකුත් කලබල, ගැටුම්, ගැටළු ඇති වී තිබෙනවා

මනුෂ්‍යයෙකුට ජීවත් වෙන්න ගෙයක් දොරක් තියෙන්න ඕනෙ. සමාජයක ජීවත්වන මනුෂ්‍යයෝ විදියට පිටස්තර ලෝකය සමග සම්බන්ධ වෙන්න ගනුදෙණු කරන්න නිවසකට ලිපිනයක් අවශ්‍ය කරනවා. නූතන තාක්ෂණය දියුණු වී නොයෙකුත් උපාංග භාවිතා කරමින් සමාජය සමග ගනුදෙණු කළත් ගෙදරට ලිපිනයක් නැතිනම් තැපැල් ලිපිනයක් තිබිය යුතු වෙනවා. පෞද්ගලීකව කටයුතු කිරීමට සහ පරිපාලනමය කටයුතු සඳහා තැපැල් ලිපිනය ඉතාම ප්‍රයෝජනවත්.

මමත් වතු ජනතාවගෙන් පැවත එන්නෙක් විධියට ස්ථිර ලිපිනයක් නැතිව බොහෝ දුෂ්කරතාවලට කටුක අත්දැකීම්වලට මුහුණ දුන්නා. ඒ නිසාම තමයි ස්ථිර ලිපිනයක් ලබාගැනීම සඳහා පියවරක් අරගත්තේ. වසර 200ක් වනතුරු වතුකර ජනතාව පිළිබඳව බලධාරීන්ට නිළධාරීන්ට කිසිම කල්පනාවක්, හැඟීමක් අවබෝධයක් නොතිබීම ඉතාම කණගාටුදායකයි. පෞද්ගලිකව අපට තිබිය යුතු වැදගත් අංගයක් නොමැති වීම අපට විශාල පාඩුවක්. ඒ වගේම රාජ්‍ය පාලනය දරණ අය ගැනත් පිටස්තර ලෝකයට යැවෙන පණිවුඩය ඉතාම ලැජ්ජා සහගතයි.

කෙසේවෙතත්, සමස්ත වතුකර ජනතාව වෙනුවෙන් මම ගත් උත්සාහයට අධිකරණය තුළින් යහපත් ප්‍රතිචාරයක් ලැබිලා නඩුවාරයකුත් පහුවුණා. ඒ ගැන සන්තෝෂයක් තිබෙනවා. ඒක ජයග්‍රහණයක් ඇත්තටම. ඒ වගේම ආණ්ඩුව පාර්ශවයෙන් පැමිණි නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥයෙකු පිළිඅරගෙන තිබෙනවා ලිපිනයන් නැතිවීමේ ගැටළු පවතින බව. ඒ සඳහා කළයුත්තේ කුමක්ද? එය කෙසේ කරනු ලබන දෙයක්ද? පිළිබඳව වාර්තාවක් සැප්තැම්බර් මාසයේදී පැවැත්වෙන ලබන නඩුවාරයේදී දැනුම්දෙනු ඇති බව තමයි අපට වාර්තා වුණේ. එතෙක් අපට නැවතී බලාසිටින්න සිදුවෙනවා.

ඇත්තටම අපේ පුංචිකාලේ ඉඳලාම හිතට වැදුණු කාරණාවක්. අල්ලපු ගමට ලියුං එනව අපිට එන්නේ නැහැ. අපිට ගෙදරට ලියුං එන්නේ නැහැ. ලියුං එන්නේ වත්තෙ පරිපාලනයට තමයි ලියුං යන්නේ. හැමදාම ගිහිං බලන්න ඕනේ අපට ලියුං ඇවිත්ද කියලා. නොගියොත් අපිටම තමා අවාසි. අපේ සියලුම කාරණා සිදුකෙරුණේ ඒ ආකාරයෙන් තමයි. නමුත් ඇතැම් වතුවල තැපැල් බෙදන්නෝ කියලා කණ්ඩායම් දමා තිබෙනවා. දැනටත් කඳුරට වතු කිහිපයක මේ සේවාව සිදුවෙනවා. නමුත් බහුතරය කළමණාකාරිත්වය සතු තැපැල් පෙට්ටියට තමා ලිපි දමන්නේ. විධිමත් ලිපිනයන් නැතිව මේතාක් නොයෙකුත් කලබල, ගැටුම්, ගැටළු ඇති වී තිබෙනවා.


කෙසේ වෙතත් වතු ජනතාව සඳහා ලිපිනයන් ලබාගැනීම වෙනුවෙන් මා නඩු මාර්ගයට පිවිසීම ගැනත්, ඔවුන් කරන්න හිටි කාර්යයක් මා විසින් පෙරමුණ ගැනීම ගැනත් රාජ්‍ය පාලනයට සිත් රිදී ඇති බවක් මට අත්දකින්නට හැකිවුණා.

වසර 200ක් ඉක්මවා යාමේදී ද තවදුරටත් කඳුකර දෙමළ ප්‍රජාව ඇතුළු සමස්ත වතුකර ජනතාවගේ මූලික අයිතිවාසිකම්වත් ලබාදෙන්නට රාජ්‍ය පාලකයින් බලධාරින් කටයුතු නොකරන්නේ නම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික, සමාජවාදී ජනරජය යන නාමය වෙනස්කරන්නට සිදුවනු ඇත. මන්ද, එවැනි වචන උච්චාරණය කරන්නට හැකි වුව ද, එහි ඇති ප්‍රායෝගි ප්‍රජාතන්ත්‍රයක් හෝ සමාජවාදී ගති ලක්ෂණයන් නොපවත්වන නිසාය.

**ඡායාරූප සහ සටහන**
**සී. එම්. එම්. පෙරේරා**

# රාජ්‍ය අනුග්‍රහය ඇතිව හොරුන්ට පාර කපන

# මාධ්‍ය මර්ධන පනත්




**රජය මේ විකාශන නියාමන පනත හා සමාජ මාධ්‍ය නියාමන පනතත්, ප්‍රතිත්‍රස්ත පනතත්, දූෂණ විරෝධී පනතත් හරහා අපට අනතුරු අගවන්නේ කුමක්ද? පාර්ලිමේන්තු හා රජයේ සියල්ලන් මොන මගුලක් කළද උඹලා මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන ලෙස කට වහගෙන අපි කියන විදිහට හිටපල්ලා නැත්තම් ලයිෂන් කැන්සල් කරනවා, නැත්තම් තොපිව අත් අඩංගුවට ගෙන හිරේ දානවා කියා නොවේද? ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ දූෂණ හමුවේ කතා කරන්නට බැරිය. ජනතාවගේ දුක පිඩාව හමුවේ කතා කරන්නට බැරිය. වැරදි තීන්දු තීරණ විවේචනය කරන්නට බැරිය.**

ලංකාවේ මාධ්‍ය මර්ධනය කිරීම සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇත. බොහෝ විට ජනමාධ්‍ය හඬ නිහඬ කිරීම පිටුපස පැවැති සියලු රජයන්හී සෙවනැලි තිබූ අතර ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග පාලන සමයේදී 'නිසි බලධරයෙක්' මාධ්‍ය වෙනුවෙන් පත් කර කපන මණ්ඩලයක් ඇති කරන ලදි. එකී කපන මණ්ඩලයේ කතුරට බොහෝ පුවත් කැපී ගියේ එවකජනාධිපති චන්ද්‍රිකා ගේ රජය එක පිට එක යුද්ධයෙන් ලබන පරාජයන් හා දුර්දාන්ත පාලනය ජනතාවගෙන් සඟන්නටය. මාධ්‍යවේදීන්ට තර්ජනය කිරීම, මාධ්‍යවේදීන්ට පහරදීම, මාධ්‍ය ආයතන ගිනි තැබීම, මාධ්‍යවේදීන් ඝාතනය කිරීම දක්වා එය වැඩි වර්ධනය විය. බොහෝ මාධ්‍යවේදීන් පිරිසක් අවසානයේ තර්ජන හමුවේ රට හැර යෑම දක්වා එය විකාශය විය. රාජපක්ෂ පාලන සමය මාධ්‍ය මර්ධනයේ කූඨප්‍රාප්තිය විය.

ඉන් පසු යහපාලන පාලන සමයේදී යම් යම් මාධ්‍ය තර්ජන තිබුනද, එය රාජපක්ෂ පාලන සමයේ මෙන් ප්‍රචන්ඩකාරී ක්‍රියාවන් දක්වා විකාශය නොවීය. සිද්ධියක් දෙකක් ඇරෙන්නට බරපතල ප්‍රචණ්ඩකාරී මාධ්‍ය මර්ධනයක් එවක ඇති නොවීය. නමුත් යහපාලන සමයේ මාධ්‍ය මර්ධනය වෙනත් හැඩයකින් ක්‍රියාත්මක විය. එනම් මර්ධනය කිරීම වෙනුවට මාධ්‍ය හීලෑ කිරීමේ ක්‍රමවේදයක් එසමයේ ක්‍රියාත්මක විය. විශේෂයෙන් මාධ්‍ය නිදහස වෙනුවෙන් ක්‍රියාකාරීව සටන් කළ මාධ්‍ය සංවිධානවල නිලධාරීන්ට හා සාමාජිකයින්ට විවිධ මානසික අල්ලස් ලබාදෙමින් රජයේ ආයතන, අමාත්‍යාංශවල, මාධ්‍ය ආයතන තුළ ඉහළ පුටු ලබාදෙමින් බොහෝ සටන් සගයින්ව හිලෑකරමින් බැද දැමීමට යහපාලන රජය උපායශීලීව කටයුතු




**මෙම පනතේ එක් තැනෙක "ඇබියුස් ඔෆ් පවර්" (Abuse of power ) හෙවත් බලය අනිසි ලෙස භාවිතා කිරීම ලෙස සඳහන් වෙනවා. නමුත් "බලය" යනු කුමක්ද? එය "අනිසි ලෙස භාවිතා කිරීම" යන්න කුමක්දැයි නිසි අර්ථකථනයක් දක්වා නැහැ. රජයට ඕනෑම අවස්ථාවක තමන්ට එරෙහිව යමක් මාධ්‍යයේ පළ වෙන විට එය "බලය අනිසි ලෙස භාවිතා කිරීමක්" ලෙස අර්ථ දක්වා මාධ්‍ය ආයතනයට එරෙහිව කටයුතු කිරීමේ හැකියාව තියෙනවා. එසේම තව තැනක "සමාජ අභිමතාර්ථ කැඩීම" යනුවෙන් සඳහන් වුවද "සමාජ අභිමතාර්ථ" යනු කුමක්දැයි නිසි ලෙස අර්ථ නිරූපණය කර විග්‍රහ කර නැහැ. ඇතැම් විට පාර්ලිමේන්තුවේ ඇමතිවරයෙකු කළ දූෂණයක් එළිදරව් කිරීමද "සමාජ අභිමතාර්ථ කැඩීමක්" ලෙස අර්ථ දැක්වීම කළ හැකියි. එසේම "සත්‍ය නියාමනය" කිරීමක් ගැන මෙහි සඳහන් වේ. සත්‍ය යනු සත්‍යයි එය අමුතුවෙන් නියාමනය කළ යුතු නොවේ. සත්‍යය නියාමනය කිරීම යනු සත්‍යය යටපත් කර වසන්කර අසත්‍යය එළි දැක්වීමද?**

කරන ලදි.

වත්මන් රනිල් - රාජපක්ෂ රජයද මේ වන විට ඉතා උපායශීලීව මාධ්‍ය මර්ධනය ගෙන එමින් තිබීම බරපතල කාරණාවකි. එය වෙනම හැඩයක් ඇති තක්කඩි මර්ධන ක්‍රමවේදයක් බව මේ වන විට පෙනෙමින් තිබේ.
විශේෂයෙන් මර්ධනය නිත්‍යානුකූල කරමින් විවිධ පනත් ගෙන එමින් එකී පනත්වල විවිධ වගන්තිවල මාධ්‍යවේදීන් හිර කර නිත්‍යානුකූලව දඬුවම් කිරීම වර්තමානයේ රජය උත්සහ කරන තක්කඩි මර්ධන ක්‍රමවේදය වේ. "**විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනත**" හා "**සමාජ මාධ්‍ය නියාමන පනත**" එහි ප්‍රධාන තක්කඩි ලියැවිලි වේ. ඊට අමතරව "**ප්‍රතිත්‍රස්ත පනත**" හා "**දූෂණ මර්ධන පනත**" හරහාද විවිධ වගන්ති මගින් මාධ්‍ය මර්ධනය සඳහා රජය මේ වන විට නිත්‍යානුකූල මාධ්‍ය මර්ධනයක් කිරීම සඳහා කටයුතු කරමින් සිටියි.

## රජයට මාධ්‍ය මර්ධනයට ඇති උවමනාව

මාධ්‍ය නියාමනය යන නම පෙරට දමා ගනිමින් රජය විසින් මාධ්‍ය මර්ධනය කිරීමට විවිධ පනත් ගෙන ඒමට මෙතරම් යුහුසුලුව උත්සහ දරන්නේ ඇයිදැයි ගැඹුරින් විමසා බැලීම වටී. රජයට ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් මේ මොහොතේ මෙතරම් බය වන්නේ ඇයි?

පැවැති අරගලයෙන් මුළු රටම පාරට බැස්සේ දූෂිත රාජපක්ෂ රජය හා එහි සිටි දූෂිතයින් පන්නා දමා "සිස්ටම් චේන්ජ්" එකක් කිරීමටය. නමුත් අරගලයට පිංසිදුවන්නට කුමන්ත්‍රණකාරී ලෙස හොර පාරෙන් පැමිණ ජනාධිපති පුටුවේ ඉඳගත් රනිල් වික්‍රමසිංහ තවමත් රටම විරෝධය පෑ දූෂිත රාජපක්ෂ නඩය හා මැති ඇමතිවරුන්ගේ ආරක්ෂකයා බවට පත්වෙමින් සිටී. තවදුරටත් රටේ පොදු ජනතාවගේ මුදල් වංචා කිරීම, නාස්ති කිරීම, අවභාවිතා කිරීම, වැඩිවෙමින් තිබේ. රටේ ජනතාවට බදු පිට බදු ගසමින් රජයේ මැති ඇමතිවරුන්ගේ හා සුරතලුන්ගේ මිලියන ගණන් බදු හා බැංකු ණය බොල් ණය ලෙස කපමින් සිටි. තමන්ගේ හිතවතුන්ට එක නීතියකුත්, විරුද්ධවාදීන්ට තව නීතියකුත් ලෙස නීතිය අවභාවිතා කරමින් සිටී. ජනතාවගේ අත්‍යවශ්‍ය බඩු භාණ්ඩ ඉහළ යද්දී ජනතා මුදලින් පිනට කමින් තමුන්ගේ රක්ෂණය පවා වැඩිකර ගනිමින් මැති ඇමතිවරුන් සැප විඳිමින් සිටී.

රජය මේ වන විට මවා පෙන්වන කෘතිම ආර්ථකයක් පෙන්වමින් ඩොලරයේ අගය පහළ දමමින් සිටී. නමුත් මේ වන විට රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබෙන ණය මුදලින් යැපුම් ආර්ථකයක් පවත්වාගෙන යනු විනා නිෂ්පාදන ආර්ථිකයක් සඳහා කිසිදු සැලැස්මක් ඇති බවක් නොපෙනේ. එසේම දේශීය නිශ්පාදනය වැඩි කිරීමේ හා අපනයන ආර්ථිකයක් ඇති කිරීමේ සැලැස්මක් රජයට ඇති බවක් නොපෙනේ. සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමටද විධිමත් සැලැස්මක් ඇති බවක් නොපෙනේ. විශේෂම කාරණය වන්නේ රටට ආයෝජකයින් ගෙන්වා ගැනීමටද විධිමත් සැලැස්මක් නොපෙනේ.
ජාවාරම්කාරයින්ව ආයෝජකයින් ලෙස රටට ගෙන එමින් තමන්ට අවශ්‍ය කොමිස් කුට්ටි ලබා ගැනීම ගැන පමණක් සිතයි. එසේම ආයෝජකයින්ගෙන් කප්පම් ලබා ගනිමින් අධිකරණයෙන් වරදකරුවන් වී සිටින ප්‍රසන්න රණතුංග වැනි දූෂිත කප්පම්කරුවන් ඇමති මණ්ඩලයේ සිටී.

එසේම නොගෙවා නවතාගෙන සිටින බිලියන 5කට ආසන්න හිඟ ණය වාරික පොලී සමග නැවත ගෙවීමට තිබේ. ණය ප්‍රතිව්‍යුහගත කරමින් ණය ගෙවීමටත් දැනට නවතා දමාගෙන සිටින සමහර අත්‍යාවශ්‍ය භාණ්ඩ නැවත ආනයනය කරන්නට සිදු වූ විට ඩොලරයේ අගය නැවත සීග්‍රයෙන් ඉහළ යනු ඇත. මුදල් මිලියන ගණනින් අච්චුගැසීම නිසා රට තුළ දැනට ඇතිව තිබෙන උද්ධමනය ඉදිරියේ තව තවත් ඉහළ යනු ඇත. එවිට මේ තාවකාලික සුන්දර මවා පෑම නිමවී මුලු රටටම යථාර්තයට මුහුණ දීමට සිදුවනු ඇත. එවිට රනිල්ගේ තාවකාලික වීරත්වය සුනුවිසුණු වනු ඇත. ඇත්තම ඇත්ත අවංක හැකියාව ඇති දක්ෂ වීරයෙක් රටට ඕන වන දිනයක් උදා වනු ඇත. චන්දයකට බය වී සිටින, ඉතිහාසය පුරාම චන්දවලින් නොසෑහෙන්න බැට කා සිටින රනිල් වික්‍රමසිංහ නමට සිංහයෙක් මිස සැබෑවට ඡන්දයකට මුහුණ දීමට තරම් ධෛර්‍යයක් ඇති සැබෑ සිංහයෙක් නොවන නිසාම මැතිවරණ සිතියම හකුලා මර්ධනය කෙරේ විශ්වාසය තබා ඇත. ඉදිරියේදී නැවතත් ජනතාව පීඩාවන්ගෙන් මිරිකී තැලී පොඩිවී සිටීම තවදුරටත් නොඉවසා පාරට බැස අරගලයේ දෙවන අදියර දියත් කරනු ඇත. ජනමාධ්‍ය හා සමාජ මාධ්‍යයෙන් එයට පොහොර වැටීම නොවැළැක්විය හැකි කරුණකි. එනිසා රජය කල්තියාම මාධ්‍ය මර්ධන පනත්, දූෂණ මර්ධන පනත්, ත්‍රස්ත මර්ධන පනත් ගෙන එමින් ඒවායේ ඇතැම් වගන්ති අස්සට මර්ධනයට පහසු වන වචන, අර්ථ හා විග්‍රහයන් ඇතුළු කර මර්ධනයට පෙර සූදානමක් ඇති කිරීම මේ වන විට මෙම පනත් හරහා සිදු වෙමින් පවතී.

## රජය කියන විද්‍යුත් විකාශන පනතේ අවශ්‍යතාවය

විද්‍යුත් විකාශන නියාමන පනතක් මේ කඩිමුඩියේ ගෙන එන්නේ ඇයි? රජය පවසන පරිදි මාධ්‍ය ආයතනවල විකාශන කටයුතු නියාමනය කිරීමට රට තුළ නිසි ක්‍රමවේදයක් නැති නිසා තමුන් මෙම ක්‍රමවේදය සකසන බවයි. නමුත් මාධ්‍ය නියාමනය හෝ මාධ්‍ය ආචාර ධර්ම සැකසීමට සෘජුවම රජය මැදිහත්වීම තුළින් සිදුවන්නේ මාධ්‍ය නියාමනයක් නොව මාධ්‍ය මර්ධනයකි. එසේම රජය පවසන්නේ මාධ්‍ය ආයතනවලට විකාශන බලපත්‍ර නිකුත් කිරීමේ පොදු නීතියක් රට තුළ නොමැති බවයි. දැනට ලබා දී ඇති බලපත්‍ර සියල්ල තාවකාලික බලපත්‍ර බවත් ඒවා අවලංගු කිරීමට ඕනෑම අවස්ථාවක හැකියාවක් ඇති බවද රජය පවසයි. මෙයින් පෙනෙන්නේ බලපත්‍ර පෙන්වා බිය ගන්වා මාධ්‍ය හීලෑ කිරීමට රජය උත්සහා දරණ බවකි.

එසේම රජය නියෝජනය කරන ඇතැමුන් විදෙස් රටවල ඇති මෙවැනි පනත් ද ගෙනහැර දක්වමින් අප රටටද එවැනි පනතක් අවශ්‍ය බව තහවුරු කිරීමට උත්සහ කරමින් සිටී. නමුත් වෙනත් රටවල පාර්ලිමේන්තුවේ සිටින මැති ඇමතිවරුන් ලංකාවේ මෙන් දූෂිතයින් නොවන බවත්, ඒ රටවල "නීතිය මත පාලනය" නිසියාකාරව සිදුවන බවත්, ස්වාධීන, දූෂණයෙන් තොර රාජ්‍ය පාලනයක් ඒ රටවල සිදුවන බවත් එම අදහස් දක්වන රජයේ නියෝජිතයින් අමතක කර ඇත.

එසේම යෝජිත පනත් කෙටුම්පත සැකසීම උදෙසා කැබිනට් අනුකාරක සභාවක් පත් කර ඇති අතර අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ එහි සභාපති ධුරය දරණ අතර බන්දුල ගුණවර්ධන, කෙහෙළිය රඹුක්වැල්ල, නිමල් සිරිපාල ද සිල්වා, මනූෂ නානායක්කාර, රමේෂ් පතිරණ යන අමාත්‍යවරු මෙම කැබිනට් අනුකාරක සභාව නියෝජනය කරන අතර මෙම අනුකාරක සභාව සම්බන්ධයෙන් "ජනමාධ්‍ය සමාජයේ" එතරම් පැහැදීමක්, විශ්වාසයක් හෝ කැමැත්තක් නැති බව "ජනමාධ්‍ය සමාජයේ" සෑම සංවාදයකදීම පෙනෙන්නට තිබේ. එසේම ප්‍රධාන ධාරාවේ විද්‍යුත් නාලිකාවලින් සැදි විද්‍යුත් විකාශකයින්ගේ සංගමයද සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ද මෙම පනත ප්‍රතික්ෂේප කර තිබේ. මාධ්‍ය සංවිධාන හා පොදු මාධ්‍ය සමාජය මෙයට එරෙහිව ප්‍රබල ලෙස විරෝධය පාමින් සිටී.

## ස්වාධීන නැති පක්ෂග්‍රාහී දේශපාලනීකරණය වූ කොමිසමක් මගින් නියාමනය කිරීම

මෙහිදී මෙම යෝජිත පනත මගින් පත් කරන යෝජිත කොමිසමේ සංයුතිය සලකා බැලීම වටී. යෝජිත කොමිෂන් සභාව සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත වන අතර අමාත්‍යාංශ ලේකම්වරයෙක් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි සාමාජිකයෝ වෙති. සෙසු සාමාජිකයින් තිදෙනා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දායක සභාවේ අනුමැතියට යටත්ව ජනපති විසින් පත්කරනු ලබයි. සාමාජිකයින් අතුරින් සභාපතිවරයා තෝරා පත් කරනු ලබන්නේ ජනපති විසිනි. මෙම සංයුතිය සලකා බැලීමේදී පැහැදිලිව මෙය තුළ කිසිදු ස්වාධීන බවක් නැති බව ඕනෑම පොඩි එකෙකුට පෙනී යයි. එසේම පවතින රජයට සම්බන්ධ නිලධාරීන් හා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් නිසාම මෙම කොමිසමට ජනාධිපතිවරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලයට "කඩේ යනවා" විනා වෙන සැලකිය යුතු නියාමන රාජකාරියක් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැත. හරියට අපි විසින් හීලෑ කරගෙන සිටින මිනීමරු බල්ලන් රැළක් මෙන් "උසී උසී හපපිය" කියද්දී පැන පැන හපනවා, බුරනවා විනා මෙම කොමිසමේ සාමාජිකයින්ට රටේ ජනතාවට හෝ ජනමාධ්‍ය සමාජයට සැලකිය යුතු සේවයක් කිරීමට කොහෙත්ම හැකියාවක් ලැබෙන්නේ නැත.

## මර්ධනය සඳහා ඇති සැඟවුණු වගන්ති හා ඉලක්කයක් නැති අර්ථ දැක්වීම්

අසභ්‍ය ප්‍රකාශන පනත ගත් කළ එහි "අසභ්‍ය" යන වචනය නිසි ලෙස අර්ථ දක්වා නැත. කෙනෙකුට සම්පූර්ණ නිරුවතින් සිටීම අසභ්‍ය විය හැකිය. තව කෙනෙකුට කකුලක් පමණක් පෙන්වීමද අසභ්‍ය විය හැකිය. එහි "අසභ්‍ය" යන්න නිර්වචනය වන්නේ අදාළ පුද්ගලයින්ගේ ආකල්ප මතය. මෙම විද්‍යුත් විකාශන නියාමන කොමිෂන් සභා පනතේ ඇතැම් වගන්ති හා වචනද එසේමය.

මෙම පනතේ එක් තැනෙක "ඇබියුස් ඔෆ් පවර්" (Abuse of power ) හෙවත් බලය අනිසි ලෙස භාවිතා කිරීම ලෙස සඳහන් වෙයි. නමුත් "බලය" යනු කුමක්ද? එය "**අනිසි ලෙස භාවිතා කිරීම**" යන්න කුමක්දැයි නිසි අර්ථකථනයක් දක්වා නැත. රජයට ඕනෑම අවස්ථාවක තමන්ට එරෙහිව යමක් මාධ්‍යයේ පළ වෙන විට එය "**බලය අනිසි ලෙස භාවිතා කිරීමක්**" ලෙස අර්ථ දක්වා මාධ්‍ය ආයතනයට එරෙහිව කටයුතු කිරීමේ හැකියාව තිබේ. එසේම තව තැනක "**සමාජ අභිමතාර්ථ කැඩීම**" යනුවෙන් සඳහන් වුවද "**සමාජ අභිමතාර්ථ**" යනු කුමක්දැයි නිසි ලෙස අර්ථ නිරූපණය කර විග්‍රහ කර නැත. ඇතැම් විට පාර්ලිමේන්තුවේ ඇමතිවරයෙකු කළ දූෂණයක් එළිදරව් කිරීමද "**සමාජ අභිමතාර්ථ කැඩීමක්**" ලෙස අර්ථ දැක්වීම කළ හැකියි. එසේම "**සත්‍ය නියාමනය**" කිරීමක් ගැන මෙහි සඳහන් වේ. සත්‍ය යනු සත්‍යයි එය අමුතුවෙන් නියාමනය කළ යුතු නොවේ. සත්‍යය නියාමනය කිරීම යනු සත්‍යය යටපත් කර වසන්කර අසත්‍යය එළි දැක්වීමද? එය පනත තුළ ප්‍රශ්නකාරී වේ.

## බන්දුලගේ කටින් පැන්න ලෝකෙට ඇත්ත හංගා බොරුව එළිදැක්වීම

"සත්‍යය නියාමනය" යන වචනයේ සැබෑ අරුත හා ආණ්ඩුවේ සැබෑ අභිලාෂය කුමක්දැයි මාස කිහිපයකට පෙර බන්දුල ගුණවර්ධන ඇමතිවරයා කළ කතාවක් ගැඹුරින් හැදෑරීමේදී පසක් වේ. ඔහු කියන දළ අදහස මෙසේයි.

"**කිසිම මාධයයක් මර්ධනය කරන්නෙ නැහැ. අපි මාධ්‍ය නියාමනයක් කරන්නෙ. උසස් මාධ්‍ය නියාමනයක් ඇති කරනවා. විදේශ රටවලට අපේ රටේ ප්‍රතිරූපය වැරදි විදිහට යන එක නියාමනය කරන්ඩ අවශ්‍යයි. ගුවන් තොටුපලට යන මාර්ගය අවහිර කරලා උද්ඝෝෂණය කරන බව, පාර්ලිමේන්තුවට රැස්වෙන්න බැරි බව, පාර්ලිමේන්තුව අසල විරෝධතා ගැටුම් ඇතිවන බව, ජනාධිපති නිල නිවස අසල විරෝධතා ඇති වන බව, ජනාධිපතාවරයගේ පිහිනුම් තටාකයේ නාන පිංතූර, විදේශිකයින්ගේ පවා හැඳුණුම්පත් ඉල්ලගෙන පරීක්ෂා කරන බව, පෙට්රල් - ඩීසල් පෝලිම් ලඟ ඇතිවෙලා තිබ්බ තදබදය නිසා විදේශිකයින්ට ඇතිවෙලා තියෙන ප්‍රශ්න ගැන මාධ්‍යය මුල් පුවත් ලෙස විකාශනය කිරීමේදී රට සම්බන්ධව විශාල ප්‍රතිරූප කඩා වැටීමක් තිබෙනවා. අපි ඉපදුණු රට ගැන පහළ මට්ටමක ප්‍රතිරූපයක් විදේශීයව ප්‍රචාරය වීම රටට හිතකර නොවන නිසා රටේ ප්‍රතිරූපයට හානි නොවන ලෙස මාධ්‍ය හා සමාජ මාධ්‍ය නියාමනය කර හැසිරවිය යුතුයි. උසස් මාධ්‍යයක් ඇති කිරීම පිණිස, යම් නියාමනයක් ඇති කිරීම පිණිස, ඔවුන්ගේ (මාධ්‍යවේදීන්ගේ) වෘත්තීමය උසස් තත්වයක් ඇති කිරීමයි මෙහි අරමුණයි.**"

බන්දුල ගුණවර්ධන ඇමතිවරයාගේ මේ කතාව තුළ මාධ්‍යයේ උසස් තත්වයක් ඇති කිරීමට උසස් ප්‍රමිතියකින් තොර පාර්ලිමේන්තු ඇමතිවරු මන්ත්‍රීවරු මැදිහත්ව මාධ්‍ය නියාමන පනතක් හැදීමේ කතාව හිනා උපදවන විහිළු සහගත ප්‍රකාශයකි. කිසිදු උසස් හැසිරීමක්, විනයක්, සදාචාරයක්, හික්මීමක් නැති, රටේ පොදු නීතියට ගරු නොකරණ, පාර්ලිමේන්තුව තුළ වැදගත් ලෙස වචන හැසිරවීමට හා සාමකාමීව ප්‍රශ්නයක් විසඳා ගැනීමට නොදන්නා, මහජනතාව ගැන කිසිදු වගේ වගක් නැතිව මහජන මුදලින් කකා බිබී සුව පහසු ජීවිතයක් ගෙවමින් අල්ලස්, කප්පම්, කොමිස් ගනිමින්, රාජ්‍ය දේපළ අවභාවිතා කරමින්, ව්‍යවස්ථාව අමු අමුවේ කඩමින්, රටේ නීතියට කොකා පෙන්වමින් සිටින මැති ඇමතිවරු පිරිසක් විසින් මාධ්‍ය සම්බන්ධ හැදෑරීමකින්, අධ්‍යාපනයකින් හා ආචාර ධර්ම පිළිපදිමින් වෘත්තිමය ලෙස කටයුතු කරන පිරිසක්ව කිසිදු වෘත්තීය බවින් තොර පාර්ලිමේන්තු මැති ඇමතිවරු උසස් තත්වයකට පත් කිරීමට පනත් සැකසීම අදෝමුඛයෙන් හිනා යන විහිළුය.

## පාර්ලිමේන්තු නියාමන පනතක් හරහා මැති ඇමතිවරුන්ගේ ප්‍රමිතිය සෑදීම

මුලින්ම කළ යුත්තේ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් වෙනුවෙන් ''**පාර්ලිමේන්තු ආචාරධර්ම පද්ධතියක්**'' හා ''**පාර්ලිමේන්තු නියාමන පනතක්**'' සකස් කර තමුන් මුලින් වැදගත් උසස් වෘත්තියක් බවට පත්වීමය.

එසේම බන්දුල ගුණවර්ධන ඇමතිවරයා ප්‍රකාශ කර සිටින්නේ රට තුළ ඇතිවෙන සියලු ඇත්ත ලෝකයට සඟවා අපි කිසිම ප්‍රශ්නයක් නැතිව හොඳින්, සතුටින් සිටින බවට මවා පෙන්වීමටය. පවතින ආර්ථික අර්බුදයන්, මහජන ගැටලු, විරෝධතා, රට තුළ ඇති භාණ්ඩ හා සේවා හිඟයන් යන මේ සියල්ල නැති බව පෙන්වා, ඇත්ත වසන් කර බොරුව පෙන්වීමටය. එනම් මාධ්‍යවේදීන් ලෙස අප පිළිපදින ප්‍රවෘත්ති මූලධර්ම කඩ කරන්නටය, මාධ්‍ය ආචාරධර්ම කඩ කරන්නටය. අපේ වෘත්තීමයභාවය කෙලෙසා ගන්නටය. පුවතක් පුවතක් ලෙස වාර්තා නොකර එය වෙනස්කර විකෘති කර, ව්‍යාජ කර, එහි ඇති සත්‍යය වෙනුවට අසත්‍යයක් ලෝකයට ගෙන යන්නටය. සත්‍ය, නිවැරදි මධ්‍යස්ත පුවත් වාර්තාකරණයෙන් තොර වෙන්නටය. එසේම රට තුළ ඇති ඇත්ත තත්ත්වය නොපෙන්වා බොරු කියමින් විදෙස් සංචාරකයින්ව මෙරටට ගෙන්වා ඔවුන්වද කබලෙන් ලිපට ඇද දැමීමටය.




**පොදු ජනතාවට සිය අදහස්, යෝජනා විවේචන හා හැඟීම් ප්‍රකාශ කිරීමට ප්‍රතිචාරය දැක්වීමට ඇති මෙවලම සමාජ මාධ්‍යයන්ය. ජනතාව විසින් තම ජනතා පරමාධිපත්‍යය භාවිතා කර ඡන්දයෙන් පාර්ලිමේන්තු නියෝජිතයින් පත් කරනවා මෙන්ම සමාජ මාධ්‍ය හරහා එම ජනතා නියෝජිතයින්ගේ ජනතා විරෝධී ක්‍රියා විවේචනය කිරීමටද ජනතාවට පරම අයිතියක් ඇත. එසේම මාධ්‍ය මර්ධනය සඳහා ව්‍යාවස්ථාවෙන් කිසිදු වගන්තියක් හරහා අවස්ථාව ලබා දී නැත. නමුත් තොරතුරු දැන ගැනීමට හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ව්‍යවස්ථාවෙන්ම ජනතාවට හා ජනමාධ්‍යවේදීන්ට ලබා දී තිබේ.**

මේ බලකරන්නේ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් මෙන් කිසිදු චාරයක්, වග වීමක්, හෘදසාක්ෂියක් නැතිව මාධ්‍යවේදීන් වන අපටද අපගේ වෘත්තිය කරන්නටය. මෙම අදහස් දැක්වීම බන්ධුල ගුණවර්ධන ඇමතිවරයාගේ තනි අදහසක් පමණක් නොව ඇතැම් විට සමස්ත කැබිනට් මණ්ඩලයේම පොදු මතයද විය හැකිය.

## අපි මොන හොරකම කෙරුවත් මාධ්‍යයේ පළ නොකර හිටපිය !

රජය මේ විකාශන නියාමන පනත හා සමාජ මාධ්‍ය නියාමන පනතත්, ප්‍රතිත්‍රස්ත පනතත්, දූෂණ විරෝධී පනතත් හරහා අපට අනතුරු අගවන්නේ කුමක්ද?

පාර්ලිමේන්තුව හා රජයේ සියල්ලන් මොන මගුලක් කළද උඹලා මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන ලෙස කට වහගෙන අපි කියන විදිහට හිටපල්ලා නැත්තම් ලයිෂන් කැන්සල් කරනවා. නැත්තම් තොපිව අත් අඩංගුවට ගෙන හිරේ දානවා කියා නොවේද? ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගේ දූෂණ හමුවේ කතා කරන්නට බැරිය. ජනතාවගේ දුක පිඩාව හමුවේ කතා කරන්නට බැරිය. රජයේ වැරදි තීන්දු තීරණ විවේචනය කරන්නට බැරිය. රජයේ වැරදි ආර්ථක ප්‍රතිපත්ති විවේචනය කරන්නට බැරිය. රට තුළ ජනතාවට ප්‍රඥාව දෙන කිසිවෙකුගේ අදහස් විකාශනය කරන්නට හැකියාවක් නැතිය. විශේෂයෙන් නිශ්චිත අර්ථ දැක්වීමක් නැති **"ජාතික ආරක්ෂාවට තර්ජනය වීම"** (ජාතික ආරක්ෂාවට තර්ජනයක් වී ඇත්තේ ආරක්ෂක අංශ දේශපාලනීකරණය කර නීතියේ ආධිපත්‍යය බිඳ දමා ඇති වත්මන් රජයයි) **''ජාතික ආර්ථකයට තර්ජනයක් වීම''** (ජාතික ආර්ථකයට තර්ජනයක් වී ඇත්තේ වැරදි ආර්ථක ප්‍රතිපත්ති, තීන්දු, තීරණ, නාස්තිකාර වියදම්, අල්ලස්, කොමිස්, කප්පම් ගනිමින් ජනතාවගේ බදු මුදල් අවභාවිතා කරමින්, රාජ්‍ය දේපොල විකුණමින්, තැරැව්කාරකම් කරන වත්මන් රජයයි) වැනි වචන එපිට මෙපිට පෙරලා තමන්ට වාසි ලෙස අර්ථ දක්වා ජනමාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන් මර්ධනය කිරීමට මෙම පනත් මගින් රජයට හැකියාව ලැබේ.

මේ කිසිදු පනතක් ජනතා සුබ සිද්ධිය පිණිස හෝ රටේ සුබ සිද්ධිය වෙනුවෙන් සකස් කළ පනත් නොවේ. මේ සියල්ල පාර්ලිමේන්තුවේ ජනතා විරෝධී හොරු මංකොල්ලකාර දූෂිත මැති ඇමතිවරු, අසාර්ථක පාලකයින්, ඔවුන්ට කත් අදින දූෂිත නිලධාරීන් හා රජය රැකීම සඳහා ආරක්ෂාවට තැනූ "සුරයක්" මිස ජනතාවව රක්ෂා කරන ''පලිහක්'' නොවේ.

## මාධ්‍ය වෘත්තිකයින්ට නීති හැදිය යුත්තේ මාධ්‍ය වෘත්තිකයින්ගේ මැදිහත් වීමෙනි !

රටේ අධිකරණයට අවැඩක් වුවද, අධිකරණයේ කිසිවෙකුගේ අතින් වෙනකෙකුට අවැඩක් වුවද, පොලීසියෙන් හමුදාවෙන් ආරක්ෂක අංශයෙන් කාට හෝ අවැඩක් වුවද කාගෙන් හෝ පොලීසියට හමුදාවට ඇතුළු ආරක්ෂක අංශවලට අවැඩක් වුවද, ගුරුවරු, දොස්තරවරු, නීතිඥයින්, කම්කරුවන් ඇතුලු ඕනෑම අයෙකුට අවැඩක් සිදුවීම හෝ ඔවුන්ගෙන් වෙන කාට හෝ අවැඩක් සිදුවන විට ඒ වෙනුවෙන් පෙනී සිට රට මේ තත්වයෙන් හෝ නිවැරදි දිශාවට ගෙන යන්නේ ජනමාධ්‍ය විසිනි.

එක් එක් කර්තෘ මූලික පෞද්ගලික මාධ්‍ය ආයතන විවිධ දේශපාලන හෝ පුද්ගලික න්‍යායපත්‍ර මත කටයුතු කළද, සමහර අවස්ථාවල මාධ්‍ය ආචාරධර්ම කඩා දැමූවද සමස්ථයක් ලෙස මාධ්‍ය මේ රටේ ගැටලුවලදී සාධනීය ලෙස කටයුතු කරනු දක්නට ලැබේ. එසේම පොදු ජනතාවට සිය අදහස්, යෝජනා විවේචන හා හැඟීම් ප්‍රකාශ කිරීමට ප්‍රතිචාරය දැක්වීමට ඇති මෙවලම සමාජ මාධ්‍යයන්ය. ජනතාව විසින් තම ජනතා පරමාධිපත්‍යය භාවිතා කර ඡන්දයෙන් පාර්ලිමේන්තු නියෝජිතයින් පත් කරනවා මෙන්ම සමාජ මාධ්‍ය හරහා එම ජනතා නියෝජිතයින්ගේ ජනතා විරෝධී ක්‍රියා විවේචනය කිරීමටද ජනතාවට පරම අයිතියක් ඇත. නමුත් අද වන විට නොනිල ලෙස රටේ සමාජ මාධ්‍ය පවා පාලනය කරනු ලබන්නේ ඇමරිකාව හා ඉන්දීය 'රෝ' ඔත්තු සේවයට අවශ්‍ය පරිදිය.

එසේම මාධ්‍ය මර්ධනය සඳහා ව්‍යාවස්ථාවෙන් කිසිදු වගන්තියක් හරහා අවස්ථාව ලබා දී නැත. නමුත් තොරතුරු දැන ගැනීමට හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ව්‍යවස්ථාවෙන්ම ජනතාවට හා ජනමාධ්‍යවේදීන්ට ලබා දී තිබේ.

එසේ නම් මාධ්‍ය වෘත්තිකයින් වන අප වෙනුවෙන් රජය නියාමන පනත් සැකසීම හෝ මාධ්‍ය ආචාර ධර්ම සැකසීම අප කිසිසේත් පිළි ගන්නා කරුණක් නොවේ. එය කළ යුත්තේ මාධ්‍ය ආයතන, මාධ්‍ය සංවිධාන, මාධ්‍ය සම්බන්ධව සිටින විද්වතුන් හා මාධ්‍ය සමාජය එක්ව සංවාද විසංවාදයෙනි. රජය මෙවැනි පනත් මගින් කරන්නේ තමන්ට වාසි ලෙස පොදු සමාජයට තොරතුරු ගලා යෑම සීමා කර බාධක යෙදීම බව අප සැම දන්නා කරුණකි. බදු ගෙවන ජනතාවට රටේ සිදුවන සියල්ල දැන ගැනීමට පරම අයිතියක් ඇත. රජයට එය වැලැක්වීමට හැකියාවක් නැත මාධ්‍යවේදීන්, මාධ්‍ය ක්‍රියාකාරීන්, මාධ්‍ය සංවිධාන හා මාධ්‍ය ආයතන ලෙස අප සියල්ලන්ම "මාධ්‍ය මර්ධනයට" එරෙහිව එක පෙළට සිට ගන්නෙමු. එසේම ඊනියා මාධ්‍ය මර්ධන පනත් අකුලා ගන්නා ලෙස දැඩිව බල කරමු.

එසේම ප්‍රධාන ධාරාවේ විද්යුත් නාලිකාවලින් සැදි විද්‍යුත් විකාශකයින්ගේ සංගමයද, මාධ්‍ය සංගම්ද, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ද මෙම වෙනත් සංවිධාන හා පොදු මාධ්‍ය සමාජයද මෙයට එරෙහිව ප්‍රබල ලෙස විරෝධය පාමින් සිටී.

සත්‍යය මර්ධනයෙන් යටපත් කළ නොහැක !



**මාධ්‍යවේදී**
**තිළිණ අලහකෝන්**
**මාධ්‍ය සංවිධාන ක්‍රියාධර**

**විශේෂ ස්තුතිය - ඉන්ටර්නිවුස් (InterNews) ආයතනයට**

# වනසන වන සත්තු



ඌ කොකෙක් සිල් ගන්නවා
කිරිම පාටට ඉන්නවා
ඒත් වක්කඩ අයිනේ ඉදගෙන
දන්ඩින්ගෙ බදු ගිලිනවා

ඌ කොහෙක් කෑ ගහනවා
පුල්ලි අස්සෙන් පේනවා
අපේ කූඩුවෙ බිජු දදා ඌ
අපේ කෑමත් ගිලිනවා

උගේ කන් දික් කරනවා
හාවා වාගේ දුවනවා
කැරට් අල මේ අපට විසිකර
අපිව හාවා කරනවා

කදයි බඩ දෙක තියෙනවා
කිඹුලා වාගේ ඉන්නවා
කිඹුලා ගොඳුරක් ගිලිනවා මෙන්
කොමිස් කප්පම් ගිලිනවා

බල්ලා වාගේ බුරනවා
ආයෙ පැන පැන හපනවා
සල්ලිකාරයෝ වීසිකරනා
මස් කට්ට නම් ලොවිනවා

නරියා වාගේ සිතනවා
අපිව රවටා දමනවා
ඕන ගොදුරක් ඌට කම් නෑ
අනුන් දුන්නොත් බුදිනවා

කටුස්සා මෙන් බලනවා
රණින් මාලය බඳිනවා
පාට එක එක මාරු කරමින්
වාසි අත්තට පනිනවා

ගෙම්බා වාගේ හඬනවා
පිම්බිලා හැඩ බලනවා
එහෙට පැන්නත් මෙහෙට පැන්නත්
ලිදේ පතුලෙම සිටිනවා

සිංහයා යැයි සිතනවා
නමට සිංහ ත් තියෙනවා
මෙලෝ මගුලක් සමත් වෙන්නැති
රජෙක් අපිටත් ඉන්නවා

තිළිණ අලහකෝන්
thilinafilms@gmail.com